# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
# சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகார சபை
# Tea Small Holdings Development Authority

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT
# *2017*

නො 70,පාර්ලිමේන්තු පාර,පැලවත්ත,බත්තරමුල්ල
இலக்கம் 70, பாராளுமன்ற வீதி, பலவத்த, பத்தரமுல்ல
**No: 70, Parliament Road, Pelawatte, Battaramulla**
දුරකථන අංක தொலைபேசி இலTele : 7909021/22
ෆැක්ස් பெக்ஸ் : 2784925/28
ඊ මේල් ஈ-மெயில Email : **gmtshda@gmail.com /aetshda1@gmail.com**

# දැක්ම

## ආර්ථික හා සමාජීය වශයෙන් තිරසාර කුඩා තේ වතු ප්‍රජාවක් බිහිවීම



# මෙහෙවර

## විශිෂ්ඨතම උපකාරක සේවා සැපයීම තුලින් කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාව සහ ගුණාත්මය වර්ධනය කිරීම

# සභාපතිතුමාගේ පණිවිඩය



වැවිලි භෝග අතුරින් ප්‍රධාන අපනයන භෝගය වන්නේ තේ භෝගයයි. 1991 වසරේ 50.3% කින් ජාතික නිෂ්පාදනයට දායකත්වය ලබාදෙමින් ක්‍රමයෙන් වර්ධනය වූ කුඩා තේ වතු නිෂ්පාදන දායකත්වය 2017 වසරේදී 75.5% ක් දක්වා වර්ධනය වී තිබුණි. ගතවූ දශකයක කාලය තුල අඩුම ජාතික නිෂ්පාදනය වාර්තා වූ 2009 වසරේ ජාතික නිෂ්පාදනය කිලෝ මිලියන 291 ක් වී තිබුණි. එම වසරේ කුඩා තේ වතු අංශයේ නිෂ්පාදන ප්‍රමාණය කිලෝ මිලියන 201.9 ක් විය. එසේම 2016 වසරේ ජාතික නිෂ්පාදනය සැලකිය යුතු පසුබෑමකට ලක්වුව ද 2017 වසරේ ජාතික තේ නිෂ්පාදනය කිලෝ මිලියන 307.72 ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකි විය. ඊට සමගාමීව කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය ද 2009 වසරට සාපේක්ෂව කිලෝ මිලියන 30.52 කින් 2017 වසරේ වැඩිවී තිබුණි.

කුඩා තේ වතු අංශය 2017 වසරේද මුල්‍ය සහනාධාර මඟින් රාජ්‍ය අනුග්‍රහය ලැබූ වසරකි. හෙක්ටයාරයකට රු.15000 බැගින් හෙක්ටයාරයකට අඩු භූමි ප්‍රමාණයකට හිමිකම් ලැබූ කුඩා තේ වතු හිමියන් 139713 දෙනෙකු සඳහා රුපියල් මිලියන 903.894 ක් තේ පොහොර මූල්‍ය සහනාධාරය ලෙස කුඩා තේ වතු හිමියන් සඳහා 2017 වසරේ ලබාදීමට හැකිවිය. ඒ සඳහා අයත් වූ භූමි ප්‍රමාණය හෙක්ටයාර 60259.6 කි. එසේම 2017 වසරේ මැයි මස දී බලපෑ අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් රත්නපුර, ගාල්ල, මාතර හා කළුතර දිස්ත්‍රික්ක වල ඇති වූ ගංවතුර හා නාය යෑම් වලින් හානියට පත් කුඩා තේ වගාවන් වෙනුවෙන් රජය විසින් රු. මිලියන 225.6 ක මුදලක් කුඩා තේ ගොවීන් 12716 කට වන්දි වශයෙන් ලබා දෙන ලදී. මෙම කාර්යයන්හි දී කුඩා තේ වතු සංවර්ධන සමිති කේන්ද්‍රීය කරගනිමින් රාජ්‍ය මූල්‍ය තේ පොහොර සහනාධාරය හා ගංවතුර හා නායයෑම් සඳහා වන්දි මුදල් කුඩා තේ වතු හිමියන් සඳහා ලබාදීමට කටයුතු කර තිබුණි. 2017 වසර අවසානය වන විට කුඩා තේ වතු අංශයේ ලියාපදිංචි කුඩා තේ වතු සංවර්ධන සමිති සංඛ්‍යාව 1435 ක් දක්වා වැඩි විය.

කෙසේ වුවද , පෙර වර්ෂයට (2016) සාපේක්ෂව ජාතික තේ නිෂ්පාදනය 5.2% කින් වැඩි වුවා සේම , කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනයද 6.6% කින් වැඩි වී තිබුණි. තේ නැවත වගාව කල භූමි ප්‍රමාණයද හෙක්ටයාර 748 ක් විය. එසේම පෙර වර්ෂයට සාපේක්ෂව කුඩා තේ වතු හිමියන් සඳහා අමු දළු කිලෝවකට ගෙවනු ලැබූ මිලේ වාර්ෂික සාමාන්‍ය රු. 90.69 දක්වා එනම් රුපියල් 22.16 කින් වර්ධනය වී තිබුණි. ශ්‍රමික පිරිවැය හා තේ පොහොර වැනි යෙදවුම් පිරිවැය ඉහලයාම මත 2017 වසරේ තේ නැවත වගාවේ පිරිවැය නැවත වතාවක් වර්ධනය වීම කුඩා තේ වතු අංශයට මුහුණ පෑමට සිදුවූ විශේෂිත ගැටලුව විය.



**දේශබන්දු විජේරත්න දෙවගෙදර**
**සභාපති**

# 2017 වසරේ ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු අංශය........



පැතිරීම - දිස්ත්‍රික්ක 14 ක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 123 ක් පුරා පැතිරුණු ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 10% ජන අනුපාතයක් නියෝජනය කරයි.

දායකත්වය - වාර්ෂික මුළු තේ නිෂ්පාදනයෙන් 75.5% ක් වූ අපගේ දායකත්වය රුපියල් බිලියන 1438 ක ප්‍රමාණයක් විදේශ විනිමය වශයෙන් වර්ධනය වී ඇත.

ආයෝජනය - i හෙක්ටයාර 2256 ක් වූ බිම් ප්‍රමාණයක රුපියල් මිලියන 7219 ක ආයෝජනයක් තේ වගාව නැවත ස්ථාපනය කිරීම සඳහා යෙදවීම.

ii රුපියල් මිලියන 13200 ශ්‍රමික ආයෝජනයක් වගාව පවත්වා ගැනීම සඳහා යෙදවීම.

ඒ අනුව රුපියල් මිලියන 20000 කට ආසන්න වාර්ෂික මූල්‍යමය ආයෝජනයක් කෙරෙන්නා වූ කුඩා තේ වතු අංශය වෙනුවෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සේවා සැපයීම සිදු කරමින් සිටි.

# කුඩා තේ ඉඩම් අංශයේ කාර්යඵල දර්ශකය-2017

| | 2015 | 2016 | 2017 |
|---|---|---|---|
| 1. කුඩා තේ වතු බිම් ප්‍රමාණය (හෙක්ටයාර) | 121,740 | 121,967 | 122,169 |
| 2. කුඩා තේ වතු ඉඩම් හිමියන් සංඛ්‍යාව | 392,979 | 393,420 | 395,414 |
| 3. කුඩා තේ වතු අංශයේ නිමි තේ නිෂ්පාදනය (කිලෝ මිලියන) | 239.86 | 218.068 | 232,417 |
| 4. ජාතික නිෂ්පාදනයට කුඩා තේ වතු දක්වන දායකත්ව ප්‍රතිශතය | 73.0 | 74.5 | 75.5 |
| 5. සාමාන්‍ය ඵලදායිතාවය (නිමි තේ/කි.ග්‍රෑම්/හෙක්.) | 2059 | 1872 | 1995 |
| 6. තේ නැවත වගා බිම් ප්‍රමාණය /හෙක්ටයාර් (දිරිදීමනා යටතේ) | 806 | 733 | 748 |
| 7. තේ අළුත් වගා බිම් ප්‍රමාණය /හෙක්ටයාර් (දිරිදීමනා යටතේ) | 479 | 109 | 202 |
| 8. තේ නැවත වගා ප්‍රතිශතය (%) | 0.80 | 0.73 | 0.75 |
| 9. භෝග පුනරුත්ථාපනය-පැල සංඛ්‍යාව (මිලියන) | 0.309 | 0.369 | 0.564 |
| 10. කුඩා තේ වතු සංවර්ධන සමිති | | | |
| සමිති සංඛ්‍යාව | 1394 | 1403 | 1435 |
| සාමාජික සංඛ්‍යාව | 271,272 | 340,006 | 329,778 |
| 11. ව්‍යාප්ති සහ උපදෙස් සේවා | | | |
| ඒකපුද්ගල ව්‍යාප්තිසේවා සංඛ්‍යාව | 31,331 | 33,385 | 33,373 |
| කණ්ඩායම් වැඩසටහන් සංඛ්‍යාව | 6,544 | 7,082 | 6680 |
| සහභාගිත්ව ගොවි සංඛ්‍යාව | 188,118 | 237,333 | 188,085 |
| 12. ආයතනයේ මෙහෙයුම් පිරිවැය (සංවර්ධන රුපියලක් සඳහා) | 0.54 | 0.56 | 0.52 |
| 13. තේ පරීක්ෂක ව්‍යාප්ති නිළධාරී : තේ ගොවි අනුපාතිකය | 1:2748 | 1:2751 | 1:2751 |
| 14. අමු දළු කිලෝවක සාමාන්‍ය දළ මිල රුපියල් | 58.80 | 68.53 | 90.69 |

# පටුන


- 2017 වසරේ ශ්‍රී ලංකාවේ කුඩා තේ වතු අංශය iv
- කුඩා තේ ඉඩම් අංශයේ කාර්යඵල දර්ශක-2017 v
- පටුන vi
- උපලේඛන vii
- රූප සටහන් viii
- සංවිධාන ව්‍යුහය
  ප්‍රධාන කාර්යාලය සහ හන්තාන පුහුණු මධ්‍යස්ථානය ix
  ප්‍රාදේශීය කාර්යාල x
- අධ්‍යක්ෂ මණ්ඩලය xi
- විගණන හා කළමණාකරන කමිටුව xii
- විධායක කාර්යමණ්ඩලය සහ පරිපාලන දිස්ත්‍රික්ක කාර්යාලයන් xiii

**ප්‍රධාන සාරාංශය** **1**

1. **වන පරිච්ඡේදය : හැඳින්වීම** **3**

1.1. ආයතනය හා කාර්යභාරය 4
1.2. විගණන හා කළමණාකරන කමිටු කටයුතු 5
1.3. පරිපාලනමය කටයුතු 5

2. **වන පරිච්ඡේදය : ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය** 8

2.1. කුඩා තේ ඉඩම් 9
2.2. කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය 9
2.3. කුඩා තේ ඉඩම් හිමියෝ 9
2.4. කුඩා තේ ඉඩම් සංඛ්‍යාව 9
2.5 භූමි වර්ගීකරණය 10
2.6 කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය 11
2.7 කුඩා තේ ඉඩම් නිෂ්පාදන සංයුතිය 14
2.8. කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය 15
2.9. ආයෝජනයන් හා මෙහෙයුම් සමාලෝචනය 16

3. **වන පරිච්ඡේදය : ව්‍යවස්ථාපිත අරමුණු හා සංවර්ධන කාර්යයන්** **18**

3.1. මධ්‍යකාලීන ප්‍රතිඵල පාදක ඉලක්ක හා කාර්යඵලය 20
3.2. කුඩා තේ ඉඩම්වල ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති කටයුතු 37
3.3. ප්‍රධාන කාර්යපාදක දර්ශක 40

4. **වන පරිච්ඡේදය : කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිල** **41**

4.1. ශ්‍රම පිරිවැය 42
4.2. අමු තේ දළු කිලෝවක නිෂ්පාදන පිරිවැය 42
4.3. නිෂ්පාදන ආන්තිකය හා මිල 43
4.4. තේ නැවත වගා කිරීමේ පිරිවැය 43
4.5. දිරිදීමනා අනුපාතිකය හා වගා පිරිවැය (හෙක්ටයාරයකට) 44
වාර්ෂික ගිණුම් ප්‍රකාශ හා ශේෂ පත්‍රය
විගණකාධිපතිගේ වාර්තාව

# උපලේඛන

අංක


1 ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 45

2 ආයතනයේ සේවක සංඛ්‍යා තොරතුරු- 2017 47

3 විධායක නිලධාරී ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් අනුව කාණ්ඩගත කිරීම 49

4 කුඩා තේ වතු අංශයේ තේ නිෂ්පාදනය 50

5 තේ නැවත වගා ආධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරිත්වය 51

6 භෝග පුනරුත්ථාපනය (පාළු සැපයීමේ) ආධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරිත්වය 52

7 තේ අලුත් වගා ආධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරිත්වය 53

8 8-A මව් වගා මගින් නව ප්‍රභේද රිකිලි හා අතු නිකුත් කිරීම 54
8-B ආයතනික තේ තවාන් ක්‍රියාකාරිත්වය 55
8-$C_1$ වාණිජ තවාන් ක්‍රියාකාරීත්වය - 2016/2017 56
8-$C_2$ වාණිජ තවාන් ක්‍රියාකාරීත්වය - 2017/2018 57

9 9-A පිහිටීම මත කොළඹ තේ වෙන්දේසියේ තේ සඳහා මිල 58
9-B අමු දළු කිලෝවක නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව 59

10 10-A වගා පිරිවැය ඇස්තමේන්තුව - උස් / මැදි බිම් තේ නැවත වගා හෙක්ටයාරයකට 60
10-B වගා පිරිවැය ඇස්තමේන්තුව - පහත් බිම් තේ නැවත වගා හෙක්ටයාරයකට 61

11 තේ අපනයනය හා විදේශ විනිමය ඉපයීම් 62

12 STaRR ව්‍යාපෘතියේ ප්‍රගතිය 63

# රූප සටහන්

**රූප සටහන් අංකය**


| | | |
|---|---|---|
| 1 | සාමාන්‍ය ඵලදායිතාවයේ වාර්ෂික ප්‍රවනතාවය | 7 |
| 2 | මුලු තේ ඉඩම් ප්‍රමාණයට කුඩා තේ ඉඩම්හි දායකත්වය | 9 |
| 3 | භූමි ප්‍රමාණය මත කුඩා තේ ඉඩම් ව්‍යාප්තිය | 11 |
| 4 | කළමණාකරන ආයතන අනුව ජාතික තේ නිෂ්පාදන -2017 | 12 |
| 5 | කුඩා තේ වතු අංශයේ මාසික තේ නිෂ්පාදනය | 13 |
| 6 | කුඩා තේ වතු අංශයේ වාර්ෂික තේ නිෂ්පාදන ප්‍රවනතාවන් | 13 |
| 7 | 7-A තේ නැවත වගා සහනාධාර මුදල වැඩි කිරීම | 21 |
| | 7-B තේ නැවත වගා සහනාධාර මුදල වැඩිකිරීමට සමගාමීව උඳුරා දැමීම සහ තේ වගාවේ ප්‍රවනතාවය | 21 |
| 8 | නැවත වගා ආධාර සඳහා වාර්ෂිකව අයදුම් කිරීම | 22 |
| 9 | තේ නැවත වගා ආධාර ගෙවීම්හි වාර්ෂික ප්‍රගතිය | 24 |
| 10 | තේ අළුත් වගා සහනාධාර මුදල වැඩි කිරීම | 25 |
| 11 | තේ අළුත් වගා ආධාර ගෙවීම්හි වාර්ෂික ප්‍රගතිය | 27 |
| 12 | භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමයේ ගෙවීම්හි ප්‍රගතිය | 29 |
| 13 | ප්‍රාදේශීය වශයෙන් සමිති ව්‍යාප්තිය | 34 |
| 14 | නිෂ්පාදන ආන්තිකය | 42 |

# සංවිධාන ව්‍යුහය- ප්‍රධාන කාර්යාලය හා හන්තාන පුහුණු මධ්‍යස්ථානය




(1)ජ්‍යෙෂ්ඨ කළමනාකාර
HM 2-1

(2)ජ්‍යෙෂ්ඨ කළමනාකාර
HM 1-1

(12) මධ්‍යම කළමනාකාර
MM 1-1

(5) කණිෂ්ඨ කළමනාකාර
JM 1-1

(1) කළමනාකරණ සහකාර(තාක්ෂණික
(32) කළමනාකරණ
සහකාර(තාක්ෂණික
ප්‍රධාන කාර්යාලය-30 , හන්තාන -2

(9) ප්‍රාථමික මට්ටම රියදුරු
(2) ප්‍රාථමික මට්ටම
සුපවේදි/සහකාර
(15) ප්‍රාථමික මට්ටම කාර්යාල
සහායක/කම්කරු

79

සංවිධාන ව්‍යුහය
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ MSD/30 පරිදි

# සංවිධාන ව්‍යුහය - ප්‍රාදේශිය කාර්යාල



# අධ්‍යක්ෂ මණ්ඩලය

1. සභාපති - දේශබන්දු විජේරත්න දෙවගෙදර මහතා

**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්**

| නම | තනතුර | ආයතනය | දු.අංකය |
|---|---|---|---|
| 2. බී.එල්.ඒ.ජේ. ධර්මකීර්ති මහතා (2017-07-11 දක්වා) | අතිරේක ලේකම් (සංවර්ධන) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 011-2186160 |
| 3. එම්.ජේ.එස් රවිසිංහ මහතා (2017-07-11 සිට) | අධ්‍යක්ෂ (සංවර්ධන) | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 011-2186204 |
| 4. ඊ.ඒ.ජේ.කේ. එදිරිසිංහ මහතා | තේ කොමසාරිස් | ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 011-2580182 |
| 5. ටී.වී. වීරසේන මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 011-2484671 |
| 6. වෛද්‍ය එම්.එම්.ජේ.පී. ගවරම්මාන මහතා | සභාපති | තේ පර්යේෂණායතනය | 052-2258201 |
| 7. ආචාර්ය අයි.එස්.බී. අබේසිංහ මහතා | අධ්‍යක්ෂ | තේ පර්යේෂණායතනය | 052-2258201 |
| 8. කේ. එල්. ගුණරත්න මහතා | ගරු ලේකම් | සමස්ත ලංකා සමිති සංවිධානය | 077-7707623 |
| 9. නෙවිල් රත්නායක මහතා | ගරු සභාපති | සමස්ත ලංකා සමිති සංවිධානය | 011-7909020 |
| 10. රොෂාන් රාජදුරෙයි මහතා | කළමනාකරණ අධ්‍යක්ෂ | කැලණි වැලි ප්ලාන්ටේෂන්ස් සමාගම | 011-2627700 |
| 11. ඩබ්.ටී.කේ. සමරතුංග මහතා | වෘත්තීය සමිති නියෝජිත | - | 071-4634132 |
| 12. නුවන් විජේසිංහ මහතා | ගරු වැවිලි කර්මාන්ත අමාත්‍ය නියෝජිත | - | 077-7154816 |
| 13. කල්‍යාණි සතරසිංහ මහත්මිය | වෘත්තීය සමිති නියෝජිත | - | 071-2934559 |

| | | | |
|---|---|---|---|
| 14. අමර දිසානායක මහතා | පෞද්ගලික කම්හල් හිමියන්ගේ සංගමයේ නියෝජිත | - | 071-4175592 |
| 15. සි. අබේගුණවර්ධන මහතා | නිරීක්ෂක/සාමාජික | - | 077-8633802 |
| 16. ආර්.එස්. ජයරත්න මහතා | නිරීක්ෂක/සාමාජික | - | 071-9281182 |
| 17. රොහාන් පි. පෙතියාගොඩ මහතා | නිරීක්ෂක/සාමාජික | - | 011-2590968 |
| 18. ඒ.ඒ ධර්මබන්දු මහතා | නිරීක්ෂක/සාමාජික | - | 077-7274574 |

2017 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 13ක් පවත්වා ඇත.

## විගණන කමිටුව

| නම | තනතුර | ආයතනය | දු.අංකය |
|---|---|---|---|
| 1. සභාපති - ටී.වී. වීරසේන මහතා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | 011-2484671 |
| 2. සාමාජික -එම්.ජේ.එස් රවිසිංහ මහතා | අධ්‍යක්ෂ(සංවර්ධන) | වැවිලි කර්මාන්ත අමාත්‍යංශය | 011-2186204 |
| 3. සාමාජික -කේ.එල්. ගුණරත්න මහතා | ගරු ලේකම් | සමස්ත ලංකා සමිති සංවිධානය | 077-7707623 |
| 4. සාමාජික -කල්‍යාණි සතරසිංහ මහත්මිය | | වෘත්තිය සමිති නියෝජිත | 071-2934559 |
| 5. සාමාජික -එස්.ඩී. කටුවාවලගේ මහත්මිය | | විගණක අධිකාරී විගණකාධිපති දෙපාර්තමේන්තුව (ශ්‍රී ලංකා තේ මණ්ඩලය) | 011-2583687 |

2017 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04ක් පවත්වා ඇත.

# විධායක කාර්ය මණ්ඩලය සහ පරිපාලන දිස්ත්‍රික්ක කාර්යාල

**ප්‍රධාන කාර්යාලය**
**අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල**
**දුරකථන අංක:- 011-7909020/21**

**විධායක කාර්ය මණ්ඩලය -ප්‍රධාන කාර්යාලය**
සභාපති : දේශබන්දු විජේරත්න දෙවගෙදර මහතා
සාමාන්‍යාධිකාරී : සී.ජේ.අයි.ටී.ප්‍රනාන්දු මහතා (2016.06.02 සිට 2017.07.12 දක්වා)
ඩී.පී. මහිපාල මහතා (2017.07.13 සිට)
කළමනාකරණ උපදේශක (කොන්ත්‍රාත්) : ඒ.එන්.මඩවල මහතා
**ව්‍යාප්ති අංශය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති) : සී.ජේ.අයි.ටී.ප්‍රනාන්දු මහතා
**සංවර්ධන අංශය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(සංවර්ධන) }
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් } : ජේ.එම්.පී.ජයසිංහ මහතා
කළමනාකරු(සංවර්ධන)වැ.බ. : ආර්.ඒ. වෛද්‍යරත්න මහතා
සහකාර කළමනාකරු(සංවර්ධන) : ඒ.ඒ.ඩී.පී. අබේතිලක මහතා
සහකාර ප්‍රාදේශීය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන): ඊ.කේ.පී.ඒ. ප්‍රියදර්ශනී මහත්මිය
**සැලසුම් හා නියමුකරණ ඒකකය**
කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) : එම්.අයි.එම්.ජේ.සමරවික්‍රම මහත්මිය(2017.11.04 දක්වා)
සහකාර කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) : ආර්.ඒ. වෛද්‍යරත්න මහතා
**මුදල් අංශය**
කළමනාකරු (මුදල්) : ඩී.පී.පී.ජයන්ති මහත්මිය
සහකාර කළමනාකරු (මුදල්) } : පී.ආර්.ඉන්දික පෙරේරා මහතා
} : ආර්.ඒ.සී.ඩී.ඩී. ජයතුංග මිය
**මානව සම්පත් හා පාලන අංශය**
කළමනාකරු(මානව සම්පත් හා පාලන)වැ.බ. : හර්ෂාන් ද සිල්වා මහතා
සහකාර සාමාන්‍යාධිකාරී (සේවා) : අමිත පස්කුවල් මහතා
සහකාර කළමනාකරු(මානව සම්පත් හා පාලන) : හර්ෂාන් ද සිල්වා මහතා
සහකාර කළමනාකරු(මානව සම්පත් හා පාලන) : චතුර ප්‍රනාන්දු මහතා (2017.10.25 දක්වා)
පරිපාලන නිලධාරී : සරත්චන්ද්‍ර මුරමුදලිගේ මහතා
**අභ්‍යන්තර විගණන අංශය**
අභ්‍යන්තර විගණක : කේ.පී.නාරද මහතා
අභ්‍යන්තර විගණක(රා. ඉ. කිරීම) : පී.ජී.අයි. සුරංගිකා මෙනවිය

**ගාල්ල ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්කය : ගාල්ල**
**අංක 81, ප්‍රදීපාගාර වීදිය,කොටුව, ගාල්ල**
**දුරකථන අංක:- 091-7201126/28**
**ෆැක්ස් :- 091- 2244382 / ඊ මේල් - tshdaga@gmail.com**

ප්‍රාදේශීය කළමනාකරු(වැ.බ.) : ඊ.ආර්.එස්. ගුණවර්ධන මහතා
සහකාර ප්‍රාදේශීය කළමනාකරු(ව්‍යාප්ති) : අයි.යූ.එච්. මොහොට්ටි මහතා
සහකාර ප්‍රාදේශීය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන) : ඩී.එල්.සී. සූරියආරච්චි මහතා
(රාජකාරි ඉටු කිරීම)
කාර්යභාර නිලධාරී : ඩී.එල්.සී. සූරියආරච්චි මහතා
: ටී.එම්.එස්.එල්.ප්‍රියදර්ශක මහතා
: එම්.ටී. අමරරුවන් මහතා
කාර්යභාර නිලධාරී(වැ.බ.) : එච්.එම්.කේ.පී.බී. හේරත් මහතා
කාර්යභාර නිලධාරී(වැ.බ.) : කේ.එස්.එස්. දහනායක මහතා
පරිපාලන නිලධාරී : එච්.එම්.ආර්.බී.ජේ.හේරත් මහතා
ගිණුම් නිලධාරී : යූ.එල්.එම්.පෙරේරා මිය

**මාතර ප්‍රාදේශිය කාර්යාලය -පරිපාලන දිස්ත්‍රික්ක : මාතර ,හම්බන්තොට**
**අංක 31, කාලිදාස පාර ,මාතර**
**දුරකථන අංක:- 041-7200799 - 041-7200394/96**
**ෆැක්ස් :- 041- 2226487 / ඊ මේල් - tshdamt@gmail.com**

| | |
|---|---|
| ප්‍රාදේශිය කළමණාකරු | : ජී.ජී.බන්දුල මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන) | : සාලිය නාරංගස්පිටිය මහතා |
| කාර්යභාර නිලධාරී | : ඊ.ජී.ඩී. ශාන්තසිරි මහතා |
| | : ජේ.එල්. එදිරිසූරිය මහතා |
| කාර්යභාර නිලධාරී(වැ.බ.) | : සුනිල් සරත් දේශප්‍රිය මහතා |
| කාර්යභාර නිලධාරී(වැ.බ.) | : මහින්ද බටගොඩ මහතා |
| පරිපාලන නිලධාරි | : එන්.වී.පී. පුෂ්පකුමාරි මහත්මිය |
| ගිණුම් නිලධාරී | : එච්.එම්.එල්. පුෂ්පකුමාරි මිය |

**රත්නපුර ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්කය : රත්නපුර**
**අංක 1/28, නව නගරය, රත්නපුර**
**දුරකථන අංක:- 045-7201243 - 045-7201904**
**ෆැක්ස් :- 045- 2228647 / ඊ මේල් - tshdarat@gmail.com**

| | |
|---|---|
| ප්‍රාදේශිය කළමණාකරු | : කේ.ඒ.බී. පත්මරාජා මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන ) | : එච්.කේ. ලලිත් කුමාර මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති)(වැ.බ.) | : ඩී.එම්.පී.එස්. ඒකනායක මහතා |
| කාර්යභාර නිලධාරී | : පී.ඩී.කේ. බාලචන්ද්‍ර මහතා |
| කාර්යභාර නිලධාරී(වැ.බ.) | : ඒ.කේ.විජේසේකර මහතා |
| කාර්යභාර නිලධාරී(වැ.බ.) | : පී.එස්.කේ. පෙරේරා මහතා |
| පරිපාලන නිලධාරි | : එම්.ඩී.ඒ. පුෂ්පකුමාරි මහත්මිය |
| ගිණුම් නිලධාරී | : එම්.ඒ. පියසිලි මිය |

**මහනුවර ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක : මහනුවර, මාතලේ, කුරුණෑගල**
**අංක 2/7/1, ගන්නොරුව පාර,පේරාදෙණිය, මහනුවර**
**දුරකථන අංක:- 081-7200827 - 081-7200821**
**ෆැක්ස් :- 081- 2389011 / ඊ මේල් - tshdakan@gmail.com**

| | |
|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු(වැ.බ.) | : ඩබ්.එච්.පී.එස්. විජේතුංග මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු(ව්‍යාප්ති) | : එම්.ආර්.එන්. ධම්මික මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන)(රා.ආ.) | : ඩී.එම්.ආර්.කේ.බී. දසනායක මහතා |
| කාර්යභාර නිලධාරී | : ඩී.එම්.ඩබ්. බණ්ඩා මහතා |
| | : ඩී.එම්.ආර්.කේ.බී. දසනායක මහතා |
| | : ඩබ්.ජේ.ඩබ්. අරම්බේපොල මහතා |
| | : ටී. අමරසේකර මහතා |
| | : කේ.එම්.ඩී.ඒ. කුරුප්පු මහතා |
| කාර්යභාර නිලධාරී(වැ.බ.) | : යූ.ජේ.බී. විජේතුංග මහතා |
| පරිපාලන නිලධාරි | : චමිල බණ්ඩාර දිද්දෙනිය මහතා |
| ගිණුම් නිලධාරී(රාජකාරි ඉටු කිරීම) | : දමින්ද ප්‍රියන්ජිත් මහතා |
| මහජන සම්බන්ධතා නිලධාරි | : අනුර දිසානායක මහතා |

**නුවරඑළිය ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්කය : නුවරඑළිය**
**නව නගරය , කොත්මලේ**
**දුරකථන අංක:-052-4930265/ 052-4930247**
**ෆැක්ස් :-052-2259060 / ඊ මේල් - tshdane@gmail.com**

| | |
|---|---|
| ප්‍රාදේශිය කළමනාකරු | : ඩබ්.ටී.ආර්.පී. විමලරත්න මහතා |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන) | : පී.ඒ.එන්. පුෂ්පකුමාර මහතා |

සහකාර ප්‍රාදේශීය කළමනාකරු(ව්‍යාප්ති) (රා.ඉ.කිරීම) : ඩී.වී.කේ. නන්දසිරි මහතා
කාර්යභාර නිලධාරී : ඒ.එම්.ඩී.එස්. රණවීර මහතා
කාර්යභාර නිලධාරී(වැ.බ.) : එම්.ඒ.අයි. අබේසේන මහතා
: ඒ.ටී.ඒ. ගුණවර්ධන මහතා
පරිපාලන නිලධාරී : එම්.යූ.එස්. වික්‍රමසිංහ මෙනවිය
ගිණුම් නිලධාරී : ශ්‍යාමලි ප්‍රේමසුන්දර මහත්මිය

**ඌව ප්‍රාදේශීය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක : බදුල්ල, මොණරාගල**
**නව බදුල්ල පාර, බණ්ඩාරවෙල**
**දුරකථන අංක:- 057-72000241/ 057-7200081**
**ෆැක්ස් :- 057- 2232237 / ඊ මේල් - uvatshda@gmail.com**

ප්‍රාදේශීය කළමනාකරු : එච්.ආර්. අරුණ ශාන්ත මහතා
සහකාර ප්‍රාදේශීය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන) : කේ.එම්.ආර්.එල්. බණ්ඩාර මහතා
සහකාර ප්‍රාදේශීය කළමනාකරු(ව්‍යාප්ති)(වැ.බ.) : එච්.එම්. ප්‍රේමකුමාර මහතා
කාර්යභාර නිලධාරී : එච්.එම්. ප්‍රේමකුමාර මහතා
: එම්.එම්. කුමාරසිංහ මහතා
: ආර්.එම්.ඒ.ඩී. රත්නායක මහතා
කාර්යභාර නිලධාරී(රා.ආ.) : කේ.එන්. කුමාරසිරි මහතා
පරිපාලන නිලධාරී(වැ.බ.) : ගුණසිරි අධිකාරි මහතා
ගිණුම් නිලධාරී : මධුසංඛා ලක්ෂානි නාවලගේ මහත්මිය

**කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක : කෑගල්ල, ගම්පහ**
**කෘෂිකර්ම ගොඩනැගිල්ල,කච්චේරිය පාර, කෑගල්ල**
**දුරකථන අංක:- 035- 7201254/ 035-7201243**
**ෆැක්ස් :- 035- 2230163 / ඊ මේල් - tshdake@gmail.com**

ප්‍රාදේශීය කළමනාකරු : ආර්.ඒ.පී.පී. රණසිංහ මහතා
සහකාර ප්‍රාදේශීය කළමනාකරු(ව්‍යාප්ති)(රා. ඉ. කිරීම): පී.එන්. යගමුනි මහතා
කාර්යභාර නිලධාරී : ආර්.එම්.පී.ආර්. බණ්ඩාර මහතා
කාර්යභාර නිලධාරී(වැ.බ.) : පී.පී.පී.සී. විජේසිංහ මහතා
පරිපාලන නිලධාරී : ඊ.එම්.ඩී. අමුණුගම මහත්මිය
ගිණුම් නිලධාරී : ආර්.ආර්.එම්.ජේ.බී. රත්නායක මහතා

**කළුතර ප්‍රාදේශීය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක - කළුතර, කොළඹ**
**දඹුගොඩයාවත්ත පාර, ඉද්දගොඩ,මතුගම**
**දුරකථන අංක:- 034- 7200183/ 034-7201630**
**ෆැක්ස් :- 034- 2249690 / ඊ මේල් -tshdakalu@gmail.com**
ප්‍රාදේශීය කළමනාකරු(වැ.බ.) : ඩී.එම්.ජේ. නාකන්දල මහතා
සහකාර ප්‍රාදේශීය කළමනාකරු(ව්‍යාප්ති) : ඩී.එම්.ජේ. නාකන්දල මහතා
සහකාර ප්‍රාදේශීය කළමනාකරු(ව්‍යාප්ති)(වැ.බ.) : එස්.සී. මුදන්නායක මහතා
කාර්යභාර නිලධාරී : ටී.එම්.එස්.එල්. ප්‍රියදර්ශක මහතා
කාර්යභාර නිලධාරී(වැ.බ.) : එච්.පී. පුෂ්පකුමාරි මහත්මිය
පරිපාලන නිලධාරී : එච්.පී.එල්.එස්. පුෂ්පකුමාර මහතා

**රත්නසිරි වික්‍රමනායක ජාතික පුහුණු මධ්‍යස්ථානය**
**5 කණුව, මැද කොටස, උඩවෙල, හන්තාන**
**දුරකථන අංක:-081-7201760/081-7201873**
**ෆැක්ස් :-081-3800679/ ඊ මේල් - tshdakalu@gmail.com**

කළමනාකරු(පුහුණු)(වැ.බ.) : ඩබ්.ටී.ආර්.පී. විමලරත්න මහතා
සහකාර කළමනාකරු(පුහුණු)(වැ.බ.) : අනුරුද්ධ බණ්ඩාර මහතා
පුහුණු කිරීමේ නිලධාරී(රා.ආ.) : චමිල බණ්ඩාර දිද්දෙනිය මහතා

## ප්‍රධාන සාරාංශය

### කුඩා තේ බිම් ප්‍රමාණය

2005 කුඩා තේ ඉඩම් සංගණනය පරිදි අත්හරින ලද තේ ඉඩම් නොමැතිව ඇස්තමේන්තුගත සමස්ත තේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 125019 කි. (අක්කර 50 උපරිම සීමාව පරිදි) 2012 වසර සිට පනතෙහි පවතින ප්‍රතිපාදන පරිදි සේවා සපයන ලදී. අක්කර 10 අඩු කුඩා තේ බිම් ප්‍රමාණයන් සඳහා පමණක් ඒවායේ සංවර්ධනයට සහ ඊට අදාල සහායක සේවා සැපයීම සිදු කෙරේ. 2005 වසරට පසු කුඩා තේ ඉඩම් සංගණනයන් නැවත සිදුවී නොමැත. 2016 වසර අවසානයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමග අධිකාරිය හා ඒකාබද්ධව ආරම්භ කරනු ලැබූ කුඩා තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන පරිදි කුඩා තේ ඉඩම් පිළිබඳ භෞතික තොරතුරු නැවත යාවත්කාලීන කරගැනීමට නියමිතව ඇත.

කුඩා තේ වතු අංශයට 2017 වසරේදී තේ ගොවීන් 1994 දෙනෙකු අලුතින් තේ වගාවට යොමු වී ඇති අතර, සහනාධාර රහිතව වර්ෂය තුල අලුතින් තේ වගාකර තිබූ භූමි ප්‍රමාණය හෙක්ටයාර 202 කි. මෙයින් වැඩිම බිම් ප්‍රමාණයක් එනම් හෙක්ටයාර 53.7 ක් හා ගොවීන් 363 දෙනෙකු කෑගල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී තිබුණි. 2017 වසර අවසානය වනවිට ඇස්තමේන්තුගත සමස්ත කුඩා තේ වතු භූමි ප්‍රමාණය හෙක්ටයාර 122169 කි.

### කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය සහ ජාතික නිෂ්පාදන දායකත්වය

2017 වර්ෂයේ ජාතික තේ නිෂ්පාදනය කිලෝ මිලියන 307.72 ක් වූ අතර කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය කිලෝ මිලියන 232.417 කි. එනම් සමස්ථ තේ නිෂ්පාදනයෙන් 75.5% ක් කුඩා තේ වතු අංශයෙන් නිපදවා තිබුණි. කුඩා තේ ඉඩම් අංශයෙන් මෙතෙක් වාර්තාවූ උපරිම නිෂ්පාදනය කිලෝ මිලියන 247.4 ක් 2014 වර්ෂයේදීද , ජාතික තේ නිෂ්පාදනයේ උපරිමය වූ කිලෝ මිලියන 340.22 ක් 2013 වර්ෂයේදීද වාර්තා වී තිබුණි. 2016 වර්ෂයට සාපේක්ෂව ජාතික තේ නිෂ්පාදනය 5% කින් වැඩි වූ අතර , කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය 6.6% කින් වැඩි වී තිබුණි. කුඩා තේ වතු අංශයෙන් උපරිම නිෂ්පාදනය වාර්තා වූ 2014 වර්ෂයට සාපේක්ෂව 6% කින් පමණ නිෂ්පාදනය අඩුවී තිබුණි. නමුත් කුඩා තේ වතු අංශයේ ජාතික නිෂ්පාදන දායකත්වය ක්‍රමයෙන් වර්ධනය වී 2017 වසර වනවිට 75.5% දක්වා වර්ධනය වී තිබුණි.

### කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය

2017 වසරේ කුඩා තේ වතු අංශයේ සාමාන්‍ය ඵලදායිතාව පෙර වර්ෂයට සාපේක්ෂව 6.6% කින් වැඩි වී තිබේ. ඒ අනුව 2017 වසරේ සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට සකස්කල තේ කිලෝ 1995 කි. පහත්බිම් සඳහා සාමාන්‍ය ඵලදායිතාවය සකස්කල තේ කිලෝ 2132 කි. මැදිබිම් සඳහා එය සකස්කල තේ කිලෝ 1346 ක් වූ අතර , ඌව සඳහා සකස්කල තේ කිලෝ 1453 ක් විය. උස්බිම් සඳහා සාමාන්‍ය ඵලදායිතාවය සකස්කල තේ කිලෝ 2213 ක් විය.

### තේ නැවත වගා බිම් ප්‍රමාණය සහ නැවත වගා ප්‍රතිශතය

උපරිම ඵලදාවක් ලබමින් තේ වගා භූමි ප්‍රමාණය ස්ථායිව පවත්වා ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තිමය වශයෙන් වසරකට 2% ක තේ භූමි ප්‍රමාණයක් නැවත වගාව කල යුතුව ඇත. ඒ අනුව කුඩා තේ ඉඩම් අංශයෙන් වාර්ෂිකව තේ නැවත වගා කල යුතු භූමි ප්‍රමාණය හෙක්ටයාර 2300 ක් පමණ වේ.

2012 වසර සිට ආයතනය විසින් ඉඩම් සංවර්ධන සේවා සහ ව්‍යාප්ති සේවා සැපයීම අක්කර 10ට අඩු බිම් සඳහා සීමා කිරීම මත වාර්ෂිකව හෙක්ටයාර් 2000 බිම් ප්‍රමාණයක් තේ නැවත වගාව පිණිස උදුරා දැමීමට යොමු කල යුතුය. වාර්ෂික ප්‍රතිපාදන පරිදි 2017 වසරේ හෙක්ටයාර 840 ක් ද කුඩා තේ හා රබර් පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ හෙක්ටයාර 1655 ක් උදුරා දැමීම සඳහා ඉලක්ක කරනු ලැබිණි. ව්‍යාපෘතිය යටතේ හෙක්ටයාර 1470 කට අදාලව අවසරපත් නිකුත් කරන ලදි.

ගතවූ දශකයේ දත්ත පරිදි ආයතනයෙහි සහනාධාර සහිතව වාර්ෂිකව සාමාන්‍යයෙන් හෙක්ටයාර 1052 ක පමණ භූමි ප්‍රමාණයක් තේ නැවත වගාව සඳහා උදුරා දැමීමත් , හෙක්ටයාර 834 ක පමණ සාමාන්‍ය ප්‍රමාණයක් වාර්ෂිකව තේ නැවත වගාවත් සිදුකර තිබේ. ගතවූ වසර 03 ක ප්‍රවනතාව අනුව වාර්ෂිකව හෙක්ටයාර 1143 ක ප්‍රමාණයක් උදුරා දැමීමද , හෙක්ටයාර 762 ක පමණ ප්‍රමාණයක් නැවත වගා කිරීමද සිදුවී තිබේ.

2017 වසරේ තේ නැවත වගා කිරීම පිණිස ඉලක්ක කරනු ලැබූ භූමි ප්‍රමාණය හෙක්ටයාර 1040 ක් වූ නමුදු නැවත වගාව නිම කර තිබූ භූමි ප්‍රමාණය හෙක්ටයාර 748 කි. මේ අනුව 2017 වසරේ තේ නැවත වගා ප්‍රතිශතය 0.75% ක් විය.

**තේ අලුත් වගාව**

2017 වසරේ තේ අලුත් වගාව සඳහා පස සැකසීම හෙක්ටයාර 200 ක් ඉලක්ක කරනු ලැබූ අතර එහි ප්‍රගතිය හෙක්ටයාර 211 කි. හෙක්ටයාර 202 ක භූමි ප්‍රමාණයක් තේ අලුත් වගාව නිම කර තිබුණි. ආයතනය සඳහා වූ වාර්ෂික ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන අලුත් වගාව සඳහා වාර්ෂික ඉලක්කගත භූමි ප්‍රමාණය නිශ්චය කර තිබුණි.

**භෝග පුනරුත්ථාපනය**

නිර්දේශිත පරිදි කප්පාදුව , පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතය සහ සෙවන පාලනය සමඟ ඒකාබද්ධව පාලු සිටුවීම මෙමගින් සිදුකෙරේ. ඒ අනුව 2017 වසර සඳහා පැල 912500 ක් පාලු සැපයීම සඳහා ඉලක්ක කරනු ලැබුණු අතර , එයින් පැල 564145 ක් පාලු සැපයීම නිමකර තිබුණි.

**ව්‍යාප්ති හා උපදේශක සේවා**

කුඩා තේ ඉඩම් වල ඵලදායිතාවය වර්ධනය කිරීම(වගු අංක 13-i), දළු ගුණාත්මය වර්ධනය කිරීම(වගු අංක 14) හා තේ පාදක ගොවිපල කළමණාකරනය (වගු අංක 16) අරමුණු කොට ගෙන ව්‍යාප්ති හා උපදෙස් සේවා සැපයීම සඳහා කණ්ඩායම් ව්‍යාප්ති වැඩසටහන් 7044 ක් ඉලක්ක කර තිබූ අතර , එයින් 6680 ක් එනම් 95% ක් ක්‍රියාත්මක කර තිබුණි.

මෙම වැඩසටහන් සඳහා ගොවි සහභාගිත්වය 179859 ක් ඉලක්ක කරනු ලැබූ අතර , සහභාගිවූ ගොවීන් සංඛ්‍යාව 188085 කි. එනම් ප්‍රගතියේ ප්‍රතිශතය 105% කි. ඒක පුද්ගල ව්‍යාප්ති වැඩසටහන් 37200 ක් 2017 වසරට ඉලක්ක කර තිබූ අතර , එහි ප්‍රගතියේ ප්‍රතිශතය 90% කි.

**කුඩා තේ වතු සංවර්ධන සමිති**

ප්‍රාදේශිය සංවිධාන 8 ක් සහ සමස්ත ලංකා සමිති සංවිධානයකින් යුතු කුඩා තේ වතු සංවර්ධන සමිති 1989 වර්ෂයේ ආරම්භ කර නීතිගත සංවිධාන බවට පත්කර තිබිණි. 2017 වසර අවසානය වන විට ලියාපදිංචි වූ කුඩා තේ වතු සංවර්ධන සමිති සංඛ්‍යාව 1435 කි. සාමාජික සංඛ්‍යාව 329778 කි. පෙර වර්ෂයට සාපේක්ෂව සමිති සංඛ්‍යාව 2.3% කින් වර්ධනය වී තිබුණි.

**ආයතනයේ මෙහෙයුම් පිරිවැය**

2017 වසරේ ආයතනයේ සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 643.09 කි. පුනරාවර්තන පිරිවැය රුපියල් මිලියන 337.05 කි. පසුගිය වසර හා සසඳන කල සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 81.22 හා පුනරාවර්තන පිරිවැය 22.5 කින් වැඩිවී ඇත. ඒ අනුව මෙහෙයුම් පිරිවැය හා සංවර්ධන පිරිවැය අතර අනුපාතය 0.52 කි.

**තේ ගොවි හා තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරී අනුපාතිකය**

ඵලදායි ව්‍යාප්ති සේවාවන් සඳහා තිබිය යුතු ව්‍යාප්ති කාරක සහ ගොවි සංඛ්‍යාවේ අනුපාතිකය 1:1000 ක් පමණ වුවද , කුඩා තේ වතු අංශයේ ක්ෂේත්‍ර නිලධාරී හා තේ ගොවි අනුපාතිකය 1:2751 කි. මේ අනුව ආවරණ ගොවි සංඛ්‍යාව පහත හෙලීම සඳහා නිලධාරී සංඛ්‍යාව වැඩි කල යුතු මුත් ආයතනයේ ප්‍රතිපාදන හා පිරිවැය සීමා තත්ත්වයන් සැලකිල්ලට ගෙන එසේ වැඩිකිරීම අසීරුවේ. එබැවින් සේවා සැපයීම් කටයුතු වලදී කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානවල සහාය ලබාගැනීමට ආයතනය විසින් කටයුතු කරන ලදි.

**අමු දලු සඳහා මිල**

2017 වසරේ ජාතික උච්චත්ව සාමාන්‍ය අගයන් පරිදි ශ්‍රී ලංකා තේ වෙළඳපල මිල ගණන් අනුව උඩරට අමු දළු තේ කිලෝවක් සඳහා ගෙවනු ලැබූ මිල රු. 88.71 කි. මැදරට අමු දළු කිලෝවක් සඳහා රු. 82.75 ක්ද , පහත රට ප්‍රදේශ සඳහා රු. 93.29 ක්ද සියලු බිම් සඳහා ජාතික උච්චත්ව සාමාන්‍ය අගය රු. 90.69 ක්ද විය. 2017 වසරේ පහතරට සඳහා නිෂ්පාදන ආන්තිකය 21.64 ක් වූ අතර සියලුම ප්‍රදේශ සාමාන්‍ය සඳහා නිෂ්පාදන ආන්තිකය 19.04 අගයක් ගෙන තිබුණි.

# 01. හැඳින්වීම

## 1.1. ආයතනය හා කාර්යභාරය

## 1.2. විගණන හා කළමනාකරණ කමිටු කටයුතු

## 1.3. පරිපාලනමය කටයුතු

# හැඳින්වීම

## 1.1 ආයතනය හා කාර්යභාරය

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ, 1977 පෙබරවාරි මස 01 වන දින කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී.

අනතුරුව ප්‍රධාන ප්‍රඥප්තියට සංශෝධන එකතු කර 1991 අංක 36 දරණ පනත , 1997 අංක 21 දරණ පනත , 2003 අංක 34 දරන පනත සහ 2006 අංක 42 දරණ පනත සම්මත කර තිබේ.

## පරමාර්ථ

කුඩා තේ ඉඩම් සංවර්ධනය කිරීම , නිෂ්පාදනය වැඩි කිරීම , ඵලදායිතාවය වර්ධනය කිරීම , දළු අලෙවි කටයුතු සහ කුඩා තේ ඉඩම් හිමියන්ගේ සුභ සිද්ධිය පිණිස කටයුතු කිරීම ආයතනයේ පරමාර්ථය වේ.

## අධිකාරියේ කාර්යභාරය

1. කුඩා තේ වතුවල සහ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතු වලද සංවර්ධනයට අනුබල දීම හෝ සංවර්ධනය කිරීමට භාර ගැනීම.

2. එම තේ ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්ත ශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම හෝ සංවර්ධනය කිරීම.

3. මෙම තේ ඉඩම්වල හෝ එකී කර්මාන්ත ශාලා වල කෙරෙන නිෂ්පාදන අලෙවිය දියුණු කිරීම හෝ අලෙවි කිරීම භාර ගැනීම.

4. එකී ඉඩම් හා කර්මාන්ත ශාලා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වියහැකි පහසුකම් සහ සේවාවන් සපයාදීම හෝ ලබාදීම සඳහා නැතහොත් එම පහසුකම් සහ සේවාවන් ලබාදීම පහසු කිරීම සඳහා ද , එම ඉඩම් වල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීමෙහි හෝ ඒවා ඇසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ට ව්‍යවස්ථාපිත හිමිකම් සහ පාරිශ්‍රමික ගෙවීමද ඇතුළුව ඔවුන්ගේ සුභ සිද්ධිය සඳහා ද අවශ්‍ය සියළු පියවර ගැනීම.

5. කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීමට සහ අධිකාරිය වෙත ලියාපදිංචි කර ඇති එවැනි සමිති වල සාමාජිකයනට ආධාර ලබාදීම සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා රීති සෑදීමට විධිවිධාන සැලසීම.

6. කුඩා තේ වතුවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම.

7. දත්ත එකතු කිරීමට හා බෙදාහැරීමට භාර ගැනීම සහ කුඩා තේ වතුවල සංවර්ධන හැකියාව දැනගැනීම.

8. උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යාංශයට උපදෙස් දීම සහ වෙනත් අදාල නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.

ඉහත සඳහන් අංක 2,3,4 හි කාර්යභාරයන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පනතින් ඉවත් කිරීමට සහ වෙනත් කාර්යයන් ආදේශ කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පැවතුණි.

මීට අමතරව 1978 ජනවාරි 01 වන දින සිට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වරින් වර පවරන ලද කාර්යයන් සහ අනෙකුත් අදාල පහත සඳහන් සෙසු කාර්යයන්ද ඇතුලත් වන පරිදි අධිකාරිය විසින් කටයුතු කරගෙන යන ලදී.

1. පෞද්ගලික අංශයේ කළමනාකාරීත්වය යටතේ පවත්නා ඉඩම් සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් ආධාර ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම.

   I තේ නැවත වගාව

   II අළුත් වගාව

   III පාළු සැපයීම

2. තේ පොහොර බෙදා හැරීම , වැවිලි ද්‍රව්‍ය , උපකරණ හා ප්‍රවාහන පහසුකම් ලබාදීම වැනි උපකාරක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

3. ව්‍යාප්ති හා උපදේශක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

### 1.2 විගණන හා කළමනාකරණ කමිටු කටයුතු

2017 වසර සඳහා ආයතනික විගණන සැලැස්ම 2016.12.30 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. සමාලෝචිත වර්ෂයතුල විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.

එම විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වලදී පහත සඳහන් ප්‍රධාන තීරණ ගෙන තිබුණි.

1. අභ්‍යන්තර විගණන අංශය මගින් නිකුත් කර ඇති විගණන වාර්තා අතරින් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැති විගණන වාර්තා ප්‍රගතිය සම්බන්ධ තීරණයන්
2. ක්‍රියාත්මක කර නොමැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කරවීමට අදාල තීරණයන්

2018 වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණන සැලැස්ම 2017.12.26 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. විගණන හා කළමනාකරණ කමිටුව විසින් අදාල වසර තුළ පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධව විමර්ශනයන් මූලිකව සිදුකරන ලදී.

1. අභ්‍යන්තර විගණන වාර්ෂික සැලැස්ම විමසුමට භාජනය කිරීම.
2. අභ්‍යන්තර විගණන වාර්තා මගින් අනාවරණය කර තිබූ කරුණු සමාලෝචනයට භාජනය කිරීම හා යෝජනා ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට කටයුතු කිරීම.
3. විගණකාධිපති වාර්තා සමාලෝචනය කිරීම හා එමගින් දක්වා ඇති ඌනතාවයන් නැවත ඇතිවීම වැලැක්වීම සඳහා අවශ්‍ය වූ නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගැනීම.
4. විගණන විමසුම් පිළිබඳ පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පරීක්ෂාව.
5. පවත්නා චක්‍රලේඛ හා රෙගුලාසි අනුව කටයුතු කරන්නේද යන්න පිළිබඳව විමර්ශනය කිරීම හා අඩුපාඩු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම

විගණන පරීක්ෂණ පැවැත්වීම හා වාර්තා කිරීම යටතේ සැලසුම් කරන ලද විගණන පරීක්ෂණ 10 ක්ද වෙනත් පරීක්ෂණ 04 ක්ද 2017 වසරේ නිමකරන ලදී.

විගණන විමසුම වෙනුවෙන් පරිපාලන අංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු කාලීනව විගණන කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමට කටයුතු කරඇත.

### 1.3 පරිපාලනමය කටයුතු

#### 1.3.1 සංවිධාන ව්‍යුහය සහ බඳවා ගැනීමේ පරිපාටිය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1714 V-III(C) හා 2017.10.31 දිනැති ලිපිය මගින් අධිකාරියේ සංවිධාන ව්‍යුහය සඳහා අනුමතව පැවති කළමනාකරණ සහකාර(තාක්ෂණික නොවන) තනතුරු 07 ක් හා කාර්යාල හා ආරක්ෂක සහායක තනතුරු 07 ක් අනුමත කර ඇත. ඒ අනුව අධිකාරියේ අනුමත මුළු තනතුරු සංඛ්‍යාව 459 දක්වා ඉහල ගොස් ඇත.

තවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1714 V-II හා 2016.11.29 දිනැති ලිපිය මගින් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරි තනතුර සඳහා MA 2-3 ලෙස නව වැටුප් කේතයක් අනුමත කර ඇත.

#### 1.3.2 ප්‍රතිපත්තිමය තීරණ

රජයේ සෑම සංවර්ධන කටයුත්තක්ම දිස්ත්‍රික් සංවර්ධන ප්‍රමුඛතාවය පදනම්ව සිදුකරනු ලැබීම මත ඊට අනුගාමී වීමටත් , ආයතනය විසින් බාහිර ආයතන සමග සිදුකරන අන්තර් සේවා සම්බන්ධීකරණ කටයුතු පහසුකර ගැනීම පිණිසත් , ආයතනයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය වඩාත් විධිමත්ව පවත්වාගෙන යාමත් යන කරුණු අරමුණු කරගෙන අධිකාරියෙහි මහනුවර දිස්ත්‍රික්කය සහ නුවරඑළිය දිස්ත්‍රික්කය යන ප්‍රාදේශීය කාර්යාල දෙකෙහි මෙතෙක් මිශ්‍රව පැවැති දිස්ත්‍රික් සේවා බල ප්‍රදේශ සංයුතිය එක් පරිපාලන දිස්ත්‍රික්කයක සමස්තයම ඇතුලත් වන දිස්ත්‍රික් සේවා බල ප්‍රදේශ ලෙස සංශෝධනය කර 2016.01.01 දින සිට ක්‍රියාත්මක කරන ලද අතර 2017 වසරේ දි නුවරඑළිය දිස්ත්‍රික්කය සඳහා වෙනම ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**වර්ෂය තුළ සිදුකරන ලද පත්කිරීම්**

අධිකාරියේ පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතිය පරිදි අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව වර්ෂය තුල පහත සඳහන් තනතුරු සඳහා පත්කිරීම් සිදුකිරීමට කටයුතු කරන ලදි.

| තනතුර | ශ්‍රේණිය | සංඛ්‍යාව |
|---|---|---|
| සාමාන්‍යාධිකාරි | HM 2-1 | 01 |
| සහකාර ප්‍රාදේශිය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන) | MM 1-1 | 03 |
| ගිණුම් නිලධාරි | JM 1-1 | 01 |
| පරිපාලන නිලධාරි | JM 1-1 | 03 |
| තේ පරික්ෂක/ව්‍යාප්ති නිලධාරි | MA2-3 | 35 |
| පොත් තබන්නා | MA 2-2 | 05 |
| කළමනාකරණ සහකාර | MA 1-2 | 18 |
| රියදුරු | PL 3 | 06 |
| **එකතුව** | | **72** |

### 1.3.3 ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ ප්‍රතිඵල පාදක කළමණාකරන උපායමාර්ග හා සංවර්ධනාත්මක ප්‍රතිඵල

ආයතනයේ අපේක්ෂිත දිගුකාලින සංවර්ධන ප්‍රතිඵලය " කුඩා තේ වතු හිමියන්ගේ ජිවන තත්වය නංවාලීම " ලෙස හඳුනාගෙන තිබේ. ව්‍යවස්ථාපිත අරමුණු ඉටුකිරීම පිණිස ප්‍රතිඵල පාදක කළමණාකරන ප්‍රවේශය ආයතනික උපායමාර්ගය වේ. ඒ යටතේ 2010 වසර සිට 2017 වසර දක්වා හඳුනාගත් මධ්‍යකාලින ප්‍රතිඵල අරමුණු කරගෙන වාර්ෂික ක්‍රියාත්මක සැලසුම් තුලින් ඉලක්ක සාක්ෂාත් කරගැනිමට ආයතනය කටයුතු කර ඇත.

ඒ සඳහා ප්‍රධාන මිණුම් දණ්ඩ ලෙස කුඩා තේ වතු අංශයේ හෙක්ටයාරයක (නිම් තේ කිලෝ) ඵලදායිතාවය ප්‍රධානතම කාර්යඵල දර්ශකය ලෙස සලකා තිබේ. ඒ අනුව උස්බිම්, මැදිබිම්, පහත්බිම් හා සාමාන්‍ය ඵලදායිතාවය සඳහා වාර්ෂික ඉලක්ක ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට හඳුන්වා දිමෙන් ප්‍රතිඵල සාක්ෂාත් කරගැනිමට ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවනු ලැබුණි. (2017 වසරට තේ භෝගය සඳහා හඳුනාගෙන ඇති ජාතික ඉලක්කය හෙක්ටයාරයකට නිම් තේ කිලෝ 1850 කි.) 2016 සහ 2017 වර්ෂවල කාර්යඵල සාර්ථකත්වය මැනිම සඳහා වූ ප්‍රධානම සංවර්ධන ඉලක්ක හා කාර්යඵල සාර්ථකත්වය පහත දක්වා ඇත.

**වගු අංක 01**

**<u>ආයතනය අපේක්ෂිත ඵලදායිතා ඉලක්ක හා කාර්යසාධනය - 2016/2017</u>**

**<u>(වසරකට හෙක්ටයාරයකට නිම් තේ කිලෝ)</u>**

| | 2016 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කය | කාර්යඵලය | ප්‍රතිශතය | ඉලක්කය | කාර්යඵලය | ප්‍රතිශතය |
| පහත රට | 2300 | 1984 | 86% | 2300 | 2132 | 93% |
| මැද රට | 1500 | 1335 | 89% | 1500 | 1346 | 90% |
| ඌව | 1300 | 1188 | 91% | 1400 | 1453 | 104% |
| සාමාන්‍යය | 1800 | 1872 | 104% | 1850 | 1995 | 108% |

රූප සටහන් අංක 01




**සංවර්ධන ප්‍රතිඵල**

**දිගුකාලින බලපෑම/ ප්‍රතිඵලය** - කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්ත්වය නංවාලීම

**මධ්‍යකාලින ප්‍රතිඵල**

1. වසර 03 කදි වසරකට / හෙක්ටයාරයකට / සකස්කල තේ / කිලෝ
   පහත රට 2500 දක්වා
   මැද රට 1700 දක්වා
   ඌව 1500 දක්වා වැඩි කිරීම

2. වසර 3 කදි කම්හල් මට්ටමින් අමු දළු ගුණාත්මය 60% දක්වා වර්ධනය කිරීම

3. වසර 03 ක් තුළ ප්‍රජා මූලික සංවිධාන 50% කින් ශක්තිමත් කිරීම

4. වසරක් තුල වඩාත් සඵලදායි ලෙස ක්‍රියාත්මක වීම සඳහා ආයතනය ශක්තිමත් වීම

5. වසර 05 ක් තුලදී තේ ඉඩම් වලින් 10% ක් අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමුකරවීම

# 02. ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය

2.1. කුඩා තේ ඉඩම්

2.2. කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය

2.3. කුඩා තේ ඉඩම් හිමියෝ

2.4. කුඩා තේ ඉඩම් සංඛ්‍යාව

2.5. භූමි වර්ගීකරණය

2.6. කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය

2.7. කුඩා තේ ඉඩම් නිෂ්පාදන සංයුතිය

2.8. කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය

2.9. කුඩා තේ අංශයේ ආයෝජනයන් හා මෙහෙයුම් සමාලෝචනය

# ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය

**2.1. කුඩා තේ ඉඩම් :**

තේ පාලන පනතට අනුව "අක්කර 10 ට අඩු තේ ඉඩම් කුඩා තේ ඉඩම්" ලෙස සැලකේ. එසේ වුවද ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ පැවති අක්කර 10 -50 දක්වා වූ තේ ඉඩම් සඳහා සංවර්ධන කටයුතු කිරීමේ බලතල 1978 ජනවාරි මස 01 දා සිට කුඩා තේවතු සංවර්ධන අධිකාරිය වෙත ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පවරන ලදී. ඒ අනුව පුද්ගලික අයිතිය යටතේ ඇති අක්කර 50 ට අඩු සියළුම තේ ඉඩම්වල සංවර්ධනය සඳහා අදාල සහායක සේවාවන් ආයතනය විසින් මෙතෙක් සපයා තිබුණි.

2012 වසර වන විට අක්කර 10 සිට 50 දක්වූ බිම්ප්‍රමාණ සඳහා ඉඩම් සංවර්ධන සේවා සැපයීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙතත්, ව්‍යාප්ති සේවා සැපයීම ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය වෙතත් පවරා ඇත. ඒ අනුව 2012 වර්ෂයේ සිට පනතෙහි පවතින ප්‍රතිපාදන පරිදි අක්කර 10 ට අඩු තේ බිම් සඳහා පමණක් ඒවායේ සංවර්ධනයට සහ ඊට අදාල සහායක සේවාවන් ආයතනය විසින් සපයන ලදී.

**2. 2 කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය :**

2005 කුඩා තේ වතු සංගණනය පරිදි කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය වූ හෙක්ටයාර 132,329 ද ඇතුලුව (පර්චස් 20 අඩු භූමි සහිතව) ශ්‍රී ලංකාවේ සමස්ත තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර *221,968 ක් පමණ වේ. මේ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත තේ භූමි ප්‍රමාණයෙන් 59% ක් කුඩා තේ ඉඩම් අංශයට අයත් වේ.

1994/95 කුඩා තේ ඉඩම් සංගණන තොරතුරු හා සසඳා බැලීමේදී දශකයක කාලපරිච්ඡේදයක් තුල ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර 82,919 සිට හෙක්ටයාර 116,492 දක්වා (පර්චස් 20 ට වැඩි ඉඩම් පමණි) එනම් 40% කින් පමණ වැඩිවී ඇත.

රූප සටහන් අංක 02




මූලාශ්‍ර - * ශ්‍රී ලංකා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තාව 1994/ 1995- ශ්‍රී ලංකා තේ මණ්ඩලය

* කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණනය 2005 - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

**2. 3 කුඩා තේ ඉඩම් හිමියෝ :**

2005 සංගණන පරිදි කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව 370,842 කි. (පර්චස් 20 වඩා අඩු වගාකරුවන්ද ඇතුළුව) මොවුන්ගෙන් 82% ක් තනි අයිතිය යටතේ වූ ඉඩම් හිමි කුඩා තේ වතු හිමියන් වන අතර , මෙම පිරිස සඳහා තේ වගා භූමි ප්‍රමාණයෙන් 76% ක් පමණ අයත් වේ. තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ පාදක වාර්ෂික තොරතුරු පරිදි 2017 වසර අවසානය වන විට කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව 395414 කි.

**2. 4 කුඩා තේ ඉඩම් සංඛ්‍යාව :**

1994 සිට 2005 වසර දක්වා කාලය තුල සමස්ත කුඩා තේ ඉඩම් සංඛ්‍යාව 206,652 සිට 350,982 (පර්චස් 20 වැඩි) දක්වා එනම් 70% කින් වැඩි වී ඇත. පර්චස් 20 ට වැඩි ඉඩම් කැබලි සංඛ්‍යාව 370842 කි. පර්චස් 20 ට අඩු ඉඩම් කැබලි සංඛ්‍යාව සහිතව මුළු ඉඩම් කැබලි සංඛ්‍යාව 417607 කි.

2005 වසරේ සංගණන පරිදි සමස්ත කුඩා තේ ඉඩම් කැබලි සංඛ්‍යාව 397223 සහ බිම් ප්‍රමාණය හෙක්ටයාර 132329 ක් වේ. මෙම ප්‍රමාණය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 123 ක් යටතේ ග්‍රාම නිලධාරී වසම් 3692 ක කුඩා තේ ඉඩම් ව්‍යාප්තවී තිබේ.

වගු අංක 2

**ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් අනුව කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව , ඉඩම් සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව | කුඩා තේ ඉඩම් සංඛ්‍යාව | හෙක්.ගණන |
|---|---|---|---|
| කොළඹ | 478 | 491 | 246 |
| ගම්පහ | 9 | 9 | 2 |
| කළුතර | 35,908 | 38,263 | 7,823 |
| මහනුවර | 29,224 | 30,747 | 16,058 |
| මාතලේ | 1,387 | 1,408 | 1,672 |
| නුවරඑළිය | 16,875 | 17,547 | 7,205 |
| ගාල්ල | 81,491 | 90,524 | 27,427 |
| මාතර | 63,273 | 67,613 | 25,417 |
| හම්බන්තොට | 2,386 | 2,533 | 546 |
| කුරුණෑගල | 145 | 151 | 180 |
| බදුල්ල | 28,101 | 29,679 | 9,020 |
| මොණරාගල | 634 | 637 | 199 |
| රත්නපුර | 92,038 | 97,984 | 30,441 |
| කෑගල්ල | 18,893 | 19,637 | 6,093 |
| **එකතුව** | **370,842** | **397,223** | **132,329** |

මූලාශ්‍රය - ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණනය -2005

කුඩා තේ ඉඩම් අංශයේ තේ ඉඩම් වර්ධනය සඳහා විශේෂයෙන් අමු දළු සඳහා ලැබෙන මිල ඉහල යාම , තේ වගාව සඳහා දිරිදීමනා මුදල වැඩිකිරීම , ශ්‍රම හිගය ,විශාල ඉඩම් කැබලි කිරීම සහ විකල්ප වගා නොමැති ඉඩම් තේ වගාවට යොමුවීම යන කරුණු බලපා තිබේ.

## 2. 5 භූමි වර්ගීකරණය :

2016 වසරේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ඒකාබද්ධව සිදුකෙරෙන තේ ඉඩම් ලියාපදිංචිය කිරීමේ වැඩසටහන මගින් දත්ත හා තොරතුරු යාවත්කාලීන කිරීමට ඉදිරියේදී කටයුතු කරන අතර එතෙක් පහත සඳහන් 2005 වසර සංගණන තොරතුරු ආයතනික සංවර්ධන කටයුතු සඳහා උපයෝගී කරගන්නා ලදී.

කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණයෙන් අක්කර 113,190 (34.6%) අක්කර එකකට වඩා අඩු තේ ඉඩම් වන අතර, අක්කර 198,707 (60.8%) අක්කර දෙකකට වඩා අඩු තේ ඉඩම් වේ. අක්කර 10 ට වැඩි තේ ඉඩම් ප්‍රමාණය අක්කර 59,731 කි. (18.3%) පහත වගුව පරිදි අක්කර 267253 (හෙක්ටයාර 108200) අක්කර 10 ට අඩු තේ ඉඩම් වේ.

වගු අංක 3

**ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය සහ කැබලි සංඛ්‍යාව අනුව වර්ගීකරණය - 2005**

| අක්කර | භූමි ප්‍රමාණය අක්කර | % | ඉඩම් කැබලි සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| 1 ට අඩු | 113,190 | 34.6 | 297,342 | 75 |
| 1 - 2 ට අඩු | 85,517 | 26.2 | 74,314 | 18.7 |
| 2 - 3 ට අඩු | 31,882 | 9.8 | 15,101 | 3.8 |
| 3 - 5 ට අඩු | 18,413 | 5.6 | 5,299 | 1.3 |
| 5 - 10 ට අඩු | 18,251 | 5.5 | 2,936 | 0.7 |
| 10 සහ වැඩි | 59,731 | 18.3 | 2,231 | 0.5 |
| | **326,984** | | **397,223** | |

රූප සටහන් අංක 03




මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තාව

**2. 6 කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය :**

2017 වසරේ ජාතික තේ නිෂ්පාදනය කිලෝ මිලියන 307.72 කි. මෙය පෙර වර්ෂය සමග සැසඳීමේදී කිලෝ මිලියන 15.15 කින් හෙවත් 5.18% කින් ජාතික නිෂ්පාදනය වැඩිවී තිබේ.

එසේම කුඩා තේ වතු අංශයේ සමස්ත තේ නිෂ්පාදනය ද කිලෝ මිලියන 14.35 කින් හෙවත් 6.6% කින් නිෂ්පාදනය වැඩිවී තිබේ.

වසර 1991 ජාතික තේ නිෂ්පාදනයෙන් 50% ක් නිෂ්පාදනය කරනු ලැබූ කුඩා තේ ඉඩම් අංශය සමාලෝචිත වර්ෂය තුල 75.5% ක නිෂ්පාදන දායකත්වයක් දරා ඇත.

**වගු අංක 4**

**ශ්‍රී ලංකාවේ ජාතික තේ නිෂ්පාදනය - 2016 / 2017**
**කළමනාකාරීත්ව ආයතන අනුව දායකත්වය**

| | කළමනාකාරීත්ව ආයතන | තේ නිෂ්පාදනය මෙ.ටො 2016 | % | 2017 | % |
|---|---|---|---|---|---|
| 01 | පෞද්ගලික අංශය(කුඩා තේ අංශය) | 218,068 | 74.53 | 232,417 | 75.5 |
| 02 | ප්‍රාදේශීය වැවිලි සමාගම් | 72,948 | 24.95 | 73,079 | 23.8 |
| 03 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය රාජ්‍ය වැවිලි සංස්ථාව | 1,262 | 0.43 | 1,483 | 0.5 |
| 04 | අනෙකුත් | 295 | 0.10 | 741 | 0.2 |
| | **මුළු එකතුව** | **292,573** | | **307,720** | |

(අනෙකුත් = තේ ශක්ති , ටි ස්මොල් හොල්ඩර් ෆැක්ටරීස් ලිමිටඩ් ,ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය, සමූපකාර, ඇල්කඩුව වැවිලි සමාගම , කළුබෝවිටියන තේ කම්හල් සමාගම)

**රූප සටහන් අංක 04**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

(ආයතන වර්ගීකරණයේ මිලදී ගත් දළු සියල්ලම කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනයට ඇතුලත් කර ඇත. මෙහිදී පෞද්ගලික අංශය යන්න කුඩා තේ ඉඩම් අංශය ලෙස සලකා ඇත.)

**රූප සටහන් අංක 05**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**රූප සටහන් අංක 06**




මූලාශ්‍රය :- ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### 2. 7 කුඩා තේ ඉඩම් නිෂ්පාදන සංයුතිය

2017 වර්ෂයේ ජාතික තේ නිෂ්පාදනයෙහි සමස්ත පහත රට තේ නිෂ්පාදනයෙන් 97% ක්ද, මැදරට සමස්ත නිෂ්පාදනයෙන් 63% ක්ද, උඩරට සමස්ත නිෂ්පාදනයෙන් 20% ක්ද කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනයෙන් සමන්විත වී තිබුණි. (වගු අංක 04) තවද 2017 වසරේදී ද පුද්ගලික අංශයේ සමස්ත තේ නිෂ්පාදනයෙන් 82% ක්ම පහතරට තේ නිෂ්පාදනයට අයත් විය.

2016 වර්ෂය හා සසඳන කල 2017 වර්ෂයේදී කුඩා තේ ඉඩම් අංශයේ උඩරට තේ නිෂ්පාදනය 4% කින්ද මැදරට 0.8% කින්ද සහ පහතරට තේ නිෂ්පාදනය 7.5% කින්ද වැඩිවී තිබේ.

**වගු අංක 05**

**<u>කුඩා තේ ඉඩම් අංශයේ භෞතික හා නිෂ්පාදන දායකත්වය (පිහිටීම මත)</u>**

**<u>2016/ 2017</u>**

| | | වර්ෂය | උඩරට | මැදරට | පහත රට | එකතුව |
|---|---|---|---|---|---|---|
| කුඩා තේ බිම් ප්‍රමාණය | (හෙක්ටයාර) | | 5913 | 21403 | 89176 | 116492 |
| දායක ප්‍රතිශතය | | | 5% | 18% | 77% | |
| ජාතික නිෂ්පාදනය | මෙ.ටො | 2016 | 64,425 | 44,510 | 183,638 | 292,573 |
| | % | | 22% | 15% | 63% | |
| | මෙ.ටො | 2017 | 64,643 | 45,655 | 197,422 | 307,72 |
| | % | | 21% | 15% | 64% | |
| කුඩා තේ නිෂ්පාදනය | මෙ.ටො | 2016 | 12558 | 28573 | 176937 | 218068 |
| | % | | 5.8% | 13.1 % | 81.1% | |
| | මෙ.ටො | 2017 | 13079 | 28811 | 190152 | 232417 |
| | % | | 6% | 12% | 82% | |
| ජාතික නිෂ්පාදනයට | % | 2016 | 4.3% | 9.8% | 60.4% | 74.5% |
| දායකත්වය | | 2017 | 4.3% | 9.4% | 61.8% | 75.5% |
| ඵලදායිතාවය | වසරකට / හෙක්ටයාරයකට | 2016 | 1774 | 1335 | 1984 | 1872 |
| | / සකස්කල තේ | 2017 | 2212 | 1346 | 2132 | 1995 |

**මූලාශ්‍රය**

1. කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තාව 2005 - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
2. මාසික සංඛ්‍යා සාරාංශය - ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2017

## 2. 8 කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය

2017 වසර දෙකෙහිද ජාතික තේ නිෂ්පාදනයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනයයි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ නිෂ්පාදනය පිළිබඳ දත්ත පරිදි 2017 වසරේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට නිමි තේ කිලෝ 1995 කි. 2016 වසරේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට නිමි තේ කි.ග්‍රෑ. 1872 ක් වූ බැවින් ඵලදායිතාවය 6.6% කින් වැඩිවී තිබේ.

**වගු අංක 06**

**<u>කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය 2017 ( නිමි තේ / කිලෝ )</u>**

**<u>පරිපාලන දිස්ත්‍රික් පදනමින්</u>**

| පරිපාලන දිස්ත්‍රික්කය | කුඩා තේ බිම් ප්‍රමාණය (හෙක්:) ** | උස් බිම් | මැදි බිම් | පහත් බිම් | එකතුව | ඵලදායිතාව (හෙක්ටයාරයකට නිමි තේ කිලෝ )* |
|---|---|---|---|---|---|---|
| බදුල්ල | 7863 | 4,922,791 | 6,499,185 | - | 11,421,976 | 1453 |
| ගාල්ල | 25325 | - | - | 45,120,059 | 45,120,059 | 1782 |
| හම්බන්තොට | 492 | - | - | 186,320 | 186,320 | 379 |
| කළුතර | 7588 | - | - | 19,926,368 | 19,926,368 | 2626 |
| කොළඹ | 246 | - | - | 784,544 | 784,544 | 3189 |
| මහනුවර | 12486 | 437,083 | 15,655,021 | 12,778,091 | 28,870,194 | 2312 |
| කෑගල්ල | 5753 | 152,366 | - | 8,001,677 | 8,154,043 | 1417 |
| මාතලේ | 1190 | - | 982,025 | 375,,540 | 1,357,565 | 1141 |
| මාතර | 22971 | - | 249187 | 37011174 | 37,260,361 | 1622 |
| නුවරඑළිය | 5971 | 7,566,431 | 4,859,290 | 735,233 | 13,160,954 | 2204 |
| රත්නපුර | 28232 | | 566,390 | 65,608,252 | 66,174,642 | 2344 |
| එකතුව | | **13,078,671** | **28,811,098** | **190,151,718** | **232,417,026** | |
| 2005 සංගණනය පාදකව බිම් ප්‍රමාණය | - | **5913** | **21403** | **89176** | **116492** | |
| ඇස්තමේන්තු ගත සාමාන්‍ය ඵලදායිතාව/ හෙක්ටයාරයකට | 2016 | 1,774 | 1,335 | 1,984 | 1,872 | - |
| | 2017 | 2,212 | 1,346 | 2,132 | 1,995 | - |

මූලාශ්‍රය:- ශ්‍රී ලංකා තේ මණ්ඩලය

* ඵලදායිතාව ගණනය කිරීම සඳහා පර්චස් 20ට අඩු භූමි ප්‍රමාණයන් අත්හැර ගණනය කර ඇත.

** පර්චස් 20ට අඩු භූමි ප්‍රමාණයද සහිතව දක්වා ඇත.

* පරිපාලන දිස්ත්‍රික් පදනමට පරිබාහිරව කම්හල්වලට අමු දළු මිලදී ගැනීම මත සමහර දිස්ත්‍රික්කවල නිෂ්පාදන දත්ත යථාරූපී නොවේ.

**2. 9 කුඩා තේ අංශයේ ආයෝජනයන් හා මෙහෙයුම් සමාලෝචනය**

2017 වර්ෂයේ සංවර්ධන හා ආයතනික ප්‍රාග්ධන පිරිවැය ලෙස රුපියල් මිලියන 800.01 ක්ද, පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 345.00 ක්ද වශයෙන් රුපියල් මිලියන 1145.00 ක් සඳහා ක්‍රියාත්මක සැලැස්ම පිළියෙල කරන ලදි.

2017 වසර සඳහා ලද ප්‍රාග්ධන මුදල රුපියල් මිලියන 455.00 ක් හා පුනරාවර්තන රුපියල් මිලියන 329.45 ක් වනසේ සමස්ත ලැබීම් රුපියල් මිලියන 784.45 ක් විය.

**වගු අංක 07**

**පුද්ගලික අංශයේ තේ නිෂ්පාදනය සහ භාණ්ඩාගාර අරමුදල් ලැබීම් -2007 - 2017**

| වර්ෂය | සමස්ත තේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.මි) | සමස්ත නිෂ්පාදන දායකත්වය% පුද්ගලික අංශය | අනෙකුත් අංශ | පුද්ගලික අංශය (කුඩා තේ ඉඩම් අංශය ) සඳහා ප්‍රතිපාදිත මුදල (රු.මිලි) |
|---|---|---|---|---|
| 2007 | 304.61 | 67.5 | 26.2 | 418.00 |
| 2008 | 318.46 | 67.4 | 25.9 | 405.30 |
| 2009 | 291.13 | 69.3 | 24.8 | 367.80 |
| 2010 | 331.42 | 69.4 | 23.8 | 394.93 |
| 2011 | 327.53 | 69.9 | 30.1 | 391.59 |
| 2012 | 326.27 | 71.4 | 28.6 | 418.83 |
| 2013 | 340.02 | 72.2 | 27.8 | 520.14 |
| 2014 | 338.03 | 73.1 | 26.9 | 742.94 |
| 2015 | 328.96 | 72.9 | 27.1 | 969.72 |
| 2016 | 292.57 | 74.5 | 25.5 | 1009.45 |
| 2017 | 307.72 | 75.5 | 24.5 | 784.45 |

**මෙහෙයුම් සමාලෝචනය**

2017 වසරේ මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 337.05 කි. 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වසරේ මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 22.11 කින් වැඩි වී තිබේ.

**වගු අංක 8**

**මෙහෙයුම් සමාලෝචනය**

**(2007 සිට 2017 දක්වා)**

| වර්ෂය | සංවර්ධන පිරිවැය රු.000 | මෙහෙයුම් පිරිවැය රු.000 | සංවර්ධන රුපියලක් සඳහා මෙහෙයුම් පිරිවැය |
|---|---|---|---|
| 2007 | 183782 | 178985 | 0.97 |
| 2008 | 208255 | 188725 | 0.91 |
| 2009 | 185660 | 202146 | 1.08 |
| 2010 | 189194 | 205385 | 1.08 |
| 2011 | 208407 | 218527 | 1.04 |
| 2012 | 276324 | 233738 | 0.85 |
| 2013 | 440060 | 238823 | 0.54 |
| 2014 | 345104 | 252774 | 0.73 |
| 2015 | 561490 | 303435 | 0.54 |
| 2016 | 561868 | 314547 | 0.56 |
| 2017 | 643092 | 337053 | 0.52 |



# 03. ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ සංවර්ධන කාර්යයන්

3.1. මධ්‍යකාලීන ප්‍රතිඵල පාදක ඉලක්ක හා කාර්යඵලය

3.2. කුඩා තේ ඉඩම්වල ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති කටයුතු

3.3. ප්‍රධාන කාර්යපාදක දර්ශකය

## ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ සංවර්ධන කාර්යයන්

ආයතනය ස්ථාපිත කිරීම සඳහා වූ පනතට පදනම්ව පැවති ප්‍රධාන ව්‍යාවස්ථාපිත අරමුණු 4ට අනතුරුව වර්ෂ 1997 , 2003 හා 2006 යන වර්ෂවලදී පනතට එකතුකරන ලද සංශෝධන පරිදි ආයතනයෙහි ව්‍යවස්ථාපිත අරමුණු හා ඊට අදාල සංවර්ධන කාර්යයන් පහත සඳහන් පරිදි වේ. මෙයින් අංක 02 , 03 හා අංක 04 හි සඳහන් කාර්යන් පනතෙන් ඉවත් කිරීමට සහ වෙනත් කාර්යන් ආදේශ කිරීමට අවශ්‍ය කටයුතු ද ක්‍රියාත්මක වෙමින් පැවතුනි.

**ව්‍යවස්ථාපිත අරමුණු :-**

01. කුඩා තේ වතුවල සහ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතුවලද සංවර්ධනයට අනුබල දීම හෝ සංවර්ධනය කිරීමට භාර ගැනීම

    සංවර්ධන කාර්යයන් :-
    i තේ නැවත වගා දිරි දීමනා ක්‍රමය
    ii. තේ අළුත් වගා දිරි දීමනා ක්‍රමය
    iii. භෝග පුනරුත්ථාපන දිරි දීමනා ක්‍රමය

02. එම තේ ඉඩම්වල එලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්තශාලා සඳහා වෙනත් පහසුකම් අත්කර ගැනීම
    සංවර්ධන කාර්යයන් :-

    අධිකාරිය විසින් 1977 වසරේදී " තේ ශක්ති අරමුදල " පිහිටවනු ලැබූ අතර 2000 වසරේ සිට එය වෙනම ආයතනයක් වශයෙන් ඉහත අරමුණ වෙනුවෙන් අදාල කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

03. මෙම තේ ඉඩම්වල හෝ එකී කර්මාන්ත ශාලාවල කෙරෙන නිෂ්පාදන අලෙවිය දියුණු කිරීම හෝ අලෙවි කිරීම භාරගැනීම.

    සංවර්ධන කාර්යයන් :-

    I. කුඩා තේ වතු හිමියන් දළු සපයන කම්හල්හි අමු දළු ගුණාත්මය වර්ධනය කිරීම.

    II. කුඩා තේ වතුවල නිෂ්පාදිත දළු අලෙවිය සඳහා කුඩා තේ වතු සංවර්ධන සමිති මෙහෙයවීම.

04. එකී ඉඩම් හා කර්මාන්ත ශාලා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වියහැකි පහසුකම් සහ සේවාවන් සපයාදීම හෝ ලබාදීම නැතහොත් එම පහසුකම් හා සේවාවන් ලබාදීම පහසු කිරීම සඳහා ද තේ ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීමෙහි හෝ ඇසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ගේ සුභසිද්ධිය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

    සංවර්ධන කාර්යයන් :-

    I. තේ පොහොර බෙදාහැරීම , වැවිලි ද්‍රව්‍ය , උපකරණ හා ප්‍රවාහන සේවා පහසුකම් ලබාදීම වැනි උපකාරක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

    II. ව්‍යාප්ති හා උපදේශක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

    III. තේ ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීමෙහි යෙදී සිටින්නන්ගේ සුභ සිද්ධිය සඳහා පියවර ගැනීම සහ සහායක සේවා පුළුල් කිරීමේ අරමුණින් කුඩා තේ වතු සංවර්ධන සමිති නීතිගත සංවිධාන වශයෙන් පිලිගැනීම පිණිස සමිති ලියාපදිංචි කිරීම සහ ඒවායේ කටයුතු පිළිබඳ රෙගුලාසි පැනවීම.

    IV. කුඩා තේ වතු සංවර්ධන සමිති ප්‍රජා මූලික සංවිධාන වශයෙන් ශක්තිමත් කිරීම සහ කුඩා තේ ඉඩම් හිමියන් තම ඉඩමේ අමතර ආදායම් ඉපයීමේ කටයුතු සඳහා යොමුකිරීම.

05. කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීමට සහ අධිකාරිය වෙත ලියාපදිංචි කර ඇති එවැනි සමිතිවල සාමාජිකයින්ට ආධාර ලබාදීම සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා රීති සෑදීමට විධිවිධාන සැලසීම.

    සංවර්ධන කාර්යයන් :-
    I. කුඩා තේ වතු සංවර්ධන සමිති ආයතනය විසින් ලියාපදිංචි කිරීම.
    II. කුඩා තේ වතු සංවර්ධන සමිති රීති සකස් කිරීම.

III. කුඩා තේ වතු සංවර්ධන සමිති සමස්ත ලංකා සංවිධානය පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය මූල්‍ය ආධාර හා සේවා සහ සහයෝගිතාව ලබාදීම.

IV. කුඩා තේ වතු සංවර්ධන සමිති සමස්ත ලංකා සංවිධානය පවත්වාගෙනයාම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම.

V. කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා අනෙකුත් ආධාර හා සේවා සහයෝගිතාව ලබාදීම.

06. කුඩා තේ වතුවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම.

සංවර්ධන කාර්යයන් :-

I. ආයතනික සහනාධාරවලට පරිබාහිර විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (කුඩා වැවිලි ව්‍යවසායකත්ව වැඩසටහන , දිවිනැගුම හා කුඩා තේ හා රබර් පුනර්ජීවන වැඩසටහන වැනි)

II. විශේෂිත ණය ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසාදීම (තේ සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය ණය අරමුදල් ක්‍රමය , ලංකා බැංකු විශේෂ ණය යෝජනා ක්‍රමය)

III. පොහොර ණයක්‍රමය ක්‍රියාත්මක කිරීම

IV. ආයතනික තේ තවාන් පවත්වාගෙන යාම

V. මව් වගා පවත්වාගෙන යාම

VI. වාණිජ තේ තවාන් ලියාපදිංචි කිරීම සහ දැනුම හා පුහුණුව ලබාදීම

VII. කාලීනව වැඩිවන ආයෝජන පිරිවැය අවම කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම

VIII. ජාතික ප්‍රතිපත්තිය වූ 2% තේ නැවත වගා අනුපාතිකය උපරිම මට්ටමින් රඳවාගැනීම පිණිස අවශ්‍ය කටයුතු කිරීම

07. දත්ත එකතු කිරීමට හා බෙදාහැරීමට බාර ගැනීම සහ කුඩා තේ වතුවල සංවර්ධන හැකියාව දැනගැනීම.

සංවර්ධන කාර්යයන් :-

I. කුඩා තේ ඉඩම් අංශය සඳහා සංගණන ක්‍රියාත්මක කිරීම තුලින් දත්ත හා තොරතුරු ලබාගැනීම.

II. කාලීනව සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම

III. කුඩා තේ ඉඩම් හිමියන් ලියාපදිංචි කිරීම.

IV. තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ මට්ටමින් පිරිවැය දත්ත සහ අදාල අනෙකුත් තොරතුරු ලබාගැනීම.

08. උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යාංශයට උපදෙස්දීම සහ වෙනත් අදාල නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.

සංවර්ධන කාර්යයන් :-

I. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය සමග පර්යේෂණ හා ව්‍යාප්ති සංසඳය හා අන්තර් ආයතන උපදේශක කමිටුව පවත්වාගෙනයාම.

**ක්‍රියාත්මක සැලැස්ම**

කුඩා තේ වතු අංශය සඳහා ප්‍රතිඵල පාදක කළමණාකරන ප්‍රවේශය තුලින් අරමුණු කරනු ලැබූ සංවර්ධන ප්‍රතිඵල සාක්ෂාත් කරගැනීම පිණිස 2017 වසර සඳහා සැකසූ ක්‍රියාත්මක සැලැස්ම වෙනුවෙන් ඇස්තමේන්තුගත සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 717.77 කි.

ක්‍රියාත්මක සැලැස්මේ සංවර්ධන ප්‍රාග්ධන පිරිවැයෙන් 78.65% ක් ඉඩම් සංවර්ධන කටයුතු සඳහා වෙන්කරන ලදි. ව්‍යාප්ති කටයුතු සඳහා 3.14% ක්ද ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීම සඳහා 0.52% ක්ද ආයතනික කටයුතු ශක්තිමත් කිරීම සඳහා 3.76% ක්ද නුවරඑළිය ග්‍රාමීය සංවර්ධන විශේෂ ව්‍යාපෘතිය සඳහා 13.93% ක්ද ඇස්තමේන්තුකර තිබුණි.

ජාතික අවශ්‍යතාවය පරිදි වාර්ෂික තේ නැවත වගා අනුපාතය 2% ක මට්ටමින් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය මත 2017 වසර සඳහා වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මේ තේ නැවත වගාව යටතේ හෙක්ටයාර් 840 උදුරා දැමීමටද, හෙක්ටයාර් 852 ක් පාංශු සංරක්ෂණය-1 සඳහා ද ,හෙක්ටයාර් 1020 ක් පාංශු සංරක්ෂණය-11 සඳහා ද, වගාව සඳහා හෙක්ටයාර් 1040 ක් ද, නඩත්තුව සඳහා හෙක්ටයාර් 750 ක් ද ආවරණය වන ලෙස සංවර්ධන ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 466.10 ක් තේ නැවත වගා දිරිදීමනා සඳහා වෙන් කරන ලදී. මෙයින් වසර අවසානය වනවිට රු.මිලි.460.59 ක් තේ නැවත වගා සහනාධාර වශයෙන් ගෙවීමට හැකිව තිබුණි.

**3.1 මධ්‍යකාලීන ප්‍රතිඵල පාදක ඉලක්ක හා කාර්යඵලය**

**මධ්‍යකාලීන ප්‍රතිඵල - 01**

**වසර 03 කදී වසරකට / හෙක්ටයාරයකට / සකස් කල තේ / කිලෝ පහත රට 2500 දක්වා ද මැදරට 1700 දක්වාද ඌව 1500 දක්වාද වැඩි කිරීම**

**3.1.1 වාර්ෂිකව 2% මට්ටමින් තේ නැවත වගාව පවත්වාගෙන යාම**

කුඩා තේ ඉඩම්වල තේ නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩිකිරීම පිණිස , අඩු අස්වනු සහිත පැරණි බීජ තේ ඉඩම්වල සහ වෙනත් හේතුමත නැවත වගා කිරීමට සිදුවන ඉඩම්වල අනුමත රිකිලි තේ නැවත වගා කරවීමට අනුබල ලබාදීම සඳහා තේ නැවත වගාකිරීම ක්‍රියාත්මක කෙරේ.

නැවත වගාවේදී දැරීමට සිදුවන අධික පිරිවැය සඳහා සහන සැලසීම පිණිස තේ නැවත වගාව සඳහා ලබාදෙනු ලැබූ සහනාධාර මුදල 2015 වසරේ සිට හෙක්ටයාරයකට රු.500000/- දක්වා වැඩිකර තිබේ.

2017 වසර සඳහා ආයතනයට ලද ප්‍රතිපාදනවලට අනුකූලව නැවත වගාවේ උදුරාදැමීම අදියර පිණිස 0.84% ප්‍රමාණයක් ඉලක්ක කිරීමට හැකිවූ අතර එයින් සාක්ෂාත්කරගත් ප්‍රතිශතය 0.90% කි. තේ නැවත වගාව අදියර සඳහා 1.04% ප්‍රතිශතයක් 2017 වසරේ ඉලක්ක කලද නැවත වගාවේ කාර්යඵල ප්‍රතිශතය 0.75% ක් වී තිබුණි.

තවද 2010 වසරේ ආරම්භ කරනු ලැබූ ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශය අනුව 2017 වසර අවසානය වනවිට කුඩා තේ ඉඩම්වල සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට සකස් කල තේ කිලෝ 1850 දක්වා වූ ඉලක්කය සකස් කල තේ කිලෝ 1995 දක්වා වැඩි වී තිබුණි. එසේ වුවද උපරිම නිෂ්පාදනය වාර්තා වූ 2014 වසරේ සාමාන්‍ය ඵලදායිතා අගය සකස් කල තේ කිලෝ 2123 ක් වී තිබුණි.

රූප සටහන් අංක - 07 A

තේ නැවත වගා සහනාධාර මුදල වැඩි කිරීම/ හෙක්ටයාරයකට




රූප සටහන් අංක - 07 B



### නැවත වගාව සඳහා අයදුම් කිරීම

තේ නැවත වගාව කිරීම පිණිස ගොවීන් 12530 දෙනෙකුගෙන් අයදුම්පත්‍ර ලබාගැනීම සඳහා 2017 ක්‍රියාත්මක සැලැස්ම මගින් ඉලක්ක කරනු ලැබීය. ඒ අනුව ගොවීන් 15567 දෙනෙකු නැවත වගාව සඳහා අයදුම් කර තිබුණි. එම සංඛ්‍යාවෙන් 12945 ක් සඳහා අවසරපත්‍ර නිකුත් කරනු ලැබිණි. තේ නැවත වගා ආධාර ක්‍රමය සඳහා අයදුම් කිරීම 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී 31% කින් වැඩිවී තිබුණි.

**රූප සටහන් අංක - 08**




### කාර්යඵලය

තේ නැවත වගාව සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම 17% කින් වැඩි වී ඇති අතර අවසරපත්‍රලාභීන් පැරණි තේ උදුරා දැමීමට අයදුම්කල හෙක්ටයාර ප්‍රමාණය 41% කින් පෙර වර්ෂයට සාපේක්ෂව අඩුවී ඇත.

2017 වර්ෂය තුලදී තේ නැවත වගා කිරීම සඳහා උදුරා දැමු හෙක්ටයාර ප්‍රමාණය 899 කි. එම ප්‍රමාණය වාර්ෂික ඉලක්කගත භූමි ප්‍රමාණයෙන් එනම් හෙක්ටයාර 840 න් 107% ක ප්‍රගතියකි. පෙර වර්ෂයට සංසන්දනාත්මකව උදුරා දැමීමේ ප්‍රතිශතය 13% කින් වැඩි වුවද බිම් ප්‍රමාණය හෙක්ටයාර 457 කින් අඩුවී ඇත. මෙම අඩු වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ කුඩා තේ හා රබර් පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ හෙක්ටයාර 1655 ක උදුරා දැමීමේ ඉලක්කයක් පිහිටුවීම හේතුවෙන් ආයතනික නැවත වගා උදුරා දැමීමේ ඉලක්කය හෙක්ටයාර 840 දක්වා පහත වැටීමයි. 2016 වර්ෂයේ උදුරා දැමීමේ ආයතනික ඉලක්කය හෙක්ටයාර 1450 ක් විය.

2017 වර්ෂයේ පස පුනරුත්ථාපනය නිම කරනු ලැබූ බිම් ප්‍රමාණය හෙක්ටයාර 1039 කි. 2016 වර්ෂයේ මෙම බිම් ප්‍රමාණය හෙක්ටයාර 868 කි. ඒ අනුව මෙය 2016 වර්ෂයට සාපේක්ෂව 20% ක වැඩිවීමකි. වර්ෂයේ පස පුනරුත්ථාපනයට ඉලක්කගත බිම් ප්‍රමාණය හෙක්ටයාර 1020 ක් වූ බැවින්, එහි කාර්යඵලය 102% ක ප්‍රගතියකි.

2017 වර්ෂයේ තේ නැවත වගාකල භූමි ප්‍රමාණය හෙක්ටයාර 748 ක් වූ අතර, ඉලක්කගත හෙක්ටයාර ප්‍රමාණය 1040 කි. ඒ අනුව 72% ක ප්‍රගතියක් වර්ෂය තුලදී ලබාගෙන ඇත. 2016 වර්ෂයට සාපේක්ෂව වගාකල හෙක්ටයාර ප්‍රමාණය 2% කින් වැඩිවී ඇත.

**වගු අංක 09**

## තේ නැවත වගා ආධාර ක්‍රමය
## 2016/2017 වර්ෂයේ භෞතික කාර්යඵලය (හෙක්ටයාර)

| කාර්යය | වර්ෂය | පහත් බිම් | | | | | උස්/ මැද බිම් | | | එකතුව | වාර්ෂික ඉලක්කය | පෙර වර්ෂය හා සැසඳීමේදී ප්‍රගතිය අඩු /වැඩි වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | | |
| 1. ලැබුණු ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව | 2016 | 2141 | 636 | 2811 | 2093 | 716 | 1254 | 814 | 938 | 11403 | 17340 | 18 |
| | 2017 | 3204 | 570 | 3505 | 2833 | 584 | 1795 | 1503 | 1573 | 15567 | 12530 | 37 |
| 2. නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව | 2016 | 2112 | 632 | 2752 | 1988 | 654 | 1164 | 794 | 980 | 11076 | 13895 | 23 |
| | 2017 | 2687 | 569 | 3133 | 2142 | 552 | 1534 | 1095 | 1233 | 12945 | 10662 | 17 |
| 3. අවසර පත්‍ර ආවරණ බිම් ප්‍රමාණය | 2016 | 508 | 192 | 571 | 486 | 179 | 305 | 158 | 198 | 2597 | 2215 | 14 |
| | 2017 | 618 | 196 | 680 | 591 | 154 | 361 | 225 | 229 | 3054 | 1265 | 18 |
| 4. බිම් සැකසීම | 2016 | 297 | 100 | 284 | 267 | 95 | 135 | 63 | 96 | 1356 | 1450 | 14 |
| | 2017 | 157 | 118 | 152 | 167 | 105 | 102 | 37 | 60 | 898 | 840 | (34) |
| 5. පස පුනරුත්ථාපනය - I වාරිකය | 2016 | 255 | 79 | 250 | 219 | 92 | 96 | 46 | 71 | 1108 | 1200 | 18 |
| | 2017 | 198 | 78 | 184 | 210 | 86 | 93 | 39 | 65 | 953 | 852 | (14) |
| 6. පස පුනරුත්ථාපනය - II වාරිකය | 2016 | 183 | 62 | 184 | 177 | 58 | 89 | 47 | 67 | 867 | 900 | 3 |
| | 2017 | 241 | 69 | 237 | 221 | 90 | 84 | 39 | 58 | 1039 | 1020 | 20 |
| 7. තේ නැවත වගා කිරීම | 2016 | 160 | 44 | 169 | 147 | 60 | 61 | 39 | 53 | 733 | 1000 | (9) |
| | 2017 | 163 | 47 | 166 | 134 | 68 | 71 | 38 | 61 | 748 | 1040 | 2 |
| 8. වසරකට පසු නඩත්තුව | 2016 | 181 | 50 | 195 | 155 | 48 | 67 | 43 | 72 | 811 | 950 | 0.4 |
| | 2017 | 139 | 41 | 159 | 111 | 58 | 62 | 28 | 57 | 655 | 750 | (19) |
| 9. ගෙවන ලද වගා ආධාර මුදල (රුපි. මිලියන) | 2016 | 106.92 | 34.85 | 106.62 | 96.77 | 34.20 | 46.89 | 23.50 | 38.13 | 487.88 | 546.00 | 16 |
| | 2017 | 100.97 | 36.59 | 94.36 | 91.40 | 44.22 | 43.79 | 19.49 | 29.77 | 460.59 | 466.10 | (5.6) |

**රූප සටහන් අංක - 09**




තේ නැවත වගා සහනාධාරලාභීන් සඳහා 2017 වසරේදී රුපියල් මිලියන 460.59 ක් ගෙවා තිබුණි. 2016 වර්ෂය හා සසඳනවිට ගෙවනු ලැබූ සහනාධාර මුදල රුපියල් මිලියන 27.29 කින් හෙවත් 5.6% කින් අඩු වී ඇත.

### 3.1.2 තේ අළුත් වගා ආධාර ක්‍රමය

ප්‍රතිපත්තිමය තිරණ මත 2003 වර්ෂයේ සිට අත්හිටවනු ලැබූ තේ අළුත් වගා ආධාර ක්‍රමය 2010 වර්ෂයේ සිට නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව විකල්ප භෝග හා ආදායම් මාර්ග නොමැති ප්‍රදේශ සඳහා සීමිත ප්‍රතිපාදන යටතේ තේ අළුත් වගාව කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරන ලදි. තේ අළුත් වගාව සඳහා අවසර පත්‍ර නිකුත් කරනු ලැබූ උපරිම බිම් ප්‍රමාණය අක්කර 01කි. 2015.01.01 දින සිට අළුත් වගා සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල හෙක්ටයාර් එකකට රුපියල් 400,000/- දක්වා වැඩිකර තිබේ.

**රූප සටහන් අංක - 10**




**කාර්යඵලය**

2017 වසරේදී තේ අළුත් වගාව සඳහා අයදුම්පත්‍ර 2508 ක් ලැබී තිබුණි. ඉලක්කගත ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව 2983 කි. ප්‍රතිපාදන සීමාව සැලකිල්ලට ගෙන 2324 දෙදෙනෙකු සඳහා අවසරපත්‍ර නිකුත් කරන ලදී.

හෙක්ටයාර 200 ක බිම් සැකසීම සඳහා වසරේ ඉලක්ක කල අතර හෙක්ටයාර 211 ක බිම් සැකසීම නිමකර තිබුණි. එනම් ඉලක්කයට අනුව ප්‍රගතිය 106% කි. වර්ෂය තුලදී තේ අළුත් වගාව සඳහා හෙක්ටයාර 200 ක් ඉලක්ක කර තිබූ අතර හෙක්ටයාර 202 ක තේ අළුත් වගාව නිමකර 101% ක ප්‍රගතියක් අත්කරගෙන තිබුණි.

2017 වසරේ තේ අළුත් වගාව වෙනුවෙන් ගෙවූ මුළු මුදල රුපියල් මිලියන 63.71 කි. 2016 වර්ෂයට සාපේක්ෂව ගෙවූ සහනාධාර මුදල 31% කින් වැඩිවී ඇත.

**වගු අංක 10**

## තේ අළුත් වගා ආධාර ක්‍රමය
## 2016/2017 වර්ෂයේ භෞතික කාර්යඵලය (හෙක්ටයාර්)

| කාර්යය | වර්ෂය | පහත් බිම් | | | | | උස් / මැද බිම් | | | එකතුව | ඉලක්ක | පෙර වර්ෂය හා සැසඳීමේදී අඩු/වැඩි වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | | |
| 1. ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | 2016 | 5 | 446 | 3 | 2 | 67 | 8 | 6 | 8 | 545 | 1515 | (88) |
| | 2017 | 283 | 457 | 391 | 219 | 582 | 243 | 230 | 103 | 2508 | 2983 | 128 |
| 2. නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව | 2016 | - | 450 | - | - | 0 | 1 | 1 | 6 | 458 | 1350 | (89) |
| | 2017 | 281 | 453 | 373 | 202 | 507 | 207 | 191 | 110 | 2324 | 1851 | 134 |
| 3. බිම් සැකසීම | 2016 | 4.9 | 75.0 | 2.6 | 3.6 | 12.6 | 1.6 | 1.3 | 1.7 | 103 | 127 | (79) |
| | 2017 | 25.7 | 41.7 | 36.9 | 22.4 | 53.7 | 13.5 | 10.7 | 6.4 | 211 | 200 | 69 |
| 4. වගාව | 2016 | 4.5 | 73.0 | 2.6 | 8.1 | 13.0 | 2.2 | 1.3 | 4.8 | 109 | 104 | (77) |
| | 2017 | 23.7 | 41.3 | 36.4 | 20.1 | 53.7 | 11.7 | 9.3 | 5.9 | 202 | 200 | 60 |
| 5. නඩත්තුව | 2016 | 40.8 | 109.0 | 48.6 | 90.0 | 63.3 | 13.0 | 3.5 | 10.7 | 378.9 | 269 | 25 |
| | 2017 | 19.6 | 51.2 | 8.1 | 29.8 | 7.8 | 1.7 | 0.11 | 4.8 | 123 | 166 | (102) |
| 6. ගෙවන ලද ආධාර මුදල (රුපි.මිලියන) | 2016 | 4.88 | 24.59 | 1.85 | 5.18 | 7.34 | 0.76 | 0.36 | 1.77 | 46.72 | 49.77 | (64) |
| | 2017 | 9.2 | 14.17 | 10.28 | 6.96 | 15.21 | 3.44 | 2.59 | 1.85 | 63.71 | 71.12 | 31 |

**රූප සටහන් අංක - 11**




- 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා තේ අළුත් වගා සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක නොවුනි.

### 3.1.3 භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය

ඒකක ඵලදායිතාවය වර්ධනය කිරීම අරමුණු කර දළු නෙලන රිකිලි තේ ඉඩම්වල නිර්දේශිත කප්පාදුව අනුගමනය කිරීමේදී පාළු සම්පූර්ණ කිරීම, පස සංරක්ෂණ ක්‍රම (කාණු පද්ධති/ගල් වැටි පිළිසකර කිරීම) හා සෙවන පාලනය කිරීම ඇතුළු අනෙකුත් වගා පිළිවෙත් ඒකාබද්ධව සිදු කිරීම (සෙවන, කප්පාදුව, වල්පැල නෙලීම) වෙනුවෙන් භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය යටතේ දිරි දීමනා ගෙවනු ලැබේ.

ඉදිරි වර්ෂ 10ක කාලයක් තුළ සාර්ථක ලෙස තේ වගාව පවත්වාගෙන යාහැකි ඉඩම් මෙම ආධාර ක්‍රමය සඳහා නිර්දේශ කරනු ලබන අතර , තේ ඉඩම් දෙවන කප්පාදු අවස්ථාවට එළඹ තිබීම හෝ වගාවේ වයස අවුරුදු 07 ඉක්මවා තිබීම , ආධාර ලබා ගැනීම සඳහා සුදුසුකම් වේ.

මෙම ආධාර ක්‍රමය යටතේ , සමූහ වශයෙන් පිහිටි පාළු සපයා දළු නෙලන තේ වගාව පුනරුත්ථාපනය කිරීමේ පදනම මත උඩරට/මැදරට අක්කරයකට පැල 1000ක් සහ පහතරට අක්කරයකට පැල 750ක උපරිමයකට යටත්ව රු.25/- බැගින් වාරික 2කදී ආධාර ගෙවීම කරනු ලැබේ.

**කාර්යඵලය**

2017 වර්ෂයේ භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය සඳහා 2770 දෙනෙකු අයදුම්කර තිබුණි. මෙම ප්‍රමාණයෙන් 2509 දෙනෙකු සඳහා අවසර පත්‍ර නිකුත් කරන ලදී. මෙය ඉලක්කගත අවසර පත්‍ර සංඛ්‍යාවෙන් 110% ක ප්‍රගතියකි. 2016 වසරට සාපේක්ෂව ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව 30% කින් වැඩි වී ඇති අතර නිකුත් කරනු ලැබූ අවසර පත්‍ර සංඛ්‍යාව 37% කින්ද වැඩිවී තිබුණි.

පළමු වාරිකය ගෙවනු ලැබූ පැල සංඛ්‍යාව 564145 කි. මෙය ඉලක්කගත පැල සංඛ්‍යාව වූ පැල 912500 න් 62% ක ප්‍රගතියකි. පෙර වර්ෂයට සාපේක්ෂව පළමු වාරිකය ගෙවූ පැල සංඛ්‍යාව 53% කින් වැඩිවී තිබේ.

දෙවන වාරිකය ගෙවූ පැල සංඛ්‍යාව 297068 කි. මෙය ඉලක්කගත පැල සංඛ්‍යාව වූ 360000න් 83% ක ප්‍රගතියකි. පෙර වර්ෂයට සාපේක්ෂව දෙවන වාරිකය ගෙවූ පැල සංඛ්‍යාව 20% කින් වැඩිවී තිබේ.

2017 වර්ෂයේදී භෝග පුනරුත්ථාපනය සඳහා සහනාධාර ලෙස රුපියල් මිලියන 11.7 ක් ගෙවා ඇත. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව 50% ක වැඩිවීමකි.

**වගු අංක 11**

## භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය
## 2016 - 2017 වර්ෂයේ භෞතික කාර්යඵලය (පැල සංඛ්‍යාව)

| කාර්යය | වර්ෂය | පහත් බිම් | | | | | උස් / මැද බිම් | | | එකතුව | ඉලක්ක | පෙර වර්ෂය හා සැසඳීමේදී අඩු/වැඩි වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගාල්ල | කළුතර | මාතර | රත්නපුර | කෑගල්ල | මහනුවර | නුවරඑළිය | ඌව | | | |
| 1. ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | 2016 | 131 | 67 | 338 | 181 | 374 | 680 | 185 | 170 | 2126 | 2868 | (22) |
| | 2017 | 271 | 154 | 432 | 237 | 350 | 639 | 512 | 175 | 2770 | 2690 | 30 |
| 2. නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව | 2016 | 129 | 67 | 323 | 122 | 291 | 551 | 159 | 187 | 1829 | 2626 | 27 |
| | 2017 | 266 | 155 | 408 | 198 | 307 | 585 | 399 | 191 | 2509 | 2277 | 37 |
| 3. ඉලක්කගත පැල සංඛ්‍යාව | 2016 | 40000 | 32000 | 85000 | 65000 | 65333 | 106000 | 50000 | 40000 | 483333 | 483333 | 73 |
| | 2017 | 100000 | 75000 | 90000 | 125000 | 110000 | 175000 | 137500 | 100000 | 912500 | 912500 | 89 |
| 4. පළමු වාරිකය ගෙවූ පැල සංඛ්‍යාව | 2016 | 25503 | 15383 | 80398 | 25657 | 59866 | 107246 | 26425 | 27398 | 367876 | 483333 | 19 |
| | 2017 | 54842 | 33697 | 86921 | 53617 | 104371 | 132371 | 55484 | 42842 | 564145 | 912500 | 53 |
| 5. දෙවන වාරිකය ගෙවූ පැල සංඛ්‍යාව | 2016 | 21870 | 14920 | 36913 | 32438 | 19989 | 90779 | 9450 | 19980 | 246339 | 323000 | 23 |
| | 2017 | 34240 | 26768 | 60623 | 22830 | 42250 | 76969 | 12217 | 21171 | 297068 | 360000 | 20 |
| 6. ගෙවන ලද ආධාර මුදල (රුපි.මිලියන) | 2016 | 0.928 | 0.379 | 1.59 | 0.777 | 0.851 | 2.269 | 0.351 | 0.651 | 7.800 | 10.48 | 21 |
| | 2017 | 1.193 | 0.772 | 1.82 | 1.050 | 2.320 | 2.744 | 0.969 | 0.833 | 11.701 | 17.29 | 50 |

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

**රූප සටහන් අංක - 12**




**ගුණාත්මක තේ පැල සැපයීම**

**වැඩි දියුණු කල නව තේ ප්‍රභේද සහිත මව් වගා**

තේ නිෂ්පාදනය හා ඵලදායීතාව වර්ධනය කර ගැනීම සඳහා ගුණාත්මක බවින් යුත් රෝපණ ද්‍රව්‍ය කුඩා තේ වතු හිමියන්ට ලබාගැනීමට පහසුකම් සලසාලීම මව් තවාන් පවත්වාගෙන යාමේ අරමුණ වේ.

ඒ අනුව වැඩි දියුණු කල ප්‍රභේද සහිත ගුණාත්මක බවින් යුත් මව් වගාවන් ආයතනය විසින් පවත්වා ගනිමින් කුඩා තේ වතු හිමියන්ට, වාණිජ තේ තවාන්කරුවන්ට සහ ආයතනයේ තේ තවාන් සඳහා අතු 261,417 සැපයීමට කටයුතු කරන ලදි. මෙම ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව 2% කින් වැඩි වී තිබේ. මව් වගා මගින් රිකිලි අතු නිෂ්පාදනයේ වාර්ෂික ඉලක්කය 343,600 ක් විය. ඒ අනුව 76% ක ප්‍රගතියකි. මව් වගා මගින් වැඩි දියුණුකල රිකිලි අතු නිකුතුව පිළිබඳ සවිස්තර තොරතුරු උපලේඛන අංක 8-A හි දක්වා ඇත.

**වාණිජ තේ තවාන්**

තේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීම අරමුණු කර ගුණාත්මක පැල කුඩා තේ වතු හිමියන් වෙත ලබාගැනීමට පහසු කරවීම සඳහා ගුණාත්මක බවින් යුත් වාණිජ තේ තවාන් ආයතනයේ ලියාපදිංචි තේ තවාන් වශයෙන් පවත්වාගෙන යාම හා අධීක්ෂණය කිරීම අරමුණ වේ.

ඒ අනුව වසර 2016/2017 සඳහා ප්‍රාදේශිය කාර්යාල මගින් වාණිජ තේ තවාන් 487 ක් ලියාපදිංචි කරන ලදී. එම තවාන්හි පැල ධාරිතාවය පැල මිලියන 19.15 කි. මෙයින් තවාන් 380 ක පළමු පරීක්ෂණය මගින් පැල මිලියන 6.29 ක් ද, තවාන් 264 ක පැල මිලියන 4.3 ක් සඳහා දෙවන පරීක්ෂණයද, තවාන් 71 ක පැල මිලියන 1.12 ක් සඳහා තෙවන පරීක්ෂණය මගින් ද නිර්දේශ ලබාදී තිබුණි.

2017/2018 වර්ෂය සඳහා වාණිජ තේ තවාන් 449 ක් වසර අවසානය වන විට ලියාපදිංචි කර තිබුණි. අපේක්ෂිත පැල ධාරිතාවය මිලියන 20.3 කි. තවාන් 41 ක පළමු පරීක්ෂණය අවසන්කර තිබුණි.

එම තවාන් වල සහතික කරනු ලැබූ පැල සංඛ්‍යාවන්හි සවිස්තර තොරතුරු උපලේඛන අංක $8\text{-}C_1$ හා $8\text{-}C_2$ මගින් දැක්වේ.

වගු අංක 12

**වාණිජ තේ තවාන්**
**අවසරපත් නිකුතුව සහ පැල ධාරිතාවය**
**(2016 / 17) - සහ (2017 / 18)**

| දිස්ත්‍රික්කය | නිකුත් කල අවසරපත් ගණන | | පැල ධාරිතාවය (මිලියන) | |
|---|---|---|---|---|
| | 2016/17 | 2017/18 | 2016/17 | 2017/18 |
| ගාල්ල | 101 | 114 | 3,921,250 | 6,044,470 |
| මාතර | 143 | 187 | 4,201,000 | 6,209,000 |
| කළුතර | 23 | 35 | 1,614,000 | 1,665,000 |
| රත්නපුර | 30 | 24 | 3175200 | 1,453,000 |
| කෑගල්ල | 12 | 20 | 870,000 | 1,425,000 |
| මහනුවර | 93 | 53 | 3,428,000 | 2,968,000 |
| නුවරඑළිය | 11 | 8 | 527,000 | 312,000 |
| ඌව | 74 | 8 | 1,409,000 | 220,000 |
| **එකතුව** | **487** | **449** | **19,145,450** | **20,296,470** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

**ආයතනික තේ තවාන්**

කුඩා තේ වතු හිමියන්ට අවශ්‍ය තේ පැල මිලදී ගැනීමේදී වෙළඳපල මිල ගණන් පාලනය කර ගැනීම හා ගුණාත්මක පැල නිෂ්පාදනය පවත්වාගෙන යාම ආදර්ශයක් ලෙස පැවතිය යුතුවීම ආයතනික තේ තවාන් හි අරමුණු වේ.

ඒ අනුව 2016/17 නිරිත දිග හා ඊසාන දිග වගා කන්න සඳහා තවාන් 08 මගින් රිකිලි තේ පැල 1,227,856 ක් නිෂ්පාදනය කරන ලදි. අලෙවිකරනු ලැබූ සමස්ත පැල සංඛ්‍යාව 961,856 කි. තවාන් මට්ටමින් පැලයක අලෙවි මිල උපලේඛණ අංක 8 -B හි දක්වා ඇත.

පැලයක ඇස්තමේන්තුගත සාමාන්‍ය පිරිවැය රුපියල් 17.73 ක් වුවද පැලයක සැබෑ සාමාන්‍ය පිරිවැය රුපියල් 15.61 කි. ඇතැම් තවාන් වල ඇස්තමේන්තුගත පිරිවැයට වඩා සත්‍ය පිරිවැය අඩුවීමිද, ඇතැම් තවාන් වල එම පිරිවැය වැඩිවී ද තිබුණි.

**3.1.4 ව්‍යාප්ති හා උපදෙස් පුහුණු වැඩසටහන්**

සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාප්ති හා පුහුණු උපදෙස් වැඩසටහන් 7044 සැලසුම් කරන ලදි. එම වැඩසටහන් සඳහා ඉලක්කගත ගොවීන් සංඛ්‍යාව 179859 කි.

කුඩා තේ ඉඩම්වල නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීම පිණිස 2017 වසරට සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් ගණන 5807 ක් වූ අතර, වැඩසටහන් 5575 ක් ක්‍රියාත්මක කිරීමට හැකිවිය. ඒ අනුව ඉලක්කය පරිදි වැඩසටහන් ප්‍රගතිය 96% කි. ඉලක්ක කරන ලද ගොවි සහභාගීත්වය 134860 කි. සහභාගී වූ ගොවි සංඛ්‍යාව 144897 ක් වී තිබේ.

**වගු අංක 13 - i**

**ව්‍යාප්ති හා උපදේශ සේවා - ඵලදායිතා වර්ධනය**
**පුහුණු වැඩසටහන් සංඛ්‍යාව-(1) සහ සහභාගී සංඛ්‍යාව-(2)**

| ප්‍රා.කාර්යාලය | ගාල්ල | | මාතර | | කළුතර | | රත්නපුර | | කෑගල්ල | | මහනුවර | | නුවරඑළිය | | ඌව | | **එකතුව** | | **ඉලක්කය** | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | **1** | **2** | **1** | **2** |
| **වැඩසටහන** | | | | | | | | | | | | | | | | | | | | |
| අවසර පත්‍ර හිමියන් දැනුවත් කිරීමේ පුහුණුව | 54 | 1689 | 67 | 2338 | 36 | 988 | 56 | 2040 | 64 | 1960 | 124 | 3055 | 43 | 1308 | 32 | 649 | **476** | **14027** | **228** | **5599** |
| යෙදවුම් තවාන් සඳහා පුහුණුව | 22 | 412 | 21 | 447 | 15 | 140 | 14 | 203 | 10 | 135 | 22 | 172 | 11 | 129 | 5 | 58 | **120** | **1696** | **151** | **1429** |
| වාණිජ තවාන්කරුවන් පුහුණුව | 19 | 283 | 15 | 306 | 9 | 29 | 20 | 387 | 11 | 195 | 24 | 184 | 5 | 69 | 8 | 140 | **111** | **1593** | **141** | **1101** |
| තේ නැවත වගාව පිළිබඳ පුහුණුව | 62 | 1765 | 75 | 1970 | 36 | 1095 | 50 | 1226 | 27 | 544 | 47 | 884 | 31 | 659 | 26 | 699 | **354** | **8842** | **331** | **7037** |
| අලුත් වගාව සඳහා අවසර පත්‍ර හිමියන් පුහුණු කිරීමේ වැඩසටහන් | 17 | 325 | 49 | 1070 | 23 | 508 | 13 | 252 | 11 | 188 | 11 | 172 | 18 | 317 | 8 | 316 | **150** | **3148** | **232** | **4122** |
| දළු නෙලීම පිළිබඳ පුහුණුව | 174 | 4375 | 141 | 3717 | 118 | 2541 | 193 | 4618 | 78 | 1998 | 126 | 2553 | 73 | 1798 | 87 | 2215 | **990** | **23815** | **1089** | **23206** |
| යන්ත්‍ර භාවිතය පිළිබඳ පුහුණුව | 20 | 606 | 22 | 1162 | 15 | 462 | 18 | 536 | 14 | 462 | 20 | 795 | 10 | 315 | 18 | 720 | **137** | **5058** | **144** | **7200** |
| යන්ත්‍ර ක්‍රියාකිරීම සම්බන්ධ පුහුණුව | 4 | 29 | 4 | 131 | 4 | 22 | 4 | 72 | 2 | 25 | 8 | 287 | 1 | 0 | 3 | 295 | **30** | **861** | **10** | **144** |
| කප්පාදුව පිළිබඳ පුහුණුව | 96 | 2160 | 111 | 3045 | 66 | 1431 | 104 | 2332 | 63 | 1574 | 105 | 2511 | 52 | 1079 | 69 | 1991 | **666** | **16123** | **721** | **21955** |
| කප්පාදු හැකියා වර්ධන පුහුණුව | 27 | 530 | 26 | 765 | 18 | 298 | 36 | 779 | 11 | 228 | 28 | 542 | 19 | 400 | 12 | 655 | **177** | **4197** | **155** | **2770** |
| භෝග පුනරුත්ථාපනය සඳහා අවසර පත්‍ර හිමියන් පුහුණු කිරීමේ වැඩසටහන් | 19 | 357 | 21 | 431 | 8 | 141 | 11 | 218 | 9 | 254 | 9 | 168 | 14 | 348 | 7 | 324 | **98** | **2241** | **144** | **2500** |
| පාංශු කළමණාකරණය පිළිබඳ පුහුණුව | 161 | 4996 | 154 | 4306 | 97 | 2696 | 115 | 3415 | 69 | 1438 | 134 | 4573 | 44 | 1069 | 106 | 3307 | **880** | **25800** | **974** | **21155** |
| සෙවන ස්ථාපනය හා කළමණාකරනය පිළිබඳ පුහුණුව | 106 | 3106 | 111 | 2843 | 69 | 1569 | 114 | 2886 | 82 | 1822 | 135 | 3065 | 44 | 1112 | 76 | 2043 | **737** | **18446** | **803** | **18192** |
| පෝශක කළමණාකරණය පිළිබඳ පුහුණුව | 49 | 1739 | 110 | 2903 | 74 | 2174 | 122 | 3686 | 77 | 1995 | 111 | 3178 | 46 | 1242 | 60 | 2133 | **649** | **19050** | **684** | **18450** |
| **එකතුව** | **830** | **22372** | **927** | **25434** | **588** | **14094** | **870** | **22650** | **528** | **12818** | **904** | **22139** | **411** | **9845** | **517** | **15545** | **5575** | **144897** | **5807** | **134860** |

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

කුඩා තේ ඉඩම්වල නිෂ්පාදනය හා ඵලදායිතාවය වර්ධනය කරගැනීමට අදාලව තේ ඉඩම්වල පාංශු ආම්ලිකතාව විධිමත් ආකාරයෙන් පවත්වාගත යුතු බැවින්, ඒ සඳහා වාර්ෂිකව පාංශු ආම්ලිකතාව පරීක්ෂණය සඳහා පස් සාම්පල 65810 පහත පරිදි පරීක්ෂා කිරීම සඳහා ඉලක්ක කර තිබූ අතර වර්ෂය තුල පස් සාම්පල 55138 ක් (83.78%) පරීක්ෂා කර තිබුණි.

**වගු අංක 13 -ii**

**ඒක පුද්ගල ව්‍යාප්ති කටයුතු හා පාංශු පරීක්‍ෂණ සංඛ්‍යාව**

| **ප්‍රාදේශීය කාර්යාලය** | | **ගාල්ල** | **මාතර** | **කළුතර** | **කෑගල්ල** | **මහනුවර** | **නුවරඑළිය** | **රත්නපුර** | **ඌව** | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| පාංශු | ඉලක්කය | 11500 | 10000 | 6500 | 5000 | 8300 | 4000 | 12500 | 8010 | **65810** |
| පරීක්ෂාව | ප්‍රගතිය | 7208 | 10084 | 5796 | 5078 | 7583 | 4007 | 8012 | 7370 | **55138** |
| ඒක | ඉලක්කය | 6900 | 6000 | 3900 | 3000 | 4500 | 2200 | 7500 | 3200 | **37200** |
| පුද්ගල ව්‍යාප්ති | ප්‍රගතිය | 6388 | 6108 | 4141 | 3121 | 3779 | 2204 | 4785 | 2847 | **33373** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

**මධ්‍යකාලීන ප්‍රතිඵල - 02**

**වසර 3 කදී කම්හල් මට්ටමින් අමු දළු ගුණාත්මය 65% දක්වා වර්ධනය කිරීම**

කුඩා තේ වතු හිමියන්ගේ ආදායම වර්ධනය කරවීමට නම් වැඩි ඵලදාවක් සමග අවම නිෂ්පාදන පිරිවැය හා ඉහල වෙළඳපල මිල ඉතා වැදගත් සාධක වේ. නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා ජාතික පොහොර සහනාධාර ක්‍රමය මගින් අඩු මිලට පොහොර ලබාගැනීමට ගොවීනට හැකිවී ඇති නමුදු , අමු දළු සඳහා ඉහල වෙළඳපල මිල ලබාගැනීම සඳහා ගුණාත්මක බවින් යුතු අමු දළු නිෂ්පාදනය වර්ධනය විය යුතු වේ.

දළු ගුණාත්මය වර්ධනය කිරීම සඳහා දළු නෙලන්නන් 12107 ක් පුහුණු කරවීමත්, ගුණාත්මක දළු පමණක් කම්හල් සඳහා භාර ගැනීම අනිවාර්ය කෙරෙන නීති රීති පද්ධතීන් ප්‍රවර්ධනය කිරීමත්, දළු සපයන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, සහ දළු ගුණාත්මය පිළිබඳ කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීම යන කටයුතු මෙම ප්‍රතිඵලය ලබාගැනීම සඳහා අපේක්ෂිත ක්‍රියාකාරකම් විය. ඒ අනුව 2017 වසරේදී දළු ගුණාත්මය වර්ධනය කිරීම පිණිස පුහුණු වැඩසටහන් 1093 ක් සැලසුම් කරනු ලැබූ අතර වැඩසටහන් 989 ක් ක්‍රියාත්මක කර ඇත. (වගු අංක 14) සහභාගී ගොවීන් සංඛ්‍යාව 40332 වූ අතර ඉලක්කගත ගොවීන් සංඛ්‍යාව 43265 කි. මේ අනුව සහභාගීත්වයේ ප්‍රගතිය 93% කි.

වගු අංක 14

**දළු ගුණාත්මය වර්ධන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සහ සහභාගී ගොවි සංඛ්‍යාව-2017**

| ප්‍රාදේශිය කාර්යාලය | අයිතමය | දළු නෙලන්නන් පුහුණුව (2.2.2) | දළු සපයන්නන් දැනුවත් කිරීම පිළිබඳ පුහුණුව (2.3.4) | දළු ගුණාත්මය පිළිබඳ පුහුණුව (2.5.1) | එකතුව |
|---|---|---|---|---|---|
| ගාල්ල | වැඩසටහන් | 80 | 47 | 43 | 170 |
| | සහභාගිත්වය | 1914 | 2916 | 4816 | 9646 |
| මාතර | වැඩසටහන් | 89 | 52 | 40 | 181 |
| | සහභාගිත්වය | 1990 | 2833 | 2964 | 7787 |
| කළුතර | වැඩසටහන් | 42 | 13 | 25 | 80 |
| | සහභාගිත්වය | 990 | 344 | 1166 | 2500 |
| කෑගල්ල | වැඩසටහන් | 41 | 10 | 18 | 69 |
| | සහභාගිත්වය | 949 | 291 | 763 | 2003 |
| මහනුවර | වැඩසටහන් | 80 | 25 | 41 | 146 |
| | සහභාගිත්වය | 1567 | 1061 | 1524 | 4152 |
| නුවරඑළිය | වැඩසටහන් | 37 | 16 | 15 | 68 |
| | සහභාගිත්වය | 1004 | 714 | 868 | 2586 |
| රත්නපුර | වැඩසටහන් | 90 | 43 | 30 | 163 |
| | සහභාගිත්වය | 2412 | 2614 | 2084 | 7110 |
| ඌව | වැඩසටහන් | 53 | 27 | 32 | 112 |
| | සහභාගිත්වය | 1281 | 1535 | 1732 | 4548 |
| එකතුව | වැඩසටහන් | 512 | 233 | 244 | 989 |
| | සහභාගිත්වය | 12107 | 12308 | 15917 | 40332 |
| ඉලක්කය | වැඩසටහන් | 585 | 221 | 287 | 1093 |
| | සහභාගිත්වය | 10932 | 17325 | 15008 | 43265 |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

අපේක්ෂිත ප්‍රතිඵල මැනීම සඳහා කම්හල් මට්ටමින් හොඳ දළු ප්‍රතිශතය යන දර්ශකය යොදාගනු ලබන අතර, එම ප්‍රතිඵල සාර්ථකත්වය පිණිස අධිකාරිය මෙන්ම ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි, තේ කොමසාරිස් අංශය හා ශ්‍රී ලංකා තේ පර්යේෂණායතන සමග ඒකාබද්ධ ප්‍රයත්නයක් යොදමින් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

සමස්ත වශයෙන් ව්‍යාප්ති උපදෙස් හා පුහුණු වැඩසටහන් සඳහා රුපියල් මිලියන 12.695 ක්ද, පුහුණු ද්‍රව්‍ය සඳහා රුපියල් මිලියන 659.76 ක්ද, ප්‍රදර්ශන/ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා රුපියල් මිලියන 16.56 ක්ද වනසේ රුපියල් මිලියන 16.56 ක් වැයකර තිබුනි.

**මධ්‍යකාලීන ප්‍රතිඵල - 03**

**වසර 03 ක් තුළ ප්‍රජා මූලික සංවිධාන 50% කින් ශක්තිමත් කිරීම**

1989 වර්ෂයේ අග භාගයේදී ආරම්භ කරනු ලැබූ කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රමය නීතිගත සංවිධාන බවට පත් කිරීම සඳහා 1991 අංක 36 දරණ පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරණ කුඩා තේ වතු සංවර්ධන පනතෙහි 15 වන වගන්තියේ 2 වන උප වගන්තියේ (ඔ ඕ) ඡේදය යටතේ පැවරී ඇති බලතල අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් අංක 878/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1995 අංක 01 දරණ කුඩා තේ වතු සංවර්ධන සමිති රීති ප්‍රකාශයට පත්කර තිබේ.

2017 වසර අවසානය වන විට කුඩා තේ වතු සංවර්ධන සමිති 1435 ක් ලියාපදිංචිව තිබූ අතර, එයට අයත් සාමාජිකයන් සංඛ්‍යාව 329778 ක් විය. ඒ අනුව 2016 වසරට සාපේක්ෂව 2017 වර්ෂයේ සමිති සංඛ්‍යාව 2.3% කින් වර්ධනය වී තිබුණි.

දිස්ත්‍රික් සංවිධාන 08 කින් යුතුව සමස්ත ලංකා සමිති සංවිධානයකින් යුතුව සමිති පද්ධතිය ක්‍රියාත්මක වේ. 2015 වසරේ සියලු සමිති සංවිධාන වල සහ සමස්ත ලංකා සංවිධානයේ නිලවරණයන්ද පවත්වන ලදි.

**වගු අංක 15 - i**

**කුඩා තේ වතු සංවර්ධන සමිති ව්‍යාප්තිය**
2016/2017

| කාර්යාලීය බල ප්‍රදේශය | සමිති සංඛ්‍යාව | | සාමාජික සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | **2016** | **2017** | **2016** | **2017** |
| රත්නපුරය | 285 | 290 | 97,197 | 98,281 |
| ඌව (බදුල්ල සහ මොණරාගල) | 162 | 165 | 26,907 | 25,804 |
| නුවරඑළිය | 117 | 120 | 13,758 | 13,083 |
| මහනුවර සහ මාතලේ | 218 | 220 | 23,332 | 22,696 |
| ගාල්ල | 209 | 210 | 64,179 | 62,557 |
| මාතර සහ හම්බන්තොට | 180 | 190 | 59,770 | 56,480 |
| කෑගල්ල | 132 | 135 | 20,334 | 21,152 |
| කළුතර | 100 | 105 | 34,529 | 29,725 |
| **එකතුව** | **1,403** | **1,435** | **340,006** | **329,778** |

**රූප සටහන් අංක - 13**




මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී අලුතෙන් ලියාපදිංචි සමිති සංඛ්‍යාව 32 කින් වර්ධනය වී ඇති අතර සමිති සාමාජිකත්වය ලබා ගැනීම 3% කින් (10228) අඩුවී ඇත. පොහොර සහනාධාර ක්‍රමය, පාංශු ආධාර ක්‍රමය වැනි සමිති හරහා ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් ප්‍රමාණය අඩුවීම, සාමාජිකත්වය යාවත්කාලීන කිරීම කෙරෙහි ඇතැම් කුඩා තේ වතු හිමියන් උනන්දු නොවීම ආදී කරුණු සාමාජිකත්වයේ අඩුවීමක් පෙන්නුම් කිරීමට හේතු වී ඇති බවට නිරීක්ෂණය වේ.

කුඩා තේ වතු සංවර්ධන සමිති වඩාත් සවිලදායි ලෙස ක්‍රියාත්මක වීම ශක්තිමත් කිරීම සඳහා 2017 වසරේදී කුඩා තේ වතු සංවර්ධන සමිතිවල ප්‍රධාන නිලධාරීන් සඳහා විවිධ පුහුණු වැඩසටහන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි පහත පරිදි පවත්වන ලදී. සමස්ත වශයෙන් ප්‍රජා මූලික සංවිධාන ශක්තිමත් කිරීම සඳහා ආයතනය විසින් රුපියල් මිලියන 3.047 ක් වැයකර තිබුණි.

**වගු අංක 15- ii**

**<u>කුඩා තේ වතු සංවර්ධන සමිතිවල ප්‍රධාන නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය-2017</u>**

| පුහුණුව | වැඩසටහන් ගණන |
|---|---|
| සමිති 1403 ක ගරු භාණ්ඩාගාරිකවරුන් සඳහා සියළු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි උප කාර්යාල මට්ටමින් සමිති ගිණුම් කටයුතු විධිමත්ව පවත්වාගැනීම පිළිබඳ පුහුණුව | 26 |
| මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ දැනුවත් කිරීම | 06 |
| ආකල්ප සංවර්ධන පුහුණුව | 06 |
| අලුතින් ලියාපදිංචි කරන ලද සමිති 50ක ගරු සභාපති, ලේකම්, හා භාණ්ඩාගාරික නිලධාරීන් සඳහා NIPM ආයතනයේදී දින 3ක නේවාසික පුහුණු වැඩසටහන් පැවැත්වීම | 03 |

ඉහත පුහුණු වැඩසටහන් වලට අමතරව සමිති ක්‍රියාකාරීත්වය වර්ධනය කිරීම උදෙසා පහත කාර්යයන් 2017 වර්ෂයේදී සිදුකරන ලදී.

- සමිති අතර දැනුම හා අත්දැකීම් හුවමාරු කරගැනීමේ අන්තර් දිස්ත්‍රික් චාරිකා වැඩසටහන රත්නපුර/කළුතර තෝරාගත් සමිති නිලධාරීන් 50 දෙනෙකු ඌව ප්‍රදේශයේ සමිති නිරීක්ෂණ චාරිකාවක නිරත කරවීම.
- සමිති ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය සඳහා පියවර ගැනීම.
- කාර්යක්ෂම සමිති කළමණාකරනය පිළිබඳ අත්පොත පිටපත් 1500ක් මුද්‍රණය කර සමිති අතර බෙදාදීමට පියවර ගැනීම.
- සියලුම ලියාපදිංචි සමිති ශ්‍රේණිගත කිරීමට පියවර ගැනීම.

**මධ්‍යකාලීන ප්‍රතිඵල 04**

**වසරක් තුල වඩාත් සඵලදායි ලෙස ක්‍රියාත්මක වීම සඳහා ආයතනය ශක්තිමත් වීම**

ආයතනයේ අභිමතාර්ථ පරිදි කුඩා තේ ඉඩම් සංවර්ධන කාර්යය ප්‍රමුඛතාව ගනු ලබන අතර එයින් වාර්ෂික තේ නැවත වගා ප්‍රතිශතය එක් විශේෂිත කාර්ය සාධන දර්ශකයක් වේ. 2017 වසරේ තේ නැවත වගා ප්‍රතිශතය 1.04% ක් සඳහා ඉලක්ක කලද , සාක්ෂාත් ප්‍රතිශතය 0.75% කි. ඒ සඳහා මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය 100% ඉලක්ක කලද , සාක්ෂාත් කරගත් ප්‍රගති ප්‍රතිශතය 98% කි.

කාර්යමණ්ඩල පුරප්පාඩු වාර්ෂිකව 5% කට වඩා අවම මට්ටමින් පවත්වාගෙන යාම කෙටිකාලීන ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ අපේක්ෂාව වුවද , 2017 වසර අවසානය වන විට කාර්යමණ්ඩල පුරප්පාඩු ප්‍රතිශතය 9.67 ක් විය.

ආයතනය අපේක්ෂිත විගණන මතය අනනුසිමිත වුවද , 2017 සාක්ෂාත් කරගත් විගණන මතය ............... මතය විය.

රාජකාරි කටයුතු සඳහා ආයතනික කාර්යමණ්ඩලයේ ධනාත්මක ආකල්ප ඇතිකර ගැනීමට ආයතනයේ විවිධ ශ්‍රේණීන් නියෝජනය වන ලෙස අභ්‍යන්තර මෙන්ම බාහිර පුහුණු වැඩසටහන් සඳහාද කාර්යමණ්ඩලය සහභාගී කරවීමට වසර තුලදී කටයුතු කර ඇත.

කාර්යපාදක ඇගයීම් ක්‍රමය ක්ෂේත්‍ර කාර්යමණ්ඩලය සඳහා 2017 වසරේ ක්‍රියාත්මක වූ අතර,ඒ සඳහා වූ වියදමද ඇතුලුව සමස්ත වශයෙන් ආයතනය ශක්තිමත් කිරීමේ කටයුතු වෙනුවෙන් අදාල වසර තුලදී රුපියල් මිලියන 15.45 ක් වැයකර තිබුණි.

**මධ්‍යකාලීන ප්‍රතිඵල 05**

**වසර 03 ක් තුලදී ඉඩම්වලින් 10% ක් අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමු කරවීම.**

කුඩා තේ ඉඩම් හිමියන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම සඳහා අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමුකරවීම හඳුනාගෙන තිබේ. මේ අනුව තේ පාදක ගොවිපල කළමණාකරණ ක්‍රමය වාර්ෂිකව තේ ඉඩම් 1000 ක් සඳහා හඳුන්වාදීමත්, කුඩා තේ ඉඩම් 1000 ක වන වගා වගාකරවීමත් මේ යටතේ හඳුනා ගන්නා ලද කෙටි කාලීන ප්‍රතිඵලයකි. මේ යටතේ අදාල වර්ෂය තුලදී වැඩසටහන් 144 ක් සැලසුම් කරනු ලැබූ අතර වැඩසටහන් 116 ක් ක්‍රියාත්මක කර තිබේ. ඒ සඳහා ඉලක්කගත ගොවීන් සංඛ්‍යාව 1734 ක් වූ අතර සහභාගී වූ ගොවීන් ගණන 2856 කි. අදාල වර්ෂයේදී පහත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

**වගු අංක 16**

**තේ පාදක ගොවිපල පුහුණුව (5.1.4)**
**වැඩසටහන් සංඛ්‍යාව හා සහභාගී ගොවි සංඛ්‍යාව-2017**

| | ප්‍රාදේශීය කාර්යාලය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **ගාල්ල** | **මාතර** | **කළුතර** | **කෑගල්ල** | **මහනුවර** | **නුවරඑළිය** | **රත්නපුර** | **ඌව** | **එකතුව** |
| **වැඩසටහන්** | | | | | | | | | |
| ඉලක්කය | 23 | 20 | 13 | 11 | 25 | 11 | 25 | 16 | **144** |
| ප්‍රගතිය | 19 | 18 | 9 | 13 | 22 | 8 | 19 | 8 | **116** |
| **සහභාගීත්වය** | | | | | | | | | |
| ඉලක්කය | 230 | 200 | 174 | 220 | 250 | 250 | 250 | 160 | **1734** |
| ප්‍රගතිය | 472 | 327 | 277 | 298 | 501 | 261 | 409 | 311 | **2856** |

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

ඉහත සඳහන් ප්‍රතිඵල මැනීම පිණිස කුඩා තේ ඉඩම්වල අනෙකුත් භෝග පවත්නා ප්‍රතිශතය ප්‍රධාන කාර්යපාදක දර්ශකය වශයෙන් හඳුනාගෙන තිබේ.

**3. 2 කුඩා තේ ඉඩම්වල ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති කටයුතු**

**3.2.1 කුඩා තේ වතු සඳහා තේ පොහොර වෙනුවෙන් රාජ්‍ය මූල්‍ය සහනාධාරය**

හෙක්ටයාර එකක් හෝ ඊට වඩා අඩු වගා බිම් ප්‍රමාණයක් හිමි කුඩා තේ වතු හිමියන්ට පමණක් තේ පොහොර සඳහා රාජ්‍ය මූල්‍ය සහනාධාරය ලබාදීම 2016/2017 වසර තුල සිදුකෙරුණි. ඒ අනුව තේ වගාකල ඉඩම් හෙක්ටයාර එකක උපරිමයට රු.15000/- ක මූල්‍ය සහනාධාරයන් ලබාගත හැකිවිය. ඒ අනුව සමාලෝචිත 2017 වර්ෂය මෙම තේ පොහොර මූල්‍ය සහනාධාර ක්‍රමයේ වාර්ෂික ප්‍රගතිය පහත පරිදි විය.

**වගු අංක 17**

**<u>තේ පොහොර සහනාධාර ප්‍රගතිය - 2017</u>**

| **ප්‍රාදේශිය කාර්යාලය** | **දිස්ත්‍රික්කය** | **මුළු මුදල රු.මිලි** | **මුළු ප්‍රතිලාභින්** | **බිම් ප්‍රමාණය හෙක්.** |
|---|---|---|---|---|
| ගාල්ල | ගාල්ල | 173.734 | 27003 | 11582.3 |
| මාතර | මාතර සහ හම්බන්තොට | 154.251 | 23724 | 10283.4 |
| රත්නපුර | රත්නපුර | 287.732 | 39980 | 19182.2 |
| මහනුවර | මහනුවර ,මාතලේ සහ කුරුණෑගල | 36.318 | 5607 | 2421.2 |
| නුවරඑළිය | නුවරඑළිය | 5.899 | 1107 | 393.3 |
| ඌව | බදුල්ල සහ මොණරාගල | 45.376 | 7957 | 3025.1 |
| කෑගල්ල | කෑගල්ල සහ ගම්පහ | 100.217 | 16328 | 6681.1 |
| කළුතර | කළුතර සහ කොළඹ | 100.365 | 18007 | 6691 |
| එකතුව | | **903.894** | **139713** | **60259.6** |

**3.2.2 කුඩා තේ වතු හිමියන් සඳහා වන ලංකා බැංකු විශේෂ ණය යෝජනා ක්‍රමය**

ලංකා බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉහත සඳහන් ණය යෝජනා ක්‍රමය සඳහා 2013 වර්ෂයේ ඔක්තෝම්බර් මස කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ණය ගිවිසුම අත්සන් කරනු ලැබිය.

තේ වගා කරන සියළු දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරනු ලබන මෙම ණය ව්‍යාපෘතිය මගින් අක්කර 01 ක උපරිම බිම් ප්‍රමාණයකට යටත්ව රුපියල් ලක්ෂ 05 ක උපරිමය දක්වා තේ නැවත වගාව , තේ අළුත් වගාව , තේ තවාන් පිහිටුවීම සහ අමතර ආදායම් උත්පාදන කටයුතු සඳහා ප්‍රධාන සංවර්ධන කාර්ය සඳහා කාලින සහනදායි පොලි අනුපාතිකයක් යටතේ බැංකුව ණය මුදල් සපයනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට කුඩා තේ වතු හිමියන් 750 ක් සඳහා රු.මිලියන 248.51 ප්‍රමාණයක් සඳහා ආයතනය විසින් ණය නිර්දේශ ලබාදී තිබුණි. මෙම ප්‍රමාණයෙන් තේ ගොවින් 527 දෙනෙකු සඳහා රුපියල් මිලියන 174.896 ක් නැවත වගාව සඳහාද , රුපියල් මිලියන 41.595 ක් තේ ගොවින් 117 දෙනෙකු සඳහා තේ තවාන් සංවර්ධනයටද , රුපියල් මිලියන 30.198 ක් ගොවින් 97 දෙනෙකු සඳහා තේ අලුත් වගාව වෙනුවෙන්ද ණය නිර්දේශ ලබාදී තිබුණි.

### 3.2.4 කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය : (2016 - 2021) (Smallholders Tea & Rubber Revitalization (STaRR) Project)

රුපියල් මිලියන 8052 ක සමස්ථ ආයෝජනය සහිත මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය රු.මිලියන 4259 ක්ද , IFAD ආයතනය රු.මිලියන 3349 ක්ද , ඇතුලු සංයුතියකින් සමන්විතව ක්‍රියාත්මක කරන මෙම ව්‍යාපෘතියේ කුඩා තේ වතු අංශය සඳහා වන ආයෝජන පිරිවැය රුපියල් මිලියන 5777 කි. එනම් සමස්ත ආයෝජනයෙන් 69% ක් කුඩා තේ වතු අංශය සඳහා වෙන්ව තිබේ.

ව්‍යාපෘතියේ සමස්ථ අරමුණ වනුයේ ව්‍යාපෘති දිස්ත්‍රික්ක වල ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම හා ආදායම් වර්ධනය කර කුඩා වතු හිමියන් සවිබල ගැන්වීමයි. කුඩා තේ වතු අංශය සඳහා ගාල්ල , මාතර , මහනුවර , නුවරඑළිය , රත්නපුර , බදුල්ල යන දිස්ත්‍රික්ක 6 ක් සඳහා මෙම ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව කුඩා තේ වතු අංශය පහත ප්‍රධාන අරමුණු ඔස්සේ සංවර්ධනය කිරීමට යෝජිතය.

එනම් , තේ දළු නිෂ්පාදනය හා අලෙවිය සම්බන්ධව කුඩා තේ වතු සංවර්ධන සමිති ශක්තිමත් කිරීම , තේ දළු වෙළඳපල මඟින් මෙහෙයවනු ලබන නිෂ්පාදන සහාය , සහ කුඩා තේ වතු හිමියන් සඳහා ආදායම් හා වෙළඳපළ විවිධාංගීකරණයයි. කුඩා තේ වතු හෙක්ටයාර 5500 ක ප්‍රමාණයක් තේ නැවත වගාව කිරීමත් , එම තේ ඉඩම්වල 15% ප්‍රතිශතයක් දක්වා පාලු සැපයීමද ඉලක්ක කර තිබේ. මෙයට අමතරව කුඩා තේ වතු සංවර්ධන සමිති 200 ක් ආශ්‍රිතව කාන්තා සහභාගිත්වයද තහවුරු කරමින් සමිති වල නිෂ්පාදන ධාරිතාව වර්ධනය කිරීම , කුඩා තේ වතු හිමියන් සඳහා තාක්ෂණ සහාය ලබාදීම , තේ තවාන් වගාකරුවන් සඳහා පුහුණුව , තේ වගා ප්‍රදේශ වල කි.මී.90 ක ගොවිපල මාර්ග ප්‍රතිසංස්කරණය , කුඩා තේ වතු හිමියන්ට තම ආයෝජන සඳහා බැංකු ණය ලබාගැනීමේ හැකියාව වර්ධනය කිරීම/ පහසුකම් සැලසීම , යන ව්‍යාපෘති කටයුතු මඟින් කුඩා තේ වතු අංශය සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

2017 වසරේ කුඩා තේ ඉඩම් හෙක්ටයාර 1655 ක් තේ නැවත වගා කිරීම සඳහා උඳුරා දැමීමට ඉලක්ක කරන ලදි. (උපලේඛන අංක 12)

### 3.2.5 දිළිඳුකම පිටුදැකීමේ විශේෂ ව්‍යාපෘතිය

**වගු අංක 18**

**දිළිදුකම පිටුදැකීමේ විශේෂ ව්‍යාපෘතිය -2017 ප්‍රගතිය**

| ප්‍රාදේශිය කාර්යාලය | අපේක්ෂිත ප්‍රතිලාභීන් සංඛ්‍යාව | බිම් ප්‍රමාණය (හෙක්.) | නිකුත්කල අවසරපත්‍ර සංඛ්‍යාව | ගෙවීම් කරන ලද අවසර පත්‍ර සංඛ්‍යාව | අවසරදුන් බිම් ප්‍රමාණය (හෙක්) | දිරිදීමනා ගෙවීම | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | බිම් සැකසීම (හෙක්.) | වගාව (හෙක්.) |
| ගාල්ල | 84 | 6 | 67 | 52 | 7.7548 | 2.3089 | 1.9035 |
| මාතර | 98 | 7 | 73 | 34 | 8.288 | 3.1721 | 3.1721 |
| මහනුවර | 140 | 10 | 98 | 27 | 9.6795 | 3.139 | 2.0563 |
| නුවරඑළිය | 126 | 9 | 122 | 71 | 10.5633 | 4.7326 | 4.7326 |
| ඌව | 112 | 8 | 60 | 23 | 4.9029 | 1.6845 | 1.4316 |
| රත්නපුර | 140 | 10 | 107 | 14 | 11.00 | 1.0219 | 0.4908 |
| කෑගල්ල | 140 | 10 | 122 | 93 | 8.8693 | 6.2301 | 6.2301 |
| කළුතර | 140 | 10 | 125 | 86 | 9.8891 | 6.5531 | 6.5531 |
| **එකතුව** | **980** | **70** | **774** | **400** | **70.9469** | **28.8422** | **26.5701** |

පසුගිය වර්ෂයේ තේ වගා කරන බොහෝ ප්‍රදේශවලට බලාපොරොත්තු වූ වර්ෂාව නොලැබීම හා අනපේක්ෂිත ගංවතුර තත්වයන් හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශය තුල තේ පැල තවාන් හානියට පත්වීමෙන් ගොවීන් බිම් සැකසීම නිමකලද තේ පැල හිඟවීම නිසා වගාව නිමකිරීමට නොහැකිවීමෙන් ඉලක්කගත බිම් ප්‍රමාණය වගා කිරීම ප්‍රමාදවන බවට නිරීක්ෂණය වී ඇත.

### 3.2.6 ග්‍රාමීය සංවර්ධන විශේෂ ව්‍යාපෘතිය - නුවරඑළිය දිස්ත්‍රික්කය

උඩරට පළාතේ කුඩා තේ වතු හිමියන් සඳහා ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘතිය යටතේ කුඩා තේ ගොවීන් සඳහා ඔවුන්ගේ තේ ඉඩම්වල පාංශු හා ජල කළමනාකරණය විධිමත්ව පවත්වාගෙන යාම සඳහා රුපියල් මිලියන 100ක් වැයකර කෘෂි උපකරණ වශයෙන් උදලු, මුල්ලු, අලවංගු, කප්පාදු පිහි, දියර ඉසින යන්ත්‍ර, වතුර මෝටර, වතුර ටැංකි හා වතුර බට ලබාදෙන ලදී.

### 3.2.7 ගංවතුර සහනාධාර බෙදාදීම

2017 වර්ෂයේ මැයි මස අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් ඇති වූ ගංවතුර හා නායයෑම් වලින් විපතට පත් කුඩා තේ වතු හිමියන් සඳහා වන්දි වශයෙන් රුපියල් මිලියන 225.606 ක් ලබාදෙන ලදී. රත්නපුර, කළුතර, මාතර හා ගාල්ල යන දිස්ත්‍රික්ක සඳහා වන්දි වශයෙන් ලබාදෙන ලද මුදල් පහත වගුවේ දැක්වේ.

**වගු අංක 19**

| ප්‍රාදේශීය කාර්යාලය | කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව | හානි වූ බිම් ප්‍රමාණය (හෙක්.) | වෙන් කරන ලද මුදල (රු.මිලි) | ගෙවන ලද මුදල | |
|---|---|---|---|---|---|
| | | | | ප්‍රතිලාභීන් | මුදල (රු.මිලි.) |
| රත්නපුර | 3782 | 311.2 | 112.9 | 1963 | 43.944 |
| කළුතර | 3155 | 692.5 | 94.9 | 1358 | 45.001 |
| මාතර | 4080 | 739.2 | 99.6 | 3691 | 38.885 |
| ගාල්ල | 6213 | 549.4 | 109.6 | 5704 | 97.768 |
| **එකතුව** | **17230** | **2292.2** | **417.0** | **12716** | **225.598** |

### 3.2.8 තේ වගා රක්ෂණය

රටේ සමස්ත තේ නිෂ්පාදනයෙන් 75.5% ක දායකත්වයක් දක්වන කුඩා තේ වතු හිමි ප්‍රජාවට ස්වාභාවික හෝ වෙනත් ආපදා මගින් තම වගාවන්ට සිදුවන හානි හේතුවෙන් සිදුවන අලාභය අවම කර ගැනීමේ අරමුණින් රක්ෂණ සමාගමක් සමග ඒකාබද්ධව තේ වගා රක්ෂණ ක්‍රමයක් 2017 වසර තුල හඳුන්වා දෙන ලදී. මෙමගින් හානියට පත් වූ හෙක්ටයාරයක වගා බිම් ප්‍රමාණයක් සඳහා රුපියල් මිලියන 1.2 ක රක්ෂණ වන්දියක් ගෙවීමට කටයුතු සූදානම් කර ඇත.

## වගු අංක 20
## 3.3 සංවර්ධනාත්මක ප්‍රතිඵල සඳහා කළමණාකරණය
## ප්‍රධාන කාර්යය පාදක දර්ශකය

| | මධ්‍යකාලීන ප්‍රතිඵල | ප්‍රධාන කාර්යය සාධන දර්ශක | අපේක්ෂිත | මූල්‍ය ප්‍රගතිය | පාදක වර්ෂය 2008 | කාර්යය පාදක දර්ශක ඉලක්ක හා ප්‍රගතිය 2017 | | විශේෂිත කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ඉලක්කය | ප්‍රගතිය | |
| | දිගුකාලීන ප්‍රතිඵලය | I කුටුම්භ ඒකක වත්කම් වර්ධනයවීමේ ප්‍රතිශතය | | | | | | සමාජ ආර්ථික සමීක්ෂණ |
| | කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්වය නංවාලීම | II ළමුන්ගේ ද්විතීය අධ්‍යාපන ප්‍රතිශතය | | | NA | | NA | |
| 1 | වසර 03 කදි වසරකට / හෙක්ටයාරයකට/ | 1.1.දිස්ත්‍රික් මට්ටමින් සහ උච්චත්ව මට්ටමින් ඒකක ඵලදායිතාව වර්ධනයවීම | 685.89 | 623.12 | | | | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සංඛ්‍යාන දත්ත |
| | සකස්කල තේ කිලෝ ප්‍රමාණය වැඩි කිරීම, | | | | | | | |
| | පහත රට 2500 දක්වා | | | | 2085 | 2300 | 2134 | |
| | මැද රට 1700 දක්වා | | | | 1050 | 1500 | 1343 | |
| | ඌව 1500 දක්වා | | | | 1055 | 1300 | 1438 | |
| | | 1.2කුඩා තේ ඉඩම් වල නිෂ්පාදනය වර්ධනය වීම(කි.මිලි) | | | 215 | 250 | 232 | |
| 2 | වසර 03 කදි කම්හල් මට්ටමින් අමු දළු ගුණාත්මය 60% දක්වා වර්ධනය කිරීම | 2.1.කම්හල් මට්ටමින් හොඳ දළු ප්‍රතිශතය | 0.55 | 0.94 | 35% | 52% | | ශ්‍රී ල.තේ.ම. තේ කොමසාරිස් අංශයේ දත්ත |
| | | | | | | | | |
| 3 | වසර 03 ක් තුල ප්‍රජා මූලික සංවිධානවලින් 50% ක් ශක්තිමත් කිරීම | 3.1.වත්කම් වටිනාකම වර්ධනය වීම | 3.74 | 3.05 | NA | 20% | | සමාජ ආර්ථික සමීක්ෂණ සංගණනය |
| | | 3.2.හඳුනාගත් කාර්යන් මෙහෙයවන සමිති සංඛ්‍යාව | | | 100 | 400 | | |
| | | 3.3.සාවල්‍යතාවයන් සම්බන්ධයෙන් සාමාජික ආකල්ප | | | NA | | | |
| 4 | වසරක් තුල වඩාත් සඵලදායි ලෙස ක්‍රියාත්මකවීම සඳහා ආයතනය ශක්තිමත් කිරීම | 4.1.ඉලක්ක සපුරාලීමේ ප්‍රතිශතය | 27.00 | 15.446 | | 100% | | |
| | | තේ නැවත වගා ආධාර ක්‍රමය | | | | | | |
| | | a. මූල්‍ය | | | 102% | 100% | 0.98% | |
| | | b. භෞතික | | | 92% | 100% | 0.75% | |
| | | 4.2.විගණන මතය | | | සත්‍ය හා සාධාරණ | | | ............................. |
| | | 4.3.අයවැයෙන් අපගමන ප්‍රතිශතය (සංවර්ධන ප්‍රාග්ධන) | | | 13% | | | |
| | | 4.4.ආයතනයේ සාපල්‍යතාවය සම්බන්ධයෙන් කාර්යය මණ්ඩලයේ ආකල්ප | | | NA | | | |
| 5 | වසරක් 03 ක් තුලදි ඉඩම්වලින් 10% ක් අමතර ආදායම් ඉපයීමේ කටයුතු සඳහා යොමුකරවීම | 5.1.අනෙකුත් භෝග ඇති ඉඩම් ප්‍රතිශතය | 0.59 | 0.54 | 35% | | | සමාජ ආර්ථික සමීක්ෂණ සංගණන |
| | | පශු පාලන ඇති ඉඩම් ප්‍රතිශතය | | | NA | | | |
| | **මුළු එකතුව** | | **717.77** | **643.09** | | | | |

# 04. කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිළ

4.1. ශ්‍රම පිරිවැය

4.2. අමු දළු කිලෝවක නිෂ්පාදන පිරිවැය

4.3. නිෂ්පාදන ආන්තිකය හා මිල

4.4. තේ නැවත වගා කිරීමේ පිරිවැය

4.5. හෙක්ටයාර් එකක් සඳහා වු දිරිදීමනා අනුපාතිකය සහ වගා පිරිවැය

## කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිළ

### 4. 1 ශ්‍රම පිරිවැය

කුඩා තේ ඉඩම් අංශයෙහි තත්වයන් පිළිබඳ ක්ෂේත්‍ර මට්ටමින් ලබාගන්නා වාර්ෂික තොරතුරු අනුව කුඩා තේ ඉඩම් අංශයේ දළු නෙලීම , කප්පාදුව, වල්පැල නෙලීම ආදිය සඳහා ශ්‍රමික හිගයද දෛනික වේතන මට්ටම සලකා බැලීමේදී පඩි පාලක සභා ආඥා පනතට අනුව ගෙවීමට නියමිත වේතන මට්ටමට වඩා වැඩි මුදලක් ගෙවනු ලැබීම බව අනාවරණය වන කරුණු වේ. තවද ප්‍රාදේශිය වශයෙන්ද වේතන මට්ටමේ විෂමතාවයන් වාර්තා වන අවස්ථා බොහෝය. ඒ අනුව බොහෝවිට සංවිධානාත්මක නොවන කුඩා තේ ඉඩම් අංශයේ දෛනික කම්කරු වේතන මට්ටම , සංවිධානාත්මක කුඩා තේ ඉඩම් අංශයේ වේතන මට්ටමට වඩා වැඩි අගයක් ශ්‍රමයේ මිල වශයෙන් වාර්තාවී තිබුණි.

තවද දළු නෙලීම සඳහා ශ්‍රමිකයන්ට ගෙවීම් කිරීමේදී නෙලන ලද දළු කිලෝ ප්‍රමාණය මත කුලි ගෙවීම , දෛනිකව නෙලූ දළු ප්‍රමාණයේ සාමාන්‍යය ඉක්මවන විට කිලෝවකට අමතර මිලක් ගෙවීම වැනි අවස්ථාද , කප්පාදුව වැනි පුහුණු ශ්‍රමික කාර්යයන් සඳහා දළු නෙලීමේ දෛනික කුලියට වඩා ඉහල දෛනික කුලියක් ගෙවනු ලබන බවද වාර්තා වී තිබේ.

### 4. 2 අමු දළු කිලෝවක නිෂ්පාදන පිරිවැය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දත්ත පරිදි පිහිටීම මත කොළඹ තේ වෙන්දේසියේ ලද මිළ (උපලේඛන අංක 09-A) පරිදි ගණනය කරනු ලැබූ අමු දළු කිලෝවක ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය සහ දළු කිලෝවක සාමාන්‍ය මිළ පහත සඳහන් වේ.

**වගු අංක 21**

**අමු දළු කිලෝවකට ලැබුණු මිළ හා නිෂ්පාදන පිරිවැය 2006 - 2017**

| වර්ෂය | සාමාන්‍ය මිල (කි.1 ට රුපි) | සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය (කි.01ට රුපි) |
|---|---|---|
| 2006 | 29.18 | 21.87 |
| 2007 | 40.88 | 30.64 |
| 2008 | 45.45 | 36.24 |
| 2009 | 52.71 | 37.24 |
| 2010 | 54.11 | 38.56 |
| 2011 | 52.63 | 44.43 |
| 2012 | 57.27 | 49.50 |
| 2013 | 64.99 | 51.40 |
| 2014 | 67.54 | 54.54 |
| 2015 | 58.80 | 55.08 |
| 2016 | 68.53 | 64.52 |
| 2017 | 90.69 | 71.65 |

**රූප සටහන් අංක - 14**




2017 වර්ෂයේදී දළු කිලෝවක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා වසරකට හෙක්ටයාර් එකකට සාමාන්‍ය අස්වනු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 9918 ක් (පහතරට රිකිළි තේ)

ලෙස සලකා ගණනය කර ඇත. (ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිෂ්පාදන දත්ත පරිදි) 2016 වර්ෂයේදී මෙම සාමාන්‍ය අස්වනු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 9226 ක් විය.

සමුච්චිත මිළ පාදකව සකස් කිරීම අනුව 2016 වර්ෂය හා සසඳන විට 2017 දී දළු කිලෝවක් සඳහා ගෙවා ඇති සාමාන්‍ය මිළ රු. 22.16 කින් එනම් 32.33% කින් ඉහළ ගොස් තිබුණි. ඇස්තමේන්තු ගත නිෂ්පාදන පිරිවැය රුපියල් 6.8 කින් වැඩිවී තිබේ. 2017 වසරේ නිෂ්පාදන පිරිවැය ඉහලයාම අවම කිරීම හෙක්ටයාර 10 අඩු කුඩා තේ වතු හිමියන් සඳහා හෙක්ටයාර 1 කට රු.15000/- පොහොර සහනාධාරයන් සඳහා ජාතික පොහොර සහනාධාරය ලබාදෙමින් සමස්ත නිෂ්පාදන පිරිවැයේ පොහොර පිරිවැය ප්‍රතිශත මට්ටම අඩු කර ගැනීමට කටයුතු කර ඇත.

**2017 වර්ෂයේ පැවැති දළු මිළ හා ඇස්තමේන්තුගත පිරිවැය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දත්ත පරිදි (උපලේඛන අංක 9-A) සියළුම උච්චත්වයන් සඳහා නිම් තේ කිලෝවක සාමාන්‍ය මිල 2016 වර්ෂයට වඩා 2017 වසරේදී ඉහළ ගොස් තිබුණි.

2017 වර්ෂයේ උඩරට අමු තේ දළු කිලෝවකට ගෙවන ලද මිල රු.65.78 සිට 88.71 දක්වාද මැදිබිම් සඳහා ගෙවනු ලැබූ මිල රු.82.75 දක්වාද ඉහළ ගොස් තිබුණි. පහත් බිම් සඳහා ගෙවනු ලැබූ මිල රු.71.18 සිට රු.93.29 දක්වාද සමස්ත සාමාන්‍ය මිළ දළු කිලෝවකට රු.68.53 සිට රු.90.69 දක්වාද වැඩිවී තිබුණි.

**4. 3 නිෂ්පාදන ආන්තිකය හා මිල**

2017 වර්ෂයේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය නිෂ්පාදන ඵලදායිතාව, වර්ෂයේ පැවැති සාමාන්‍ය දළු මිල හා ඇස්තමේන්තු ගත පිරිවැය අනුව නිෂ්පාදන ආන්තිකයේ සාමාන්‍ය රුපියල් 19.04 කි. 2016 වර්ෂයේ මෙය 3.76 කි. ඒ අනුව 2016 වර්ෂයට සංසන්දනාත්මකව නිෂ්පාදන ආන්තිකය 15.28 කින් වැඩිවී තිබුණි.

**4. 4 තේ නැවත වගා කිරීමේ පිරිවැය**

ශ්‍රම ඌනතාවය මත තේ නැවත වගා කිරීම සඳහා දැරිය යුතුවන කම්කරු පිරිවැය ඉහල මට්ටමක පැවතිම , පොහොර සහනාධාරයක් ආවරණය වන මුලය සහනාධාර ප්‍රමාණය අඩුවීම , වගා පිරිවැය කෙරෙහි විශේෂයෙන් බලපා ඇති සාධක වේ. මුළු පිරිවැයෙන් 83% ක ප්‍රමාණයක් ශ්‍රම පිරිවැය වශයෙන් දැරීමට සිදුව ඇති බව ඇස්තමේන්තු පරිදි අනාවරණය වේ. (උපලේඛන අංක 10A හා B) පොහොර මිශ්‍රණ භාවිතයේදී දැරීමට සිදුවූ පිරිවැයෙන් හෙක්ටයාර එකකට රු.15000/- මුදලක් ජාතික පොහොර සහනාධාර වැඩසටහන යටතේ 2017 වසරේදී ලබාගත හැකිවිය.

| **ශුද්ධ වත්කම්** | | | **119,635** | | **326,535** |
| **ශුද්ධ වත්කම්/ සමකොටස්** | | | | | |
| රජය මගින් ලබා දුන් ප්‍රාග්ධනය | 01A | 105,316 | | 93,291 | |
| **ප්‍රත්‍යාගණන අතිරික්ත** | 01B | 124,109 | | 124,109 | |
| **සමුච්චිත අතිරික්ත / (ඌණතා)** | | (169,801) | 59,624 | (40,267) | 177,133 |
| ප්‍රදාන | 01C | | 60,010 | | 64,469 |
| සංවර්ධන වියදම් නඳහා රජයේ ප්‍රදාන | | | | | 84,934 |
| **මුළු ශුද්ධ වත්කම්/ සම කොටස්** | | | **119,635** | | **326,535** |

03 සිට 04 දක්වා පිටුවල දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 07 සිට 24 දක්වා පිටුවල දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් තබා ඇත.

| දේශබන්ධු විජේරත්න දෙවගෙදර | කේ.එල්.ගුණරත්න | ඩී.ජී.මහීපාල | ඩී.පී.ඩී.ජයන්ති |
|---|---|---|---|
| (සභාපති) | (අධ්‍යක්ෂ) | (සාමාන්‍යාධිකාරි) | (මූල්‍ය කළමනාකරු) |

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**2017 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

**(රු.'000)**

| | සටහන් අංකය | | 2017 | | 2,016 |
|---|---|---|---|---|---|
| **රජයේ ප්‍රදාන** | | | | | |
| සංවර්ධන ප්‍රාග්ධනය | | | 518,927 | | 561,868 |
| පුනරාවර්තක | | | 329,453 | | 335,200 |
| | | | | | 897,068 |
| **වෙනත් ආදායම්** | 15 | | 848,380 | | |
| පොළී F/D | | 2,799 | | | |
| පොළී C/D | | 5,695 | | 2,306 | |
| සේවකයන්ට ලබාදුන් ණය පොළී | | 3,286 | | 3,547 | |
| තේ කෙෂ්ත්‍ර සහ මව් පඳුරු අතිරික්ත (ඌණතා) | 17 | (207) | | (1,285) | |
| විවිධ ආදායම් | | 3,180 | | 3,465 | |
| පැල තවාන් අතිරික්ත (ඌණතා) | 18 | 3,327 | | 1,041 | |
| හන්තාන වියදම් මත ආදායම | 15 A | 2,118 | 20,198 | 2,845 | 11,918 |
| | | | 868,578 | | 908,986 |
| **සංවර්ධන වියදම්** | 12 | | | | |
| සහනාධාර | | (608,037) | | (542,521) | |
| ව්‍යාප්ති | | (16,562) | | (6,795) | |
| සමාජ සංවර්ධනය | | (3,047) | | (3,307) | |
| ආයතන සංවර්ධනය | | (15,446) | | (9,245) | |
| | | | (643,092) | | (561,868) |
| **මෙහෙයුම් වියදම්** | 13 | | | | |
| පුද්ගල පඩිනඩි | | | | | |
| වැටුප් දීමනා/ සේ.අ./සේ.නියු.අර යනාදිය. | | (254,350) | | (244,542) | |
| අතිකාල/ අඩ වැටුප් | | (4,172) | | (4,761) | |
| ප්‍රවාහන | | (9,424) | | (9,506) | |
| සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ | | (4,878) | | (3,598) | |
| නඩත්තු | | (21,342) | | (21,176) | |
| සන්නිවේදන | | (8,340) | | (5,847) | |
| කුලී, වරිපනම් හා විදුලිය | | (6,196) | | (6,354) | |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (28,195) | | (19,159) | |
| **මුළු මෙහෙයුම් වියදම්** | | | (336,896) | | (314,943) |
| **මෙහෙයුම් කටයුතු අතිරික්ත/ (ඌණතා)** | | | (111,410) | | 32,175 |
| පාරිතෝෂික | | (8,331) | | (13,716) | |
| ක්ෂය වීම් හා ක්‍රමක්ෂය | | (22,102) | | (24,233) | |
| බොල් ණය ප්‍රතිපාදන/ කපා හැරි ණයකරුවන් | | 1,222 | | (716) | |
| අවිනිශ්චිත අවස්ථා සඳහා ප්‍රතිපාදන | | (2,352) | (31,563) | (600) | (39,265) |
| | | | (142,973) | | (7,090) |
| දේපළ අංගන හා පිරියත අළෙවියෙන් ලැබූ ලාභය | | | | | |
| IFAD හා වෙනත්- පුනරාවර්තන ප්‍රදාන | 14 | 1,133,467 | | 1,335,091 | |
| පුනරාවර්තන වියදම් | | (1,133,467) | 0 | (1,335,091) | 0 |
| අතිවිශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ අතිරික්තය/(ඌණතාවය) | | | (142,973) | | (7,090) |
| පෙර වසර ගැලපුම් | | | | | |
| විලම්භිත ආදායම | | | 13,440 | | 10,413 |
| **කාල සීමාව තුළ ශුද්ධ අතිරික්තය/(ඌණතාවය)** | | | **(129,533)** | | **3,323** |

# මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන්

## (1) ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 පොදු

### 1.1.1 ගිණුම්කරණ මූලධර්ම

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන සැකසෙනුයේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සම්පාදිත ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවයි. එකී ගිණුම් වලට බලපෑම් කරනු ලබන උද්ධමනීය සාධක සඳහා ගැලපුම් කිසිවක් සිදු කොට නොමැත. එකී ගිණුම් වලට සිදු කරන ලද ගැලපුම් සම්බන්ධයෙන් පහත සටහන් වලට විස්තර කොට ඇත.

**1.1.2 පශ්චාත් ශේෂ පත්‍ර සිද්ධීන්**

ශේෂ පත්‍ර දිනයට පසුව සිදුවන ලද සියලුම ද්‍රව්‍යාත්මක සිදුවීම් සලකා බලා ඇති අතර අවශ්‍ය ස්ථානයන් හි දී ගිණුම් තුල ගැලපීම් සිදු කර ඇත.

**1.1.3 සංසන්දනීය අගයන්**

සංසන්දනාත්මක අගයන් වලට සිදු කරන ලද වෙනස්කම් ස්ථිර කරන ලදුව අවශ්‍ය ස්ථානයන් හි වෙනස්කම් සිදු කොට ඇත.

**1.1.4 අති විශේෂ අයිතම**

පොහොර, ප්‍රැති - සකසන ලද වාහන ණය ආදී ඇතැම් ණය කරුවන් මූල්‍ය වර්ෂය තුල ගෙවා අවසන් කොට ඇත. එබැවින් 2017 වර්ෂයේදී අතිරික්තව ලබාගත් ප්‍රමාණය වන රු. 1,222,147 ගලපා ඇත.

පියවා නොමැති බවට හඳුනාගත් එහෙත් පියවා ගැනීමේ ක්‍රියාවලියේදී සම්පූර්ණ ලැබිය යුත් ප්‍රමාණයෙන් කොටසක් වන බවට හඳුනාගත් ප්‍රමාණය බොල් ණය ලෙස නැවත සකසා ඇත. උක්ත දක්වන ලද්ද විස්තරාත්මක ස්වරූපයෙන් පහතින් දක්වා ඇත.

| ණය ආයු කාලය | ප්‍රතිපාදනය |
|---|---|
| වසරකට අඩු | නැත |
| වසරකට වැඩි හා වසර දෙකක් දක්වා | 10% |
| වසර දෙකකට වැඩි හා වසර තුනක් දක්වා | 30% |
| වසර තුනකට වැඩි හා වසර පහක් දක්වා | 50% |
| වසර පහකට වැඩි | 100% |

(2) වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ මූලධර්ම

2.1 දේපල අංගන හා පිරියත

පිරිවැයෙන් සමුච්චගත ක්ෂය වීම්වලින් අඩු කොට ශේෂ පත්‍රය තුළ දේපළ, අංගන හා පිරියත දක්වා ඇත. ක්ෂයවීම් දක්වා ඇත්තේ පහත අනුපාතයන් භාවිතා කරමින් ඍජු රේඛීය පදනමකින් ප්‍රත්‍යාගණනය කිරීමෙනි.

| | |
|---|---|
| ගොඩනැගිලි | 2% |
| මෝටර් වාහන | 20% |
| ගෘහභාණ්ඩ, සවිකිරීම් හා කාර්යාල උපකරණ | 12.5% |
| පරිගණක | 20% |
| යන්ත්‍රෝපකරණ | 20% |

ක්ෂය වීම් ප්‍රතිපත්තිය වෙනස් වීම හේතුවෙන් අත්පත් කරගත් නව වත්කම් අත්පත් කරගත් දිනයේ සිට ක්ෂය කරනු ලැබීය.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව, සම්පූර්ණයෙන්ම ක්ෂය වීම් වලට භාජනය වී වත්කම් 07ක් තවමත් භාවිතයේ පවතී. එබැවින්, තක්සේරු දෙපාර්තමේන්තුවෙහි සහාය ඇතිව ප්‍රති - තක්සේරුකරණ ක්‍රියාවලියක් ආරම්භ කෙරෙනු ඇත.

**2.2 ආයෝජන**

ආයෝජනවලට පාරිතෝෂික අරමුදලේ ස්ථාවර තැන්පතුව ඇතුළත් වේ.

**2.3 වෙනත් මූල්‍ය වත්කම්**

ආයතනික පැළ තවාන් සඳහා යොදා ගන්නා ලද අමුද්‍රව්‍ය සඳහා දරන ලද වියදම/ පිරිවැය ප්‍රයෝජනවත් ආයු කාලයක් යටතේ වර්ග කර ඇති අතර එම කාලය සඳහා අදාළ පිරිවැය අපගමනය වූ පිරිවැය ලෙස ඉදිරියට ගෙන එන ලදී. 2017.12.31 දිනට ශේෂය රු. මි. 13.17 කි.

2.4 **වෙනත් ජංගම වත්කම්**

2017.12.31 දිනට රු.මි7.933 ක් වන පිරියත තොගය වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා ඇත. පිරියත තොගය 2017 දෙසැම්බර් 31 දක්වා නිෂ්පාදනයේ සමුච්චිත පිරිවැය මත තක්සේරු කෙරේ.

2.5 **තොග හා බඩු වට්ටෝරු**

පලමු ලැබීම් පලමු පිටවීම් (FIFO) පදනම භාවිතා කරමින්, අවම පිරිවැයට හෝ ශුද්ධ බේරාගැනීමේ අගයට තොග සහ ඉන්වෙන්ටරි අගය කොට ඇත

2.6 **වෙළෙඳ ණයකරුවන් හා ලැබීම්**

වෙළෙඳ හා අනෙකුත් ලැබීම් ඒවායේ පොත් අගය අනුව දක්වා ඇති අතර අඩමාන ලැබීම් බොල් ණය ප්‍රතිපාදන තුළට ඇතුළත් කර ඇත.

2.7 **අනෙකුත් ලැබීම්**

වෙළෙඳ ණයකරුවන් නොවන අනෙකුත් ලැබීම් ඒවායේ ප්‍රමාණවලින් දක්වා ඇත.

2.8 **මුදල් සහ මුදල් හා සමාන දෑ**

මුදල් සහ මුදල් හා සමාන දෑවලට අතැති මුදල්, බැංකු හා ඉල්ලුම් තැන්පතු අයත් වේ.
2017.12.31 දිනට මූල්‍ය ශේෂය රු. මිලියන 69,225කි.
මුදල් වර්ෂය අවසානය වන විට භාණ්ඩාගාරය මගින් රු. මිලියන 17ක් මෙන්ම රු. මිලියන 336.24ක ප්‍රාග්ධන ප්‍රතිපාදනයක් ද ලැබී නොමැත. එබැවින්, ශේෂ පත්‍රයෙහි ගෙවීම් වල කැපී පෙනෙන අඩුවක් / වෙනසක් පෙනේ. අරමුදල් නොමැතිකමින් උපචිත වියදම සහ ණය හිමියන් වෙත ගෙවිය යුතු වන ණය ඉහල ගොස් ඇත.
වර්ෂය තුලදී, ජල ගැල්ම දිරි දීමනා ලෙස රු. මිලියන 417.58ක මුදලක් ලැබී තිබූ අතර කුඩා තේ වතු හිමියන් සඳහා රු. මිලියන 225.61ක මුදලක් ගෙවා ඇති අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත රු. මිලියන 100ක මුදලක් ප්‍රේෂණය කොට ඇත. ශේෂය තාවකාලිකව දින සතක දැනුම් දීමකින් නැවත ලබාගත හැකි වන පරිදි තැන්පතු වල ආයෝජනය කොට ඇත.
පාංශු සංරක්ෂණ දිරි දීමනා සඳහා ලද අරමුදල් වලින් රු. මිලියන 32ක මුදලක් දින සතක දැනුම් දීමකින් නැවත ලබාගත හැකි තැන්පතු වල ආයෝජනය කරන ලදී.
දිවිනැගුම ව්‍යාපෘතිය යටතේ , 2017.12.31 දින වන විට නෙළුම් කුඩා සහ නෙළුම් කොටස් සඳහා එකතු කරන ලද දීමනා වල රු. මිලියන 3.2ක ප්‍රමාණයක් අන්තර්ගත වේ.

**2.9. මුදල් ප්‍රවාහ**

වක්‍ර ක්‍රමය භාවිතා කරගෙන මුදල් ගැලීම් ප්‍රකාශය සකසා ඇත.

2.10 **ලැබුණු අරමුදල් සඳහා ගිණුම්කරණය**

2007 වසරේ සිට ඒකාබද්ධ අරමුදල හරහා භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රේෂණය කර ඇත

## (3) වගකීම්

ශේෂ පත්‍ර දිනයට සියලු ද්‍රව්‍යාත්මක වගකීම් ගිණුම් වල අන්තර්ගත කර ඇති අතර ඉල්ලා සිටින ලද අවස්ථාවන් හි දී ගෙවීම් සිදු කිරීම සඳහා වන ශේෂ පත්‍රයෙහි දක්වා ඇත්තේ ජංගම වගකීම් ලෙස වගකීම් වර්ගීකරණය කරමිනි.
හඳුනාගත් පරිදි, 2017 වර්ෂය සඳහා අවිනිශ්චිත වගකීම් සඳහා රු. 1,558,480ක මුදලක් සම්පාදනය කොට ඇත.

3.1 **<u>පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන</u>**

2015 වසර තුළ පාරිතෝෂික ප්‍රතිපාදන පිළිබඳ ප්‍රතිපත්තිය වෙනස් කරන ලදී. ඒ යටතේ එක් වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සෑම සේවකයෙකුට ම පාරිතෝෂිකය ගෙවනු ලැබේ.
කෙසේවතුදු, මෙම ප්‍රතිපාදන සඳහා රු.මි. 12.59 ක් ස්ථාවර තැන්පතුවක් පමණක් පවත්වාගෙන යනු ලැබේ. අරමුදල් ප්‍රමාණත් නොවීම හේතුවෙන් තැන්පතු වැඩි කිරීමට හැකියාවක් නොමැත.

3.2 **<u>බදු අය කිරීම</u>**

ඒකාබද්ධ අරමුදල මගින් අරමුදල් සැපයෙන ආයතනයක් වන බැවින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

3.3 **<u>අසම්භාව්‍ය බැරකම්</u>**

පහත පුද්ගලයන්ට එරෙහිව කම්කරු උසාවි හා අධිකරණ නඩුවලට අදාළව ආසන්න වශයෙන් රුමි. 6.25 ක අසම්භාව්‍ය බැරකම් පවතියි.

| **අධිකරණ නඩුව** | **බැරකම් (රු.මි.)** |
|---|---|
| එස්.ආර්. ගුණවර්ධන මහතා | 1.363 |
| ඒ.එස්.එමිත රොඩ්‍රිගෝ මහතා | 1.588 |
| ටී.ඒ. මුහන්දිරන් මහතා | 0.472 |
| මුල්ලේගම මහතා | 0.600 |
| එන්.ජේග පතිරණ මහතා | 0.909 |
| බී.එච්.සී.ඒ. බටගොඩ මහතා | 0.500 |
| ඩබ්.බී.එස්. සූරසිංහ | 0.818 |

2017 වර්ෂයේ දී අධිකරණ නඩු සඳහා වන මුදලින් රු. 1,363,693 ක මුදලක් එස්. ආර්. ගුණවර්ධන මහතා ගේ අධිකරණ නඩුව වෙනුවෙන් කඩුවෙල අධිකරණයෙහි තැන්පත් කරන ලදී. එන්. ජේ. පතිරණ මහතා ගේ දුක් ගැනවිල්ලට කන් දෙමින් රු.909880ක මුදලක් ගෙවීමට පාර්ලිමේන්තු මහජන පෙත්සම් කාරක සභාව විසින් උපදෙස් දෙන ලදී.

(4) **ප්‍රාග්ධන ප්‍රදාන**

(4) 1981 සිට 2014 දක්වා IRDP, SHTDP, TDP හා වෙනත් ව්‍යාපෘති සඳහා ලැබුණු අරමුදල් හා භාණ්ඩාගාර ප්‍රදාන ක්‍රමක්ෂය කර ඇත.ඒ අනුව රු. මිලියන 13.44 ක් විලම්භිත ආදායම් ලෙස ගිණුම්කරණය කර ඇති අතර ඉතිරිය ඉදිරි වර්ෂ අනුව ක්‍රමක්ෂය කරමින් ඉදිරියට රැගෙන ඇත.

(5) වලහන්දූව ඉඩම. මෙය ඉඩම් ප්‍රතිපාදන කොමිසමට අයත් වන අතර තවමත් හිමිකාරීත්වය

(6) නැවත වගාකිරීම යනාදිය පිළිබද ජාතික අවශ්‍යතාවයන්ට අනුකූල වන ලෙස වසරේ ක්‍රියාකාරී සැලැස්ම සකසා ඇත.

(7) මෙම වසර තුල කුඩා තේ වතු හිමියන් සඳහා වන සංවර්ධන වැඩසටහන් භාරගෙන ඇති අතර කුඩා තේ වතු හිමියන් සඳහා රු. මිලියන 912.35ක මුදලක් ගෙවා ඇත. පොහොර වැඩසටහන සඳහා වන මෙහෙයුම් වියදම පුනරාවර්තන වියදමින් දරා ඇත

(8) 2017 වර්ෂයේ ඉදිරියට ගෙන ආ අතිරික්ත පොහොර ප්‍රාග්ධනය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි සංවර්ධන ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙත මාරු කර ඇත.

(9) රු. මිලියන 417.58ක මුදලක් ගං වතුර දිරි දීමනා ලෙස 2017දී ලැබිණ. රු. මිලියන 224ක මුදලක් ගාල්ල, මාතර, කළුතර සහ රත්නපුර දිස්ත්‍රික්කයන් හි අවශ්‍ය පුද්ගලයන් වෙත බෙදා දෙන ලද අතර ඉතිරිය වන රු. මිලියන 100ක මුදල වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කරන ලදී.

(10) අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් තේ ශක්ති සුභසාධන අංශය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත මාරු කරන ලදී. රක්ෂණාවරණය අමාත්‍යාංශය වෙත ලද අතර තේ ශක්ති සාමාජිකයන් වෙත රු. මිලියන 6.7ක මුදලක් ගෙවන ලදී.

# කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

## 2017 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | **2017** | **2016** |
|---|---|---|
| සාමාන්‍ය කටයුතුවල අතිරික්තතා/ (ඌණතා) | (129,533) | 3,323 |
| **මුදල් නොවන සංචලන** | | |
| විලම්භිත ආදායම් | (13,440) | (10,413) |
| ක්ෂය වීම | 22,102 | 24,233 |
| පාරිතෝෂික සැපයීම | 8,331 | 13,716 |
| අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වැඩි කිරීම/අඩුකිරීම් | (1,222) | 716 |
| කපා හැරි ණයකරුවන් | (1,364) | |
| අවිනිශ්චිත අවස්ථා සඳහා ප්‍රතිපාදන | 2,352 | 600 |
| පොළී ආදායම | (8,494) | (2,306) |
| ගෙවීම්වල වැඩිවීම්/අඩුවීම් | 218,117 | 35,108 |
| ප්‍රත්‍යාගණන අලාභ | | |
| සේවක පිරිවැය සම්බන්ධ ප්‍රතිපාදන වැඩි කිරීම | | |
| දේපළ, අංගන හා පිරියත විකුණුමෙන් ලද (ලාභ)/ අලාභ | 32 | (66) |
| අනෙක් වත්කම්වල වැඩිවීම/අඩුවීම | 108 | (3,566) |
| ලැබීම්වල වැඩිවීම/අඩුවීම | (19,307) | 21,376 |
| ඉන්වෙන්ට්‍රි අයිතමයන්ගේ වැඩිවීම/අඩුවීම | (42,380) | (2,547) |
| **මෙහෙයුම් කටයුතුවල ශුද්ධ මුදල් ප්‍රවාහ** | 35,301 | 80,234 |
| **ආයෝජන කටයුතුවල මුදල් ප්‍රවාහ** | | |
| අංගන හා පිරියත මිලදී ගැනීම | (46,141) | (63,784) |
| අංගන හා පිරියත විකුණුමෙන් ලැබූ මුදල් | 33 | 50 |
| **ආයෝජන කටයුතුවල ශුද්ධ මුදල් ප්‍රවාහ** | (46,108) | (63,734) |
| ලැබූ පොළී | 6,642 | 1,865 |
| ගෙවූ පාරිතෝෂික | (17,469) | (12,530) |
| **මූල්‍ය කටයුතුවල මුදල් ප්‍රවාහ** | (10,828) | (10,665) |
| සංවර්ධන වියදම් නඳහා රජයේ ප්‍රදාන | (84,934) | 53,783 |
| **ප්‍රාග්ධන ප්‍රදාන** | 4,459 | 12,780 |
| **රජය ප්‍රදාන** | 21,006 | 58,600 |
| **මූල්‍ය කටයුතුවල ශුද්ධ මුදල් ගැලීම** | (59,469) | 125,163 |
| **මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | (81,103) | 130,998 |
| **කාල වකවානුව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | 315,421 | 184,423 |
| **කාල වකවානුව අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | 234,318 | 315,421 |

## කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**ශුද්ධ වත්කම් / මූලධනයෙහි වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය**

**2017 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය**

රු.

| විස්තරය | දායක ප්‍රාග්ධනය | පාලනය කරන අස්ථිත්වයේ හිමිකරුවන්ගේ අයිතිය | | | මුළු ශුද්ධ වත්කම්/හිමිකම |
|---|---|---|---|---|---|
| | | අනෙක් සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | සමුච්චිත අතිරික්ත (ඌණතා) | |
| 31/12/2016 දිනට ශේෂය | 178,225 | 64,469 | 124,109 | (40,267) | 326,535 |
| වසර සඳහා අතිරික්තතා/ (ඌණතා) | | | | (129,533) | (129,533) |
| දේපළ ප්‍රත්‍යාගණනයෙන් ලත් ලාභය | | | | | - |
| වසර තුළ රජයේ ප්‍රදාන | 21,007 | | | | 21,007 |
| සංවර්ධන වියදම් නඳහා රජයේ ප්‍රදාන | (84,934) | | | | (84,934) |
| වසර තුළ වෙනත් ප්‍රදාන | | | | | - |
| වසරේ විලම්භිත ආදායම | (8,981) | (4,458) | | | (13,440) |
| | | | | | - |
| | | | | | - |
| 31/12/2016 දිනට ශේෂය | 105,317 | 60,011 | 124,109 | (169,800) | 119,636 |

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

**2017 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය**

සටහන 01

**දේපළ, අංගන හා පිරියත 2017**

රු.

| විස්තරය | 2017.01.01 දිනට පිරිවැය | වසර සඳහා එකතු කිරීම් | මාරු කිරීම/ අපහරණය | 2017.01.01 දිනට පිරිවැය |
|---|---|---|---|---|
| ඉඩම් | 74,364,245.39 | - | - | 74,364,245.39 |
| ගොඩනැගිලි | 212,976,247.30 | 30,915,285.34 | - | 243,891,532.64 |
| මෝටර් රථ | 69,705,153.61 | 1,325,572.61 | 402,750.00 | 71,433,476.22 |
| ව්‍යාපෘති මෝටර් රථ | 13,945,935.00 | 4,004,750.00 | - | 17,950,685.00 |
| ගෘහ භාණ්ඩ සවි කිරීම් හා කාර්යාල උපකරණ | 31,070,963.14 | 4,364,240.20 | (364,942.59) | 35,070,260.75 |
| පරිගණක | 25,409,248.36 | 1,839,265.50 | (504,572.00) | 26,743,941.86 |
| අංගන හා පිරියත | 597,729.00 | 3,691,730.00 | - | 4,289,459.00 |
| | | | | |
| එකතුව | 428,069,521.80 | 46,140,843.65 | (466,764.59) | 473,743,600.86 |

**ක්ෂය වීම**

රු.

| විස්තරය | 201701.01 දිනට ක්ෂය වීම | වසරේ ක්ෂය වීම | මාරු කිරීම/ අපහරණය | සමුච්චිත ක්ෂය වීම | ලියා හල වටිනාකම |
|---|---|---|---|---|---|
| ඉඩම් | 166,631.62 | 10,293.34 | - | 176,924.96 | 74,187,320.43 |
| ගොඩනැගිලි | 38,749,346.40 | 4,344,393.57 | - | 43,093,739.97 | |
| මෝටර් රථ | 51,995,104.36 | 10,542,904.61 | 3,002.00 | 62,541,008.97 | 8,892,467.25 |
| ව්‍යාපෘති මෝටර් රථ | 12,282,443.00 | 950,562.00 | - | 13,233,005.00 | 4,717,680.00 |
| ගෘහ භාණ්ඩ සවි කිරීම් හා කාර්යාල උපකරණ | 15,471,991.83 | 2,829,954.48 | (316,830.74) | 17,985,115.57 | 17,085,145.18 |
| පරිගණක | 16,183,316.62 | 3,354,683.98 | (504,305.33) | 19,033,695.27 | 7,710,246.59 |
| අංගන හා පිරියත | 456,154.04 | 69,240.13 | - | 525,394.17 | 3,764,064.83 |
| **එකතුව** | **135,304,987.87** | **22,102,032.11** | **(818,134.07)** | **156,588,883.91** | **317,154,716.95** |

-

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**

**මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්**

**2017 දෙසැම්බර් 31 වන දිනට අවසන් වූ වර්ෂය**

**සටහන්**

| විස්තරය | රු. |
|---|---|
| **සටහන 02** | |
| **ආයෝජන -** | 12,590,855.67 |
| ස්ථාවර තැන්පතු - පාරිතෝෂිතය | 12,590,855.67 |
| | |
| **සටහන 02 A** | |
| වෙනත් මූල්‍ය වත්කම් | |
| අපගමනය වූ පිරිවැය | 13,165,776.94 |
| | 13,165,776.94 |
| | |
| වෙනත් ජංගම වත්කම් | |
| පැළ තොග | 7,932,725.11 |
| | |
| **සටහන 03** | |
| | |
| ඉන්වෙන්ට්‍රි | |
| ලිපි ද්‍රව්‍ය | 2,716,451.42 |
| විවිධ තොග | 26,389,463.36 |
| තේ | 460,234.48 |
| පොහොර | 3,750.00 |
| බාසම්ඩ්/ මෙතුම් සෝඩියම් | 135,180.47 |
| පොලිතීන් | 740,306.69 |
| ඉසින යන්ත්‍ර | 5,029.55 |
| තවාන් උපකරණ | 1,071,317.64 |
| ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති තොග | 26,107,733.13 |
| තරාදි | 41,675.00 |
| දළු කඩන අල්ලුව/ බාස්කට් | 247,692.20 |
| ආධාර පැකේජ | 512,881.09 |
| ටයර හා ටියුබ් | 331,947.21 |
| පුහුණු සඳහා යොදා ගැනෙන උපකරණ | 3,982.50 |
| වෙනත් තොග | 63,538.30 |
| | 58,831,183.04 |
| **සටහන 04 05** | |
| **ලැබීම්** | |
| | |
| ණයකරුවන් | 20,706,081.45 |
| ණය හා අත්තිකාරම් | 108,442,579.82 |
| තැන්පතු හා අත්තිකාරම් | 678,710.84 |
| වෙනත් ශේෂ | 12,391,797.31 |
| | |
| එකතුව | 142,219,169.42 |
| අඩු කළා: බොල් ණය ප්‍රතිපාදන | (21,557,633.49) |
| | |
| එකතුව | 120,661,535.93 |

| විස්තර | Rs. |
|---|---|
| **සටහන 06** | |
| පෙර ගෙවීම් | 340,062.01 |
| | |
| **සටහන 07** | |
| මුදල් හා බැංකු ශේෂ | 6,456,189.85 |
| මාර්ගස්ථ මුදල් | 69,225,308.50 |
| අතැති මුදල් හා බැංකුවෙහි ඇති මුදල් තැන්පතු | 158,636,863.56 |
| | |
| එකතුව | 234,318,361.91 |
| | |
| **සටහන 08** | |
| ගෙවීම් | |
| ණයකරුවන් | 67,773,350.97 |
| තැන්පතු ගෙවීම් | 3,990,875.10 |
| වෙනත් ප්‍රතිපාදන | 4,280,819.82 |
| වෙනත් ශේෂ | 158,634,679.66 |
| | |
| එකතුව | 234,679,725.55 |
| | |
| **සටහන 9** | |
| උපචිත වියදම් | |
| වාර්ෂික වාරිකාව | 190,000.00 |
| වෘත්තිය සමිති | 7,254.00 |
| සේ. අ. අ. හා සේ. නි. හා.අ | 6,168,428.99 |
| විදුලිය | 211,169.12 |
| පරිගණක නඩත්තුව | 203,890.00 |
| සම්මන්ත්‍රණ සහ සමුළු | 150.00 |
| වරිපනම් හා බදු | 53,766.37 |
| ඉන්ධන | 858,970.12 |
| නිවාඩු දින ගෙවීම් | 6,336.23 |
| වෛද්‍ය පහසුකම් | 644,610.81 |
| යතුරු පැදි නඩත්තුව | 269,350.00 |
| පුවත්පත් | 17,160.00 |
| ප්‍රභසාදනය | |
| කාර්යාල උපකරණ නඩත්තුව | 65,172.22 |
| අතිකාල | 384,884.99 |
| තැපැල් ගාස්තු | 20,956.00 |
| කුළිය | 519,445.50 |
| වැටුප්/ වේතන | 1,255,175.45 |
| ආරක්ෂාව | 427,885.53 |
| උපයන විට බදු | 21,112.56 |
| පුවත්පත් දැන්වීම් | 477,595.00 |
| ගොඩනැගිලි පිරිසිදු කිරීම/ නඩත්තුව | 242,046.03 |
| නොමිලේ ලබා දෙන තේ කෝප්පය | 1,178.00 |
| දුරකථන | 464,985.21 |
| T.S.H.S.F. | |
| ප්‍රවාහන ගාස්තු | 61,500.00 |
| ගමනාගමන හා උපවේශන | 1,311,649.73 |
| නීති කටයුතු | 975,430.46 |
| මණ්ඩල සාමාංජික පරිපාලන ගාස්තු | 77,233.60 |
| නිළ ඇඳුම් හා සපත්තු | 39,005.00 |

| විස්තර | Rs. |
| --- | --- |
| ලිපි ද්‍රව්‍ය | 95,550.71 |
| පුස්තකාලය | 47,000.00 |
| ජලය | 39,419.29 |
| වාහන නඩත්තුව | 1,068,144.00 |
| මුද්දර ගාස්තු | 86,175.00 |
| නැවත පැළ සිටුවීම සඳහා වන සහනාධාර | 182,142,897.76 |
| අළුත් පැළ සිටුවීම සඳහා වන සහනාධාර | 35,123,391.85 |
| භෝග ප්‍රතිස්ථාපනය | 6,627,073.00 |
| පොහොර සහනාධාර | 5,095,883.50 |
| බැංකු ගාස්තු | 5,612,064.00 |
| ඩොලමයිට් සහනාධාර | 771,870.00 |
| මෙහෙයුම් බදු | 580,000.00 |
| ඩොලමයිට් සහනාධාර | 117,010.00 |
| විවිධ | 464,049.88 |
| පැල තවාන් හා මව් ශාක | 326,018.10 |
| වෙනත් | 402906.64 |
| | 253,575,794.65 |
| **සටහන 10** | |
| සේවක ප්‍රතිලාභ (පාරිතෝෂිතය) | 157,103,352.56 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. පීඑල්ඒ/බී/ටීඑස්එච්ඩීඒ/01/2017/එෆ්ඒ/08 | මබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2018 අගෝස්තු 28 දින |

සභාපති,

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

**කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පනතේ 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2018 මැයි 31 දින නිකුත් කරන ලදී.

**1.2** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටි, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.41,661,551 ක්වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

අධිකාරිය විසින් ප්‍රතිලේඛන ණය යටතේ තේ ශක්ති අරමුදලට ලබා දී තිබූ වාහනයක, ණය නොගෙවීම හේතුවෙන් ණය මුදල අයකර ගැනීම සඳහා අධිකාරිය විසින් එම වාහනය විකුණා තිබුණු අතර ඉන් ලැබුණු රු.672,000 ක ලාභය තේ ශක්ති අරමුදලට ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි.

2.2.3 පැහැදිලි නොකෙළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු ශේෂ 07 ක එකතු වටිනාකම රු. 89,112,762ක් වුවද ඊට අදාලව ඉදිරිපත් කරන ලද තහවුරු කිරීමේ ලිපි අනුව එම වටිනාකම රු. 89,849,404ක් වීමෙන් රු. 736,642 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට වසර 5 ඉක්මවූ ලැබිය යුතු ගිණුම්වල වටිනාකම රු.21,071,890 ක් වූ අතර එම ශේෂය අයකිරීමට කටයුතු නොකර ගිණුම්වල අඛණ්ඩව පෙන්නුම් කර තිබුණි. එම ශේෂයෙන් එකතුව රු.17,016,838 ක ශේෂ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(අ) කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා පොහොර, පොහොර ඉසින යන්ත්‍ර සහ තරාදි මිලදී ගැනීම සඳහා ලබා දී තිබූ මුදලින් රු.4,436,965 ක් අය විය යුතුව තිබූ අතර මෙය වර්ෂ 12 ඉක්මවා තිබුණි.

(ආ) 1998 වර්ෂයේ දී කුඩා තේ වතු සමිති සඳහා ණය පදනම මත වාහන ලබාදීම වෙනුවෙන් අධිකාරිය වෙත සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,663,284 ක් අයවිය යුතුව පැවති අතර එම ශේෂය අයකිරීමට කටයුතු කර නොතිබුණි. තවද එම වර්ෂයේදීම වර්ණ විභේදන යන්ත්‍ර ලබා ගැනීම සඳහා කම්හල් 4කට ලබාදී තිබූ මුදලින් රු.5,916,589 ක් අයවිය යුතුව තිබූ අතර විධිමත් ගිවිසුම් නොතිබීම හේතුවෙන් ණය අයකර ගැනීම ගැටළු සහගත වී තිබුණි.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.129,532,198 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,322,996 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.132,855,194 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වියදම් රු.81,224,000 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2015 වර්ෂයේ දී පැවති ඌනතාවය 2016 වර්ෂයේදී අතිරික්තයක් බවට පත් වුවද සමාලෝචිත වර්ෂයේදී නැවතත් ඌනතාවයක් වී තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා රජයට ගෙවූ බදු නැවත ගැලපීමේදී අධිකාරියේ දායකත්වය 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා හිතකර අගයක් ගෙන තිබූ අතර 2014 වර්ෂයේ රු.420,947,000 ක්වූ දායකත්වය 2017 වර්ෂයේදී රු.127,723,000 ක් දක්වා ක්‍රමිකව පිරිහී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව අධිකාරියෙහි ජංගම අනුපාතය 2017 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් 0.86:1 හා 1.65:1 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය පිරිහී තිබුණි.

### 3.3 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

අධිකාරියේ සේවකයන් විසින් අධිකාරියට එරෙහිව නඩු 06 ක් ද අධිකාරිය විසින් සේවකයන්ට එරෙහිව නඩු 02ක් ද ගොනුකර තිබු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම නඩු කටයුතු අවසන් වී නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

අධිකාරිය ස්ථාපිත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී හෙක්ටයාර් 1040 ක් වූ තේ නැවත වගා ඉලක්කයෙන් හෙක්ටයාර 748 ක් පමණක් ලඟා කරගෙන තිබුණි. 2015 වර්ෂයේ සිට තේ නැවත වගා සහනාධාර ලබා ගැනීමට අධිකාරිය නිකුත් කළ අවසර පත් ප්‍රමාණය වාර්ෂිකව වැඩි වී තිබුණද තේ වගාකරුවන් විසින් බිම් සැකසීම හා පාංශු සංරක්ෂණයෙන් පසුව තේ නැවත වගාව සඳහා යොමු වීම පහලගොස් තිබුණි. සහනාධාරලාභීන් ඒ සඳහා යොමුකර වීමට අධිකාරිය ප්‍රමාණවත් ක්‍රියාමාර්ග නොගැනීම මේ සඳහා ප්‍රධාන ලෙස හේතුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී භෝග පුනරුත්ථාපනය සඳහා සහනාධාර ලෙස රු.11,701,644 ක් කුඩා තේ වතු හිමියන්ට ගෙවා ඇති අතර පෙර වර්ෂයට සාපේක්ෂව එය සියයට 40 ක වැඩිවීමකි. එසේ වුවද එම සහනාධාර මුදලින් සමාලෝචිත වර්ෂය සඳහා පැල 912,500 ක් භෝග පුනරුත්ථාපනය සඳහා ඉලක්ක කළද, එයින් පුනරුත්ථාපනය කර ඇති පැල ප්‍රමාණය 564,145 ක් විය. ඒ අනුව කාර්යසාධනය සියයට 62 ක් පමණක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී ගොවීන් වෙත ඩොලමයිට් මෙට්‍රික් ටොන් 1035ක් ලබාදීමට ඉලක්ක කළද මෙට්‍රික් ටොන් 25.3ක් පමණක් සපයා දී තිබුණු අතර එය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 2.4 ක් විය. මේ අනුව සාර්ථක වගාවක් සඳහා ඩොලමයිට් භාවිතය ඉතා වැදගත් වුවද ඩොලමයිට් භාවිතය පිළිබඳ කුඩා තේ වතු හිමියන්ගේ නැඹුරුතාවය වැඩි කිරීම සඳහා අධිකාරිය විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) ව්‍යාප්ති හා උපදේශන සේවා වැඩසටහන් සහ පාංශු කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.16,561,557 ක් වැය කර තිබුණු අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව එය රු.9,766,842කින් එනම් සියයට 143 ක වැඩි වීමකි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ප්‍රගති වාර්තා අනුව පවත්වා තිබූ පුහුණු වැඩසටහන් ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 4කින් පහළ ගොස් තිබුණි.

(ඉ) කුඩා තේ වතු හිමියන්ගේ තේ නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා එම තේ වතු හිමියන් වෙත පොහොර සහනාධාර බෙදා හැරීම වෙනුවෙන් අධිකාරිය වෙත රු.914,568,156 ක් ලැබී තිබුණද සමාලෝචිත වර්ෂයේදී තේ ගොවීන් වෙත නිකුත් කළ මුදල රු.902,019,098 ක් විය. ඉතිරි මුදල වූ රු.7,407,098 ක් ලබාදීමකින් තොරව ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාලවල රඳවා ගෙන තිබුණි. පොහොර සඳහා මූල්‍ය සහනාධාර ලබා දීමේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2016 ජුනි 03 දිනැති අංක MPI/DEV.01/08/ FERTILIZER/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව අධිකාරිය විසින් කටයුතු කළයුතු වුවද ඊට පටහැනි වූ අවස්ථා පහත පරිදි වේ.

(i) චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව පොහොර සහනාධාරය ලබා දීම සඳහා තිබිය යුතු අවම බිම් ප්‍රමාණය පර්චස් 20 ක් හා උපරිමය හෙක්ටයාර 01 ට අඩු විය යුතු වුවද ඊට පටහැනිව ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය මගින් රු.100,696 ක් ගෙවීම් කර තිබුණි.

(ii) චක්‍රලේඛයේ 7 වන ඡේදය ප්‍රකාරව සහනාධාර ලබා ගැනීම සඳහා ගොවීන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්වල සඳහන් තොරතුරුවල නිරවද්‍යතාවය සනාථ කර ගැනීමෙන් පසු ගෙවීම් කළ යුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් රු.21,183,489 ක්වූ ගෙවීම් සඳහා නිකුත් කරන ලද චෙක්පත් අහරු වී තිබුණි.

(iii) චක්‍රලේඛයේ 9 ඡේදය ප්‍රකාරව සහනධාර සඳහා සුදුසුකම් ලත් වගාකරුවන්ගේ විස්තර ඇතුලත් ලැයිස්තුවක් අධිකාරියේ වෙබ් අඩවියේ පල කර නොතිබුණි.

(ඊ) කුඩා තේ වතු හිමියන් විසින් තේ පැල මිලදී ගැනීමේදී ගුණාත්මක තේ පැල මිලදී ගැනීමට හා වෙළඳපොල මිලගණන් පාලනය කිරීම සඳහා අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ආයතනික තේ තවාන් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(i) තවාන් කළමනාකරණ උපදෙස් මාලාවේ අංක 4.2 ප්‍රකාරව තවාන්තුල තේ පැල මිය යාමේ ප්‍රතිශතය සියයට 10 ක අඩු මට්ටමක පවත්වා ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට හැඩිගල්ල, වලහන්දුව සහ මාවරල යන තවාන් 3 හි පැල මියයාමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 25.7, සියයට 31.4 හා සියයට 35.6 ක් විය.

(ii) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ත) ගේ 2005 සැප්තැම්බර් 22 දිනැති අංක ව්‍යා/4/1 දරන උපදෙස් ලිපිය අනුව අධිකාරියේ තවාන්හි යොදන ලද පැලවලින් අවම අලෙවිය සියයට 85 ක්ව පැවතිය යුතු වුවද 2016/2017 වර්ෂය අවසානයේදී අධිකාරිය මඟින් පවත්වාගෙන යනු ලැබූ තවාන් 8 න් 5ක් එම අලෙවි ප්‍රතිශතය ලඟාකරගැනීමට අපොහොසත් වී තිබුණු අතර එම තවාන් වල අලෙවිය සියයට 48, සියයට 49, සියයට 64, සියයට 74 හා සියයට 77ක් විය.

(iii) සේවා සැපයීමේ පරමාර්ථයෙන් තවාන් පවත්වාගෙන යනු ලැබුවද අවම වශයෙන් නිෂ්පාදනය සඳහා දැරූ වියදම හෝ ආවරණය කර ගත යුතු බව තේ තවාන් කළමනාකරණ උපදෙස් මාලාවේ අවධාරණය කර තිබුණි. එසේ වුවද හැඩිගල්ල, වලහන්දුව හා මාවරල යන තේ තවාන් 03 හි ආදායම ඉක්මවා රු.1,045,513 ක වියදම් දරා තිබුණි.

(උ) තේ නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩිකිරීම සඳහා කුඩා තේ වතු හිමියන්ට ගුණාත්මක පැල ලබාගැනීමේ අරමුණින් අධිකාරිය මගින් අධිකාරියේ ලියාපදිංචි බාහිර පාර්ශවයන්ගේ වාණිජ තේ තවාන් පවත්වාගෙන්යාම හා අධීක්ෂණය කරනු ලබයි. වාණිජ තේ තවාන් සඳහා නිකුත් කළ අවසර පත්‍ර සංඛ්‍යාව 2015, 2016 හා 2017 වර්ෂයන්හි පිළිවෙලින් 701 ක්, 487 ක් හා 449 ක් ලෙස අඩු වෙමින් පැවතුණි. ඒ අනුව වාණිජ තේ තවාන් සඳහා අධිකාරියේ නිසි අධීක්ෂණය යොමු වී නොමැති බව නිරීක්ෂණය විය.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුඩා තේ වතු හිමියන් වෙත වගා සහනාධාර නිකුත් කළ දින සිට වර්ෂ 03 ක කාලයක් තුළ පැල සිටුවා අවසන් කළ යුතු අතර එසේ පැල සිටුවා අවසන් කිරීමට අපොහොසත් වූ අවස්ථා නිරීක්ෂණය විය. එහිදී වගා සහනාධාර ලෙස ගෙවා ඇති මුදල් ආපසු අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කළයුතු වුවත් පළමු, දෙවන හා තුන්වන වාරික සඳහා මුදල් ලබා ගෙන වගාව අතර මගදී අත්හැර දමා තිබු හෝ වගා වාර්තා එවා නොතිබූ කුඩා තේ වතු හිමියන් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.8,494,376ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම සඳහා ගෙවියයුතු බදු හඳුනාගෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීම දින 30 ක් තුලදී සිදුකල යුතු වුවද 2017 ජුලි 17 දින දී විශ්‍රාම ගිය නිලධාරියෙක් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම ප්‍රමාදවීම නිසා ඒ වෙනුවෙන් අධිකාරිය විසින් රු.74,602 ක අධිභාරයක් ගෙවා තිබුණි.

(ඈ) අධිකාරියේ ගාල්ල ප්‍රාදේශීය කාර්යාලට අයත් වලහන්දුව උපකාර්යාලය, පැල්තවාන හා අක්මීමන මව් වගා ව්‍යාප්ති මධ්‍යස්ථානය පිහිටි ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයට අයත් යතුරු පැදි 2ක් අධිකාරිය විසින් භාවිතා කළද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එහි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින අධිකාරිය සතු නිල නිවාස 04ක් වසර 05ක කාලයක සිට භාවිතයට ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණු. අතර මෙම නිවාස අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් / දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

ප්‍රාදේශීය කාර්යාල 04 ක රු.23,280,986 ක් වටිනා ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ඉඩම්වල රු.58,220,553 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණි.

4.5 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් ආයතනයේ සම්පත්

අධිකාරියට අයත් වාහන 3ක් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත මුදාහැර තිබු අතර සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් රු.250,150ක් වියදම් දරා තිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව 2017 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 459 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 480 ක් විය. තවද තනතුරු 08 ක් දරන්නාට පමණක් පෞද්ගලික වනසේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරු(සංවර්ධන) හා කළමනාකරු(පුහුණු) තනතුරු 2014 වර්ෂයේ සිට ද තොරතුරු තාක්ෂණ නිලධාරි, තාක්ෂණ නිලධාරි යන තනතුරු මාස 6 ක පමණ කාලයක සිටද පුරප්පාඩු ව පැවතුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී අනියම්, චෙක්රෝල් හා කොන්ත්‍රාත් පදනම මත අධිකාරිය විසින් කළමනාකරණ සහකාර (MA 1-2), රියදුරු, කාර්යාල ආරක්ෂක සහායක යන තනතුරු සඳහා සේවකයන් 51 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ වැටුප් ලෙස රු.7,900,689 ක් ගෙවා තිබුණි.

(ඈ) අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුව ඵලදායී ව්‍යාප්ති සේවාවක් සඳහා ව්‍යාප්ති නිලධාරියෙකුට වගාකරුවන් සංඛ්‍යාව 1:1000ක් විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එම අගය 1:2751 ක් ව පැවතුණි. ඒ අනුව ව්‍යාප්ති නිලධාරියෙක් සඳහා වගාකරුවන් විශාල ප්‍රමාණයක් අධීක්ෂණය කිරීමට සිදුවීම ඵලදායී ව්‍යාප්ත සේවාවකට බාධාවක් වී තිබුණි.

(ඈ) කළමනාකරු (සංවර්ධන) තනතුර හා කළමනාකරු (මානව සම්පත්) තනතුර සඳහා වැඩබැලීම් පත්කිරීමේදී ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13:1:2 වගන්තිය හා 13:4 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය යටතේ නව ශ්‍රේණි ක්‍රමයකට අන්තර්ග්‍රහණය කිරීමේදී සහකාර ව්‍යාපෘති කළමනාකරු, කණිෂ්ඨ කළමනාකරණ සේවා ගණයේ JM(1-1) (11) එකොළොස් වන වැටුප් පියවරේ පිහිටු විය යුතු අතර උපයාගෙන ඇති වැටුප් වර්ධක ලබාදිය යුත්තේ උසස්වීම් නොලැබූ තීරය යටතේ වැටුප් පියවරයන් භාවිතා කරමින් බව දක්වා තිබුණද, මෙම නිලධාරියා වෙත වැටුප් ගෙවීමේ දී ඒ අනුව කටයුතු නොකිරීම නිසා වැඩිපුර වැටුප් ලබා දී තිබුණි.

## 5. තිරසර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසර ඉලක්ක කරා ළඟා වීම සඳහා ආයතන විසින් හඳුනාගත් කාර්යයන් වාර්ෂික සැලැස්මට ඇතුළත් කර නොතිබූ අතර එම කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදනයන් වාර්ෂිකව අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්ක ගත අරමුණු කරා ළඟාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය ඉතා මන්දගාමී තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 ඡේදය පරිදි මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2018 මාර්තු 23 දිනදීය.

### 6.2 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------------------

#### 6.2.1 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) මාර්ගෝපදේශය අනුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තු ගත කර තිබිය යුතු වුවද එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 4.2.1 (ඉ) මාර්ගෝපදේශය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට සමාලෝචිත වර්ෂයේදී ඉටු කරන ලද එකතුව රු.5,948,591 ක් වටිනා කොන්ත්‍රාත් 6ක් හා රු.590,700 ක් වටිනා ලීබඩු හා උපකරණ මිලදී ගැනීම් ඇතුලත් කර නොතිබු අතර

ප්‍රසම්පාදන සැලැස්මෙහි දක්වා තිබූ රු.මිලියන 14.8 ක් වටිනා ඉදිකිරීම් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන අත්පොතෙහි 2.14.1 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණ අනුව කොන්ත්‍රාත්තුව පිරිනමනු ලැබීමට පෙර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙතින් අනුමැතිය ලබා ගත යුතු වුවත් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වර්ෂ 5ක් වෙනුවෙන් රු.12,000,000ක වාහනයක් මිලදී ගැනීමේ දී එසේ සිදු කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 මාර්ගෝපදේශය ප්‍රකාරව 2.14.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩ සඳහා අදාළ ප්‍රසම්පාදන අරමුණු ඉටුකර ගැනීමේ අරමුණින් පිරිවිතර සැකසිය යුතු වුවත් රු.609,348 ක්වූ කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීමෙන් පසුව පිරිවිතර සකස් කර තිබුණි.

(ඉ) 2017 වර්ෂයේදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගොවීන් වෙත බෙදා හැරීම සඳහා රු.100,390,089 ක කෘෂි උපකරණ මිලදී ගැනීමට අදාලව පහත නිරීක්ෂණ කෙරේ.

(i) කෘෂි උපකරණ මිලදී ගැනීම සම්බන්ධයෙන් පත්කර තිබුණු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 2.7.4 මාර්ගෝපදේශය අනුව අදාල විෂය සම්බන්ධ දැනුමක් ඇති පුද්ගලයෙකු පත්කර නොතිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 මාර්ගෝපදේශය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක අදාල විෂය පිළිබඳ විශේෂඥයෙකු හා ප්‍රසම්පාදන කාර්යය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ඇති එක් සාමාජිකයකු හෝ සිටිය යුතු අතර එසේ නොමැති අවස්ථාවන් හිදී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් බාහිර සාමාජිකයෙකුගේ හෝ ආයතන වලින් විශේෂඥ උපදෙස් ලබා ගත යුතු වුවත් අධිකාරිය යොමු ගත මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 මාර්ගෝපදේශය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණ, භාණ්ඩ සඳහා ඇනවුම් ලබාදීමට පූර්වයෙන් ලබාගැනීමට කටයුතු කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) මිලදිගෙන තිබූ ලීටර 5000 වතුර ටැංකි 20 ම බෙදාහැරීමෙන් තොරව 2018 මාර්තු 13 දින වන විටත් ප්‍රාදේශිය කාර්යාලයට අයත් මධ්‍යස්ථානයන්හි ගබඩා කර තිබුණි.

(iv) අධිකාරියේ සංඛ්‍යා දත්ත අනුව 2017 වර්ෂය වන විට නුවරඑළිය දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව 16,875 ක් වන නමුත් මිලදී ගෙනතිබූ භාණ්ඩ ඒකක සංඛ්‍යාව 38,970 ක් වන අතර සමාලෝචිත වර්ෂය අවසන් දින වනවිට නොබෙදා ඉතිරිව ගබඩාවෙහි පවතින ඒකක සංඛ්‍යාව 13,467 ක් විය. ඒ අනුව අවශ්‍යතාව හඳුනාගෙන මිලදීගතයුතු ඒකක ප්‍රමාණය තීරණය කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඊ) 2016 මාර්තු 17 දිනැති අංක 01/2016 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථ ලබාගත හැක්කේ අළුත්ම වාහන හෝ කුලියට ලබාදෙන අවස්ථාවේදී ධාවන දුර ප්‍රමාණය කිලෝමීටර් 1000 අඩු ලියාපදිංචි නොකරන ලද එකක් වියයුතු වුවද , අධිකාරිය විසින් මෙම ක්‍රමය යටතේ මාසයකට රු.200,000 බැගින් මාස 60 ක් සඳහා ලබා ගන්නා ලද මෝටර් රථය පුද්ගලයෙකුගේ නමින් ලියාපදිංචි කර තිබූ වාහනයක් විය.

(උ) සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන කාර්යාලය සහ හන්තාන පුහුණු මධ්‍යස්ථානය සඳහා දිවා රාත්‍රී ආරක්ෂක සේවාව සැපයීම සඳහා ද සියළු ප්‍රාදේශීය කාර්යාලයන්හි රාත්‍රී ආරක්ෂක සේවාව සැපයීම සඳහා ද රු.4,458,663කට පුද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගත වී ඒ වෙනුවෙන් රු.5,011,149 ක් ගෙවා තිබුණි. එසේ වුවද මාතර ප්‍රාදේශීය කාර්යාලයේ රු.329,819ක් වෙනත් පුද්ගලික ආරක්ෂක ආයතනයනයකටද, කළුතර හා ඌව ප්‍රාදේශීය කාර්යාලයන්හි ආරක්ෂක සේවාව සැපයීම වෙනුවෙන් රු.796,874ක් අධිකාරියේ සේවකයන්ටද ගෙවීම් කර තිබුණි.

### 6.2.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------

ඉකුත් වර්ෂයේ රු.4,366,397 ක වියදම් දරා ප්‍රධාන කාර්යාල භූමියේ උද්‍යාන අලංකරණය කිරීම් සිදුකර තිබූ අතර ගල් ඇතිරීමේදී පස් ස්ථරය ප්‍රමාණවත් ලෙස මට්ටම් කර නිසි ප්‍රමිතියට සකස් කර නොතිබීම හේතුවෙන් ගල් පහත්වීමක් සිදුවී තිබුණි. කෙසේ වුවද අදාල බිම් කොටසේ නැවත ගල් ඇතිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රඳවා ගත් මුදලින් එම මුදල ආවරණය කර ගැනීමට කටයුතු නොකර රු.164,500 ක් මුල් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

## 6.3 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැයගත හා තථ්‍ය ආදායම් අතර සියයට 67 සිට සියයට 86 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියේ අයවැය අනුව භෝග පුනරුත්ථාපන සහනාධාර සඳහා වෙන්කර තිබූ රු. මිලියන 18.04 ක මුදලින් රු. මිලියන 0.75 ක් ලබා ගැනීමට යෝජනාකර අනුමැතිය ලැබී තිබුණද එය සංශෝධිත අයවැය තුල ඇතුළත් වී නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | තනතුරුවල පුරප්පාඩු පැවතීම, විධිමත් අනුමැතිය සහිතව බඳවා ගැනීම් සිදු නොකිරීම. |
| (ආ) | සහනාධාර ගෙවීම් | සහනාධාර ලබා දීමෙන් අනතුරුව පසු විපරම කටයුතු සිදු නොකිරීම. |
| (ඇ) | වත්කම් පාලනය | විධිමත් ලෙස වත්කම් පවරා නොගැනීම හා වත්කම්වල ඵලදායී ජීවකාලය සමාලෝචනය නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති